ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණීම සිංහල පුවත්පත



විශ්වාසයේ ජීවිතය ගිහි ඇසින් බලා කැරෙන විමර්ශනයකි

**ගිහි අපෝස්තලික සේවාව උතුම් දේව කැඳවීමක්...**

3 පිටුව



**කැඳවීමේ ගමන තුළ මඟපෙන්වීම දේව අරමුණ පෝෂණය කරයි**

ලෝක දේව කැඳවීම් යැදුම් දිනය නිමිත්තෙන් සුදොතුම් පියතුමන්ගේ පණිවුඩය

8 පිටුව



"කුඩා කිතුනු සංඝ ගොඩනඟමින් එතුමන් හට සේවය කරන්න" මෙවර එහි තේමාවයි.

**ජාතික කුඩා කිතුනු සංඝ ඉරුදින**

12 පිටුව



**2010 වසරේ හොඳම ආගමික පුවත්පත**


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07




**"අපේ හදවත් දැවී ඇවිළී ගියා නොවේ ද?"**

**උත්ථාන සමයේ තෙවැනි ඉරුදින**

ක්‍රි.ව. 2012 ක් වූ අප්‍රේල් 22 ඉරිදා 146 වෙළුම 45 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 20.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# දේව කැඳවීම් පිළිබඳ විශාල තරුණ උනන්දුවක්!

## 49 වන ලෝක දේව කැඳවීම් යැදුම් දිනය අරබයා සිරිලක පදවි තුළ විශේෂ වැඩසටහන් මාලාවක්

**දේව කැඳවීම් උදෙසා යදින අන්තර් ජාතික දිනය හෙවත් දේව කැඳවීම් ඉරුදින උත්ථාන සමයේ සිවුවන ඉරිදා එනම් යහපත් එඬේරා ඉරුදිනට යෙදී ඇති අතර මේ වසරේ එය අප්‍රේල් 29 ඉරිදා; එනම් ලබන ඉරිදා සැමරේ.**

මෙ නිමිත්තෙන් දේව කැඳවීම් පිළිබඳව දරුවන් හා තරුණ පරපුර අතර උනන්දුවක් හා අවබෝධයක් ඇති කරනු වස් ලංකාව පුරා විවිධ වැඩසටහන් දියත් කිරීමට පියවර ගෙන ඇතැයි ඥානාර්ථ ප්‍රදීපයට වාර්තා වේ. දෙව්සත්හල් පූජක හා පැවිදි කටයුතු පිළිබඳ ජාතික කතෝලික කොමිසම මඟින් මෙ පිළිබඳව සියලු මීසම් සේවක පියවරුන් වෙත දැනුම් දී ඇති අතර අදාළ දින ජනවන්දනා පිළිවෙත් සඳහා පත්‍රිකා, දහම් පාසල් පාඩම් හා වෙනත් දැනුවත් කිරීමේ පත්‍රිකා ද යවා තිබේ.



කොළඹ අගරදගුරු වසමේ ප්‍රධාන සැමරුම අප්‍රේල් 29 ඉරිදා පෙ.ව. 9.15 ට සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර කනිටු දෙව්සත්හල් සිසුන්, පාසල් සිසු සිසුවියන්, දෙමාපියන් හා දේව කැඳවීම් අධ්‍යක්ෂවරුන් ඊට සහභාගි වන බව අගරදගුරු පදවි දේව කැඳවීම් අධ්‍යක්ෂ ගරු ජේ. ඩී. ඇන්තනි ජයකොඩි පියතුමා ප්‍රදීපයට පැවසීය.

(දේව කැඳවීම් දිනය නිමිත්තෙන් නිකුත් කළ ශුද්ධෝත්තම පිය පණිවුඩය සඳහා මැද පිටුව බලන්න.)

## ජාතික ගිහි ඉරුදින මැයි 06 දා

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව මඟින් උත්ථාන සමයේ 5 වැනි ඉරුදින ජාතික ගිහි ඉරුදින ලෙස යොදා ඇති අතර මේ වසරේ මැයි 06 ඉරිදාට එය යෙදී ඇත. ඕර්ඩෝ පොතේ ඉංග්‍රීසි මුද්‍රණයේ මෙය නිවැරැදිව සඳහන්ව ඇතත් සිංහල ඕර්ඩෝ පොතේ එය උත්ථාන සමයේ තෙවන ඉරුදින ලෙස සඳහන්ව ඇත. ජාතික ගිහි ඉරුදින පැවැත්වෙන්නේ උත්ථාන සමයේ 5 ඉරුදින; එනම් මේ වසරේ මැයි 06 ඉරිදා බැවි ජාතික ගිහි කොමිසමේ අධ්‍යක්ෂ ගරු ලියෝ පෙරේරා පියතුමා දැනුම් දෙයි.

## "තාරකයාණෝ" එන ඉරිදා කඩොල්කැලේ දී

ලොව ප්‍රථම වරට බැලේ සම්ප්‍රදාය ගුරු කොට ගනිමින් ශිල්පීන් 250 ක අපූර්ව සහභාගිත්වයෙන් වේදිකා තුනක ප්‍රතිනිර්මාණය වන "තාරකයාණෝ" දුක්ප්‍රාප්තියේ නර්තන කාව්‍යය අප්‍රේල් 29 ඉරිදා ප.ව. 6.30 ට මීගමුව කඩොල්කැලේ ක්‍රීඩාංගනයේ දී කළ එළි දකී. කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන තාරකයාණෝ ඉදිරිපත් කිරීම උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමන් ඇතුළු සංවිධායක කමිටුවෙනි.

(✍ මෙරිල් මීපුර)

## දෙවැනි ශු. ලියැවිලි කෙටි පාඨමාලාව

ශුද්ධ ලියැවිලි වසර වෙනුවෙන් කොළඹ හා. ජුසේවාස් දේව ධර්ම නිකේතනය මෙහෙයවන දෙවැනි කෙටි පාඨමාලාව "ශු. ලියැවිල්ල හා මෙසියානු දේවධාර්මික චින්තනය" යන මැයෙන් අප්‍රේල් මස 17 දා සිට ජූලි 24 වැනිදා දක්වා අඟහරුවාදා දිනවල ප.ව. 4.30 සිට 6.15 දක්වා පැවැත්වේ. ගිහි පැවිදි සැමට මෙම බයිබලීය පාඨමාලාවට සහභාගි විය හැකිය.

## ජාතික කුඩා කිතුනු සංඝ ඉරුදින අදයි

ජාතික කුඩා සංඝ ඉරුදින අප්‍රේල් 22 ඉරිදා (අද) සමරන අතර මෙවර ඔක්තෝබර් මස පැවැත්වෙන අසිපා මහ සමුළුව මුල්කොට එහි තේමා සකස් වී ඇත.

# සෑම අතුරුදන් කිරීමක්ම මිනිස් උත්තරීතරත්වය කෙලෙසීමකි

### අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ හා අතිපූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර අනුනායක ස්වාමීන් වහන්සේගේ අත්සනින් නිකුත් කළ විශේෂ පුවත්පත් නිවේදනයයි

ශ්‍රී ලංකාව තුළ 1970 දශකයේ සිට විවිධ රජයන් හා දේශපාලන පක්ෂ මෙන්ම අන්තවාදී ආයුධ හරඹවල යෙදුනු කණ්ඩායම් ද තමන්ගේ මතිමතාන්තර වලට එකඟ නොවන පුද්ගලයින් පැහැරගෙන යෑම හෝ අතුරුදන් කරවීම මෙන්ම ඔවුන්ගේ මළ සිරුරු තැන තැන ප්‍රසිද්ධ ලෙස ප්‍රදර්ශනය කිරීම ද සිදුකළ බව අමුතුවෙන් කිවයුතු දෙයක් නොවේ. මෙය 80 හා 90 දශකවල වඩා භයානක ලෙස සිදුවූ දෙයකි. එලෙසම ප්‍රතිවාදී දේශපාලන පක්ෂවල හෝ පාතාල කණ්ඩායම් වල නායකයින් අතුරුදන් කරවීම හෝ ඝාතනය කිරීම ද විවිධ අවස්ථා වලදී සිදුවිය. මේ අතරට ද්‍රවිඩ හා සිංහල ත්‍රස්තවාදී කණ්ඩායම් විසින් සිදුකරන ලද ඝාතන ද ඇතුළත් වේ. එවැනි අතුරුදන් කිරීම් හෝ ඝාතනයන් සම්බන්ධව පොදුවේ පරීක්ෂණ පවත්වා නැති බව ද සත්‍යයකි.

මෙසේ ඝාතනය වූ අය අතර ද්‍රවිඩ සිංහල දේශපාලන නායකයෝ ද සිටිති. මේ අපරාධ වලට නීත්‍යානුකූලව දඬුවම් දීම සිදු වී ඇත්තේ ද අල්ප වශයෙනි.

සමාජයට අහිතකර පාතාලයේ පුද්ගලයින් ඉවත් කිරීම ද ඇතැම් විට ඒ ඒ කණ්ඩායම් අතර ඇති තරගකාරීත්වය හා වෛරය නිසා සිදුවන පැහැර ගැනීම් හා අතුරුදන් කිරීම් ගැන ද අපට අසන්නට ලැබේ. ප්‍රතිවිරුද්ධ අදහස් දරණ දේශපාලන නායකයින් වෙත ද මේ තර්ජනය එල්ල වී ඇත.

ප්‍රතිවිරුද්ධ දේශපාලන අදහස් දැරූ පමණින් කෙනෙකු අතුරුදන් කිරීම ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධය. එලෙසම සෑම අතුරුදන් කිරීමක්ම මිනිස් උත්තරීතරත්වය කෙළෙසීමකි. එය සෑම ආගමික චින්තනයකටම විරුද්ධ වේ. රටේ පොදු නීතියට විරුද්ධව යමෙකු කටයුතු කර ඇත්නම් ඔහුට හෝ ඇයට පොලිසිය හෝ උසාවිය මාර්ගයෙන් දඬුවම් ලබා දීමට සැලැස්වීම විනා වෙනත් විකල්ප සාධාරණීයකරණය කිරීම වරදකි. එහෙත් අද එවැනි දෑ සාධාරණ වන බවට සිතන්නෝ ද වෙති. මෙය භයානක තත්ත්වයකි.

මෙවැනි පැහැර ගැනීම් හෝ අතුරුදන් කිරීම් අප රටේ ආගමික සභ්‍යත්වයට කිසිසේත් නොගැලපේ. 70 දශකයේ සිට මෙවැනි භීෂණ සහගත පරිසරයක් නිර්මාණය කර අද දක්වා ඉදිරියට යන්නට ඉඩ දී එය හොඳ දෙයක් යයි සිතන්නට ඇතැමුන් පෙලඹී ඇත. එහෙත් මිනිස් සමාජය තුළ නීතිය හා සාමය රැකීම සාධාරණ න්‍යාය ධර්මයන්ට අනුව සිදුවිය යුතු දෙයකි. එයට පරිබාහිරව කටයුතු කිරීම මනුෂ්‍යත්වයට නුසුදුසු වේ. එය මානව ගරුත්වයට පටහැනිය.

මෙවැනි චින්තනයක් පිළිගැනීමට අපට කිසිසේත් ඉඩ නැත. එබැවින් මෙවැනි පැහැර ගැනීම් හා අතුරුදන් කරවීම් තවදුරටත් මෙරට තුළ සිදු නොවන්නට වගකිව යුත්තන් ද පොදු ජන සමාජය ද වගබලා ගනිත්වායි ප්‍රකාශ කර සිටිමු.

**✠ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි**
කොළඹ අගරදගුරු

**✳ අති පූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර**
අනුනායක ස්වාමීන් වහන්සේ

# චන්ද්‍රකීර්ති කුලරත්න දිවියට සමුදෙයි

**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**



වර්තමාන සමාජයට අර්ථවත් දේ ලියූ, කියූ, නව නිර්මාණ කළ ප්‍රතිභාපූර්ණ නාට්‍ය අධ්‍යක්ෂවරයකු මෙන්ම නිෂ්පාදකයකු ද "කිතු දන පුබුදුවේ" මූලිකයකු ද වූ චන්ද්‍ර කීර්ති කුලරත්න සොයුරා ඉකුත් දා දිවියට සමුදුන්නේ ය.

කොළඹ කොටහේන ග්‍රාමය නිජබිම කරගෙන, ජෝශප් කුලරත්න සහ එස්. ඒ. ඥානවතී දෙමාපියන්ට දාව උපන් කීර්ති රට, දැය, සමයට මහඟු සේවාවක් කළ කුසලතා වර්ධනය කරගෙන, පරිණත බවට පත්ව සිටි සැබෑ කතෝලිකයෙකි; කලාකරුවෙකි; සුහදශීලි මිත්‍රයෙකි. "ඥානාර්ථ ප්‍රදීපය" ලේඛකයෙකි; ගීතිකා රචකයෙකි; සංස්කාරක වරයෙකි.

කිතුනු - බොදුනු සුහදතාවය ඇති කරමින් කිතුදන පුබුදුවේ අධ්‍යක්ෂ ගරු සිරි ඔස්කා අබේරත්න පියතුමන් සමඟ ඉතාම

15 පිටුවට ▶

# "මීගොමුව" ප්‍රාදේශීය පුවත්පත කාදිනල් හිමිපාණන්ට පිළිගන්වයි



"සියලුම මාවත් මීගොමුවට" යන තේමාව යටතේ ප්‍රකාශයට පත්කර ඇති "මීගොමුව" ප්‍රාදේශීය පුවත්පත, එම පුවත්පතේ ප්‍රධාන කර්තෘ ජූලියන් එමාඩ් ප්‍රනාන්දු මහතා විසින් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට පිළිගැන්වූ අයුරු.. සහය සංස්කාරක ජෝ. සංගපාලආරච්චි මහතා ද සේයාරුවේ පසෙක සිටී.

(සේයා - ගරු ජූඩ් සමන්ත පියතුමා)

**"දෙවියන් වහන්සේ ජීවනයේ ස්වාමියාණන් මරණින් උත්ථාන කළ සේක."**

පදවියෙන් පදවියට

# සුබ වදනට සාක්ෂි දරන්න හැම සම්පතක්ම ඉවහල් කරගනිමු

## කුරුණෑගල රදගුරු හිමි



ගුරුගල්ල මීසමේ සුසාන භූමිය තුළ පාස්කු ඉරිදා අභිනවයෙන් අඩි 6 අඟල් 8 පමණ වන උත්ථාන වූ කිතු සමිඳුන්ගේ ප්‍රතිමාවක් ස්ථාපිත කැරිණ. එයට සමගාමීව මහා පාස්කු භෝජනයක්ද පිළියෙල කර තිබුණි. මීසමේ වැඩිහිටි දෙමාපියෝ රංගනයේ හා නර්තනයේ යෙදුනාහ. සියළු දෙනාගේ පරිත්‍යාගයෙන් හා ශ්‍රම දායකත්වයෙන් සකස් කරගනු ලැබූ හවුල් බත එක පවුලක් ලෙස ආහාරයට ගැනිණ.

ප්‍රියංග ඩයස්

"දේව මැවිල්ල හා එහි ඇති සැම දේමත් හැකියාවන්, දීමනාවන්, සම්පත් හා තලෙන්තු කිතු සමිඳුණන් ඉවහල් කරගත්තේ දේව වචනය ජනතාව අතරට ගෙනයන්නයි. අපිදු අපේ සියලු හැකියාවන්, දීමනාවන්, තලෙන්තු සහ සම්පත් යොද ගත යුත්තේ සුබ වදනට සාක්ෂි දැරීමට යැ"යි කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ ප්‍රකාශ කළහ.

කුරුණෑගල රදගුරු පදවිය අරඹා 25 වසරක් සපිරීමත් දිවයිනේ ප්‍රවීනතම රංගධරයින් 25 දෙනෙක් නොමිලේ සිය රංගන දායකත්වය තුළින් ප්‍රථමවරට වේදිකා ගතකරනු ලැබූ 'කුරුසාලෝකය' පාස්කු දැක්මේ පාස්කු ඉරුදින පැවැති සමාප්ති උත්සවයේ ආරම්භක අනුශාසනාවේදී උන්වහන්සේ එසේ ප්‍රකාශ කළහ. කුරුණෑගල රදගුරු පදවියේ තඹකන්ද කල්වාරි පුදබිමේ දී ආලේලුයියා සෙනසුරාදා සහ පාස්කු ඉරුදින දෙදිනේ කුරුසාලෝක පාස්කු දැක්ම රඟදැක්විණි.

සිසිල් ඩැනීසියස්

## සුබාසිංසන



රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් පෙරේරා හිමිපාණන්ගේ නාමසාන්තුවර මංගල්‍යය අප්‍රේල් 26 දාට යෙදේ එතුමනට ප්‍රදීප සුබාසිරි සමඟ දේවාසිරි පතා යදිමු.

## දේවධර්ම නිකේතන වාර්ෂික ධර්ම විවේකය

කොළඹ භාග්‍යවත් ජුසේවාස් දේවධර්ම නිකේතනයේ වාර්ෂික චතාරික එක්දින ධර්ම විවේකය බොරැල්ල සා. ඇලෝසියස් දෙව්සත්හලේදි පැවැත්විණි.

එහිදි ගරු ගිහාන් ගුණතිලක පියතුමා මුලික හැඳින්වීම කළ අතර දේව ධර්ම නිකේතනයේ අදියුරු ගරු දයා ෂෙල්ටන් පියතුමාගේ මඟපෙන්වීම පරිදි එලිමහන් පාදනමස්කාරය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වන්දනාව හා දිව්‍ය පූජාව පැවැත්විණ.

අසික ප්‍රියදර්ශන

# හිඟුරාණේ පාස්කුව සාර්ථකයි

පාස්කුව යනු එතෙර වීමයි. පාස්කු පණිවුඩයෙන් ගෙනහැර දක්වන උත්තරීතර ගමනට අප ආවඩන්නේ මහ බ්‍රහස්පතින්දා දින පවත්වන තේජස්බරිත දේව සිද්ධිය තුළ සිටයි. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රි භෝජන සංග්‍රහ තුළින් අපට ලබාදෙන පණිවුඩය දිව්‍යසත්ප්‍රසාද වහන්සේ තුළ ජීවිත ගමන යා යුතු පිළිවෙතැයි. එය හරිහැටි තේරුම් ගෙන දිව්‍ය සත්ප්‍රසාදයට නිසි ගෞරවය දැක්වීම අප ඉටුකළ යුතුයැයි අම්පාර මීසම් සහයක දේශනාවාදි ගරු සුමේධ දිසානායක පියතුමා ප්‍රකාශ කළේය.

උන්වහන්සේ එසේ ප්‍රකාශ කළේ හිඟුරාණ සා. අන්තෝනි දෙව් මැඳුරේ මහ බ්‍රහස්පතින්දා පැවැත්වූ මෙහෙයේදීය.

උත්ථානවූ ජේසු තුමන්ගේ ප්‍රතිමාවක් බෝලවත්තේ ජෝ බෙනඩික් වාස් මහත්මා වෙත හිඟුරාණේ ඩබ්. ජේ. පීටර් සිල්වා මහතා හා එම මැතිණිය සිහිකරනු පිණිස කැතරින් පෙරේරා මහත්මිය හා දූ දරුවන් පරිත්‍යාග කර තිබිණ. එම ප්‍රතිමාව රාත්තල් 600-700 තරම් බර සිමෙන්තියෙන් සාදන ලද්දකි. පාස්කු ඉරුදින ගරු සුමේධ දිසානායක පියතුමා අතින් එය විවෘත විය.

මහසිකුරාදා මෙහෙය අම්පාර මීසම් සේවක ගරු ටී. ක්‍රිස්ටි ප්‍රනාන්දු පියතුමාගේ මූලිකත්වයෙන් සිදුකැරිණ. හිඟුරාණ මීසමේ කතෝලික පවුල් 45 ත්, නයිනමඩම, බෝලවත්ත, මාදම්පේ, වෙන්නප්පුව, හලාවත හා ජාඇල ප්‍රදේශවලින් සැදැහැවතුන් බොහෝ පිරිසක් සහභාගි වූහ.

මැක්ෂිමස් රෝයි පෙරේරා

# නවදන්කුලම දෙව්මැඳුරට ඔබේ ආධාර ඕනෑ!



මංගලඑලිය මීසමට අයත් නවදන්කුලම සා. සෙබස්තියන් දෙව් මැඳුර 75 වසරකට වඩා පැරණි ඉතා අබලන් තත්ත්වයකට පත්ව ඇති නිසා, නව දෙව් මැඳුරක් ගොඩනැගීමට මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා සැලසුම් කර මූලික වැඩ ආරම්භ කර ඇත. කිතුනු පවුල් 80 කටත් වඩා අඩු සංඛ්‍යාවක් වෙසෙන මෙම ග්‍රාමයේ ජනතාව ඉතා දිළිඳු හා දුෂ්කර ජීවිත ගතකරන්නෝ වෙති. බෞද්ධ ජනතාවක් මැද ජීවත්වන මෙම කිතුනු ජනතාවගේ නව දෙව් මැඳුරේ වැඩ කටයුතු සම්පූර්ණ කරගැනීමට මීසම් සේවක පියතුමා ලක්වැසි කිතුනු ජනතාවගේ පරිත්‍යාගශීලි සහයෝගය කාරුණිකව අපේක්ෂා කරයි. ඔබගේ සියළු ආධාර සා. සෙබස්තියන් දේවස්ථාන ගොඩනැගිලි අරමුදල ගිණුම් අංකය - 9955290, ලංකා බැංකුව මදුරන්කුලිය වෙත යොමුකරන්න. වැඩි විස්තර - 071-8431525 (මීසම් සේවක පියතුමා)

එච්. ජේ. සිරිල් පෙරේරා

# හලාවත පදවි දහම් කතිකාවත සඳහා එක්දින පුහුණු වැඩමුළුවක්

2012 අගෝස්තු මස 20-22 යන දිනවල පැවැත්වීමට යෝජිත හලාවත පදවි දහම් කතිකාවේදී සාකච්ඡා කිරීම සඳහා විවිධ අංශවලින් ජනතාවගේ තොරතුරු ලබාගැනීමට කටයුතු යොදා ඇත. එම කාර්යභාරය සඳහා හලාවත පදවියේ සැම දෙව්මැඳුරකම කොට්ඨාස මට්ටමින්, අදහස් විමසීමට මෙහෙයවීමට හා තොරතුරු වර්තා කිරීමට නායකත්වය දියහැකි සම්පත්දායකයන් තෝරාගෙන ඇත. බෝලවත්ත දිසාවේ තෝරාගත් සම්පත් දායකයන් සඳහා එක් දින පුහුණු වැඩමුළුවක් නයිනමඩම වික්ෂෝප දේව මාතා දෙව්මැඳුරේදී පසුගියදා පවත්වන ලදි. මෙම වැඩමුළුව මෙහෙයවන ලද්දේ හලාවත පදවි දහම් කතිකාවත පිළිබඳ මහා ලේකම් ගරු දොන් විමල් සිරි ජයසූරිය පියතුමන් විසිනි. එදින සහභාගි වූ සම්පත්දායකයන්ට ගරු පියතුමා කරුණු දැක්වූ අයුරු.



ටෙක්ලා කල්දේරා

# උෘව පදවියේ සිරිහද චතාරික ධර්ම විවේකය

අන් අයගේ පිටස්තර වැටීම අපට පෙනුනත් අපගේ ඇතුලාන්ත වැටීම කිසිවකු දකින්නේ නැත. මෙම චතාරිකයේදී ජීවිත වෙනසක් අත්දකින්න. පුද්ගලයන්ගේ වැරදි තේරුම්ගෙන සමාව දී ජීවත්වන්නේ නම් ලොව මීට වඩා ලස්සන වේවි යැයි බණ්ඩාරවෙල, "සිදුපිය නිල දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු රොෂාන් සිල්වා නි.ම.නි පියනම පැවසීය.

බණ්ඩාරවෙල, දියතලාව, බදුල්ල ශ්‍රී හෘද සාමාජිකාවන් සඳහා චතාරික ඥානකාන්තිය එම දෙව්සත්හලේදී පැවැත්විණ. බණ්ඩාරවෙල ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු සහ දියතලාව ගරු සුජිත් කුරේ පියතුමන් සාමාජිකාවන් සමඟ පැමිණ සිටි අතර ගරු රොෂාන් සහ සුජිත් පියවරු දේව මෙහෙය පැවැත්වූහ.

ශ්‍රීකාන්ති ගුණවර්ධන

# හෙට්ටිපොල ධර්ම විවේකයක්

මෙවර චතාරිකයේදී හෙට්ටිපොල දේවස්ථාන කිතුනු සංසය මහත් උනන්දුවකින් සූදානම් වූහ. සැම කුඩා කිතුනු සංසයක දිනපතා ශ්‍රී කුරුස වන්දනාව, දේව වචනය මුල්කර ගනිමින් ශුද්ධවූ පැය පවත්වන ලදි. ඒ අතර මීසම් සේවක ගරු මොන්ටි පෙරේරා පියතුමාගේ අදහසකට අනුව ශුද්ධවූ සතියේදී දේව ජනතාව එක්දින ධර්ම විවේකයකට යොමුකරවන ලදි.

සමාවදීමේදී අවංකවම තමන්ට සමාව දිය නොහැකි අය සිහිකර ගනිමින් හදවතේ ගැඹුරුම තැනින් පැනනගින සමාව ඔවුන් වෙත දානය කරන බවට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේදී ධර්මවිවේකයට සහභාගි වූ සැමදෙන පොරොන්දු වූහ. අවසානයේදී සමඟිසන්ධානයේ සක්‍රමේන්තුවට ඇතුළුවී දිව්‍යසත්ප්‍රසාද ආශිර්වාදයෙන් පසු මෙහෙය අවසන් විය.

ඩබ්ලිව්. ජේ. ඇග්නස්



පේරලන්ද මීසමේ විවාහක යුවළ වෙනුවෙන් චතාරික පවුල් දිනයක් පේරලන්ද ශු. ජුසේ මුනිඳු දෙව්මැඳුරේ දී පැවැත්විණි. මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි පියතුමා සමඟ පේරලන්ද ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය සංවිධානය කළ මෙය ගරු ඇන්ටන් ජයනන්ද පියතුමා සහ අගරදගුරු පවුල් සේවාවේ නිහාල් හා ෂ්‍යාමලී යුවළ විසින් මෙහෙයවන ලදි.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි



බෝපිටිය මීසමේ මහා පාදනමස්කාරය ගොබි ඉරුදින නුගපේ මංසන්ධියේ සිට වැල්ලබඩ දේවස්ථානය දක්වා ගමන් කළ අතර මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමාගේ අනුශාසකත්වයෙන් දොන් බොස්කෝ තරුණ සමිතිය මඟින් සංවිධානය කළ මෙම පාදනමස්කාරය සඳහා මීසම්වාසී ජනතාව විශාල පිරිසක් එක්වූහ.

ඇන්ටන් ජයසූරිය

# චතාරිකයට තරුණ ධර්ම විවේකයක්

අප ජීවිත ගමනේදී අපට විවිධ තාඩන පීඩනණී විපත් වලට මුහුණ දීමට සිදුවන විට අපි දුර්වලයකු බවට පත් වෙනවා. එවිට අපි හීනමානයක් ඇතිකර ගන්නවා අපේ මුළු ජීවිතයම අඳුරක් යැයි කියා. නමුත් දෙවි පියාණන් අපට කියනවා "අඳුර ඔබට අඳුරක් නොවේ. අඳුරත් එළියත් ඔබට එක හා සමානයැයි කුඩාගම මීසම් සේවක ගරු ජීවන්ත පීරිස් පියතුමා හේවාදිවෙල ශු. ජපමාල රාජේශ්වරි දෙව්මැඳුරේ පැවති තරුණ ධර්ම විවේකයේදී පැවසීය.

මේ ධර්ම විවේකය සඳහා බුලත්කොහුපිටිය මීසම් සේවක ගරු සතිෂ් පියතුමාද, හේවාදිවෙල, කුඩාගම, රඹුක්කන, කෑගල්ල, මාහේන ඇතුළු අවිස්සාවේල්ල දිසා වේ තරුණ තරුණියෝ සහභාගි වූහ. මේ සඳහා බැතිබර දායකත්වය හේවාදිවෙල ශු. ජපමාල රාජේශ්වරී තරුණ සංගමය දරණ ලදී.

අහිංසා මධුමාල්



තිඹිරිගස්යාය සා. තෙරේසා මුනිවරියගේ දෙව්මැඳුරේදී සිසු සිසුවියන් 170 කට සුදතුම් වරම් දානය කිරීම කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් අතින් සිදුකැරිණි. තිඹිරිගස්යාය මීසම් සේවක ගරු රොහාන් පෙරේරා දි.ගැ.නි පියතුමාගේ මූලිකත්වයෙන් කටයුතු සංවිධානය කැරිණ.

ගරු පැට්‍රික් සොයුරු

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2012 අප්‍රේල් 22 ඉරිදා

# සමාජගත නොවූ ව්‍යුහයක් සඳහා ඡන්ද පැවැත්වීමක්?

නැවතත් පළාත් සභා ඡන්දයක් පිළිබඳව නැගෙන හඬ ක්‍රමිකව තීව්‍ර වෙමින් පවතින හැඩක් පෙනේ. ලබන වසරේ මුල් භාගයේ මෙම පළාත් සභා ඡන්දය බොහොදුරට පැවැත්විය හැකි බව මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ නිගමනයයි. ඉන්දීය යම් බලපෑමක් මත මීට අවුරුදු 25 කට පෙර ආරම්භ කළ මෙම ආයතන ක්‍රමය එහි රිදී ජුබිලිය සමරන මොහොතේ නැවතත් ඉන්දීය දූත පිරිසේ දැඩි බලපෑමක් මධ්‍යයේ කරලියට අලුත් ආරකින් පිවිසෙන විට තවමත් සමාජයේ එයට ඇති පිළිගැනීමේ දුබලතාව කිමදැයි යන්න විමසා සිටීම නම් වටී.

සෑම පළාත් සභා ඡන්දයක් ලංවන විට ඒ හා බැඳුනු දැඩි විවේචනයක්ද පවතින බව නොරහසකි. එය විටෙක විවේචන ස්වරූපයක්ද, විටෙක චෝදනා ස්වරූපයක්ද ගනු ලබන්නේ ඒ හා බැඳී පවතින අධික වියදම් රටාව හේතු කොටගෙන බව නම් පැහැදිලියි. කුඩා රාජ්‍යයක ස්වරූපයක් දරන ශ්‍රී ලංකාව වැනි රටකට විශාල පාර්ලිමේන්තුවක් හා නගර සභා, ප්‍රාදේශීය සභා රටාවලියක පරිපාලන ව්‍යුහයක් තිබියදී පළාත් සභා ආයතන පිහිටුවා තවත් අනවශ්‍ය විශාල මුදලක් වියදම් කරන්නේ මන්ද යන්න නම් හේතු සහිතව නැගෙන ප්‍රශ්නයක් බව කිව යුතුයි.

අනෙක් අතට කොළඹ කේන්ද්‍රීය මධ්‍යගත පාලනයක් පළාත් වෙත විමධ්‍යගත කෙරෙන විට, නොසලකා හැර ඇති බොහෝ ප්‍රධාන කරුණු අරබයා ඇතිවූ සංවාදයක් පුළුල්ව ජාතික තලය වෙත ගෙන ගොස් විමසා බලා සිටීම අතපසු කරවීම නිසා අවුරුදු 25 කට පසුවත් එකම ප්‍රශ්න රටාවලියම අස අසා නොලැබෙන පිළිතුරක් වෙනුවෙන් බලා සිටීමට සිවිල් සමාජයට සිදුව තිබේ. සංවර්ධන හා පරිපාලන වගකීම් විමධ්‍යගත කෙරෙන විට, ප්‍රතිපත්තිමය කාරණා වලට බෙහෙවින් සීමා වන ජාතික පාර්ලිමේන්තුවක් මේ සා විශාල නියෝජනයක් සමඟින් තිබිය යුතුද යන්න සලකා බැලීම කළ යුතුව තිබුණේ වසර 25 කට පසුව නොව එම ආයතන පිහිටුවා වසරක් හෝ දෙකක් ගතවූ විටයි. නමුත් සමාජගත ව්‍යුහයේ රැඳී පවත්නා අනෙක් කරුණ සේ දිස්වන මානසික උන්නතිකාමය හා බැඳී පවතින අධිපතිවාදී මාන්නය නිසා එම ප්‍රශ්නය උපන් තැනම ලොප් කරන්නට ගෙවුනු වසර 25 යෙදී තිබීමත් සැබවින්ම පසුතැවිල්ලට කාරණාවකි.

මධ්‍යගත පාලනයක් යටතේ පුරුදු කරවන ලද මානසිකත්වයක් මත විවිධ දේශපාලන පක්ෂ මෙම ආයතන රටාවලිය ප්‍රතික්ෂේප කළත්, වර්ජනය කළත් මැතිවරණ උණුසුම පිවිසෙත්ම එම රටාවට අනුගත වූ අයුරු ගෙවුනු 25 වසර පුරා දැකගන්නට ලැබුණු සුලබ දසුනකි. එය මානසිකව රඳා පවත්වා ගන්නට පුරුදු කළ ක්‍රමවේදයකට ජනතාව පුරුදු පුහුණු කරවීමේ දෘඩ මතවාදයක්ද සැඟවී පැවතීම මෙයට තවත් රුකුලක් වී ඇති බව පෙනේ.

උගත් පාඩම් හා සංහිඳියා කොමිසමේ නිර්දේශ අරබයාත්, 1987 පැවති ඉන්දු ලංකා සම්මුතියේ නිර්දේශ අරබයාත් පළාත් සභා වල හා බලය විමධ්‍යගත කිරීමේ වැදගත් කම කෙතරම් ඉස්මතු කළත් පෙර සඳහන් කළ මානසික හුරුව වෙනස් වන බවක් නම් නොපෙනේ. එයට බලපෑ විශේෂ කරුණු අතර මධ්‍යගත ආණ්ඩුවල පැවති අතීත හා වර්තමාන ක්‍රියා පිළිවෙත් බෙහෙවින්ම බලපා ඇති බව කාගේත් විශ්වාසයයි. බරපතළ ලෙස සමස්ත සමාජයම මධ්‍යම ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය ඔස්සේ දේශපාලනිකරණය කර තිබීමත් සමඟ, සිවිල් සමාජයට තවමත් හැම කාරණයක් වෙනුවෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ නිර්දේශ, ආධාර සොයා යෑමට සිදුවී තිබීම නිසා පරිපාලනය විමධ්‍යගත කෙරෙන මේ ව්‍යුහය අනවශ්‍ය ආයතනයක් ලෙස දකින්නට එම සමාජයේ සියළු ඒකක ඇබ්බැහි වී ඇති බව පැහැදිලියි.

ඉහත කී කාර්යයන් හා ප්‍රාදේශීය සංවර්ධනය ගැන තීන්දු ගැනීම. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඔවුන්ගේ අත රඳවා ගෙන ඇත්තේ ඔවුන් සතු විමධ්‍යගත අය වැය මුදල් ප්‍රමාණය මත පමණක්ම නොවන බවත් පැහැදිලියි. එයත් සමඟ පක්ෂ ව්‍යුහය හා පක්ෂයේ බලයත් තවමත් පාර්ලිමේන්තු ආසන සංවිධායක හා මන්ත්‍රී අත ඇති හෙයින් පළාත් ආයතන වල වැඩි වෙනසක් නොපෙනෙන තත්ත්වයක් පවතී. දේශපාලන පක්ෂ කොළඹ කේන්ද්‍රීය තීන්දු ගැනීමේ බල තන්ත්‍ර තවමත් ඉතා ශක්තිමත්ව පවත්වා ගන්නා අතර, ප්‍රාදේශීය තීන්දු ගැනීමේ වැඩි බලයක් ඇත්තේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට නොව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටය. ඒ හේතුවෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙනුවෙන් ප්‍රදේශයේ ඉන්න පුංචි දේශපාලනඥයාට පාර්ලිමේන්තු දේශපාලනඥයාගෙන් යැපෙන්නට සිදුව ඇත.

විමධ්‍යගත ස්වාධීන වූ ප්‍රාදේශිය මාධ්‍යයක් තවමත් ප්‍රබලව තහවුරු වී නොමැතිවීම තවත් දුබල කරුණක් සේ පෙන්වා දිය හැකියි. එයින් විහිදෙන මධ්‍යගත මානසිකත්වය තවමත් බිඳ ගන්නට නොහැකි වීම නිසා දකුණෙත්, උතුරෙත් ජාතික වැදගත්කම හුවා දක්වන පළාත් බඳ විමර්ශනයන්ට වඩා මධ්‍යගත කේන්ද්‍රයක නිරන්තර ලක්ෂණ ඔස්සේ ජන මතය හැසිරවීමට සිංහල හා දෙමළ මාධ්‍ය තවමත් කටයුතු කරන බවක් ද පෙනේ.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා (13 වන) සංශෝධන සහිතව ජනතාවට සමීප පළාත් ආයතන පිහිටුවීමට පැවති රජයන් අවංකව කටයුතු කළේනම් තත්ත්වය මීට වඩා වෙනස්වන්නට බොහෝ ඉඩ තිබිනි. නමුත් අවාසනාවකට පිහිටුවා තිබුණේත් මධ්‍යම ආණ්ඩුව සතු සියලු පිරිහිම් සහිත මධ්‍යම රජයේ සියලු ජරාජීර්ණ ලක්ෂණ අඩංගු පළාත් බද එවැනිම කුඩා ආකෘතීන් වීම නිසා සමස්තය වෙනස් කරන්නට එම ආයතන ව්‍යුහය අසමත් වී ඇත.

යුද්ධයකින් පසුව පවත්වන පළමු පළාත් ආයතන ඡන්දය දැන් අත ළඟ හෙයින් සපිරි රටක හෙට දවසේදී බලය විමධ්‍යගත වී ජනතා පරමාධිපත්‍ය සුරක්ෂිත වී විවෘත වාතාවරණයක් මේ හා සමඟ උදාවිය යුතුමයි. එය එසේ වුව හොත් පළාත් ආයතන ඡන්දය සමාජගත නොවූ ව්‍යුහයක් වෙනුවෙන් පවත්වන නිෂ්ඵල ඡන්දයක් නොවන බව කාගේත් දැඩි විශ්වාසය වනු නොඅනුමානයි.

# ගිහි අපෝස්තලික සේවාවද දේව කැඳවීමකි

දේව කැඳවීම කෙනෙකු ලබන විශේෂිත වරප්‍රසාදයකි. එය දෙවිඳුන්ගේ කැඳවීමකි. ඔවුන්වහන්සේගේ තෝරාගැනීමකි. ගිහියා යන්න සභාව නොවෙතත් සභාව තුළ ගිහියාට හිමිවන්නේද හිමිව ඇත්තේ ද විශේෂ තැනකි. ප්‍රසාද ස්නාපනයේදී අපි හැම කෙනෙකුම, දෙවිඳුන් වෙතින් මේ කැඳවීම ලබන්නෙමු. එහෙත් දෙවිඳු හඬ තේරුම් නොගැනීම තුළ අපි මෙම කැඳවීමෙන් බැහැරව සිටිමු. ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද ශුද්ධවූ සභාව පූජක, පැවිදි, ගිහි ත්‍රිත්වයෙන් සමන්විත වූවකි. සභාව තුළ, සභා වර්ධනයට, සභා සේවයට, සභා පැවැත්මට ගිහි දායකත්වය අත්‍යාවශ්‍යය. සංඛ්‍යාත්මකව බලන කල ශුද්ධවූ සභාව තුළ පූජක පැවිදි දායකත්වයට වඩා ගිහි දායකත්වය අති විශාලය. දේව රාජ්‍යයද ලොව පුරා පතළ වූවකි. “ලොව පුරා ගොස් සකල සත්වයා හට සුබ අස්න දේශනා කරන්න.” එදා ක්‍රිස්තුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට පවසා සිටියේ තම දහම සමස්ත මානව වර්ගයා වෙතම ගෙන යා යුතු බවයි. ඒ සඳහා උන්වහන්සේ ශ්‍රාවකයන් වශයෙන් 12 කුත්, තවත් සැත්තෑ දෙදෙනෙකුත් තෝරාගෙන සිටියහ.

ඔවුනතරෙන් වැඩි සංඛ්‍යාවක් වූයේද ගිහියන් වශයෙන් සමාජය තුළ කටයුතු කළ අයයි. ධීවර කර්මාන්තයේ යෙදුන මොවුන් බොහෝ දෙනෙකු ක්‍රිස්තුන් වහන්සේ වෙතින් කැඳවීම ලබන්නට සුදුස්සන් වූහ. ප්‍රධාන ශ්‍රාවකයාවූ පේදුරුතුමන්ද ගිහියෙකි. විවාහකයෙකි. එදා පැවති යුදා සමාජය තුළ පූජක කාර්යය පැවරී තිබුණේද ගිහියන්ටය. එමෙන්ම විවාහය සමාජ සම්මතයකි. එය දේව සේවයට, දේව කැඳවීමට බාධාවක් නොවුනි. එය අවහිරයක්ද කර නොගැණින. පුරාණ ගිවිසුමේ එන පූජක කාර්යය පැවරී තිබුණේද පරම්පරාවෙන් පරම්පරාවට පැවතෙන ලෙසටය. ආබ්‍රහම්, ඊසාක්, මෝසස්, නෝවා, ජෝෂප්, ජාකොබ්, දාවිත්, සලමොන් වැනි පැරණි ගිවිසුමේ එන ප්‍රබල චරිත මෙන්ම ජුවකීනු, ආනා, සකරියස්, එළිසබෙත්, ජුසේතුමන් හා මරිය තුමි වැනි නව ගිවිසුමේ මුලින් සඳහන් චරිතද ගිහියන් ලෙස දෙවිඳු කැඳවීම ලත් අයවෙති.

දෙවියන් වහන්සේගේ තෝරාගැනීම, ඔවුන්වහන්සේගේ කැඳවීම පුදුම සහගතය. එය අපට අදහගත නොහැකිය. අප මනසින් තේරුම් ගැනීමද අපහසුය. එය මිනිස් මනසින් විග්‍රහ කළ නොහැකිය. කිතුනුවා මෙන්ම නොකිතුනුවාද ඔවුන් වහන්සේ විසින් කැඳවනු ලබයි. එය අප එදා මෙන්ම අදද අත් දකිනු ලබයි. ඔවුන් වහන්සේගේ රාජ්‍යය සඳහා දමිටුවන් මෙන්ම අදමිටුවන්ද කැඳවීම ලබති. එය දේව කැමැත්තය. නව ගිවිසුමේ සඳහන් පරිදි එදා යුදා සමාජය තුළ පවුකරුවන් ලෙස හඳුන්වනු ලැබූ අය ක්‍රිස්තුන් වහන්සේ විසින් තෝරාගත් සේක. සකේවුස්, ලෙවි, මග්දලාහි මරියා සහ සාවුල් වැනි අය ක්‍රිස්තුන් වහන්සේ විසින් කැඳවනු ලබන්නට සුදුස්සෝ වූහ. එමෙන්ම ශුද්ධවර චරිත තුළද ගිහියන් ලෙස ජීවත් වූ අය බොහෝවෙති. ඔවුන්ගේ ජීවිත දෙවිඳුන් වෙනුවෙන්, ජනතා යහපත සඳහා වෙන්වූහ. සමාජය තුළ තැලෙන, පෑගෙන, අසහනයට, පීඩාවට පත් ජනතාව වෙනුවෙන් වැයවුන, කැපවුන, පූජාවුන ජීවිත ඔවුන් ගතකළහ. දෙවිඳුන්ට සේවය කිරීම යනු දෙවිඳුන් වෙනුවෙන් සමාජය තුළ වැයවීමය. කැපවීමය. දේව රාජ්‍යය සඳහා වැයවීමද සැලකිය හැක. එදිනෙදා ජීවිතයේදී ඇස ගැටෙන මිනිසා තුළින් දෙවිඳුන් දැකිය හැකිනම්, දෙවිඳුන් හමුවිය හැකිනම්, ඔහු වෙනුවෙන් දේව කැමැත්ත ඉටුකළ හැකිනම් එයට අවනතවිය හැකිනම් විසිඑක්වන සියවසේ සුදුවර චරිතයක් වන්නට ගිහියාටද හැකිවනු ඇත.

> විශේෂයෙන්ම පූජක ජීවිතය ක්‍රිස්තුන් වහන්සේ හා එක්ව ගත කරන වරප්‍රසාදලත් ජීවිතයකි. එය එසේවන්නේ දිව්‍ය පූජාව තුළ පූපය හා මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරය බවට පත්වීමේ ප්‍රාතිහාර්යාත්මක මොහොත පූජක දෙඅත මත සිදුවන හෙයිනි. ඒ ශුද්ධවූ මොහොත බලගතු සිදුවීම උදාකළ හැක්කේ පූජක තුමෙකුට පමණි. පූජක දිවිය පරිශුද්ධවත් විය යුත්තේද මේ නිසාය. ගිහියන් අතරත් පූජකතුමන් අතරත් ඇති වෙනස හා පරතරය මින් දැකගත හැක.

වත්මන් සමාජ අභියෝග හමුවේ දෙවිඳුන් හා බැඳුන ජීවිතයක් ගත කිරීමද ඉතාමත් අසීරු කටයුත්තකි. එහෙත් එය කළ නොහැකි අපහසු දෙයක්ද නොවනු ඇත. එය කළ හැකිය. සමාජ අභියෝග යන්ද ජයගත යුතුය. සියල්ල කළ හැක්කේ දෙවිඳුන් තුළ ජීවත්වුවහොත් පමණි.

දෙවිඳුන් වෙතින් ගිහියා කැඳවීමක් ලබන්නාසේම, පූජක පැවිදි කැඳවීම විශේෂිතය. ඔවුන් දෙවිඳුන් වෙනුවෙන්ම, දේව රාජ්‍යය සඳහාම කැපවුන, වැයවුන ජීවිත ගත කරති. එමෙන්ම දෙවිඳුන්ගේ විශේෂිත වරප්‍රසාද ලබන්නවුන්ය. ඔවුන්ගේ පූජක පැවිදි ජීවිත ලෞකිකත්වයෙන් ඈත්ව දෙවිඳුන් සඳහාත්, දේව රාජ්‍ය සඳහාත් පූජක වත්පිළිවෙත් හා අවවාද අනුශාසනා තුළින් ගිහි ජනතාවට අධ්‍යාත්මික ප්‍රබෝධයක් ලබාදීම සඳහාත් ඇප කැපව ක්‍රියා කරති. විශේෂයෙන්ම පූජක ජීවිතය ක්‍රිස්තුන් වහන්සේ හා එක්ව ගත කරන වරප්‍රසාදලත් ජීවිතයකි. එය එසේවන්නේ දිව්‍ය පූජාව තුළ පූපය හා මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරය බවට පත්වීමේ ප්‍රාතිහාර්යාත්මක මොහොත පූජක දෙඅත මත සිදුවන හෙයිනි. ඒ ශුද්ධවූ මොහොත බලගතු සිදුවීම උදාකළ හැක්කේ පූජක තුමෙකුට පමණි. පූජක දිවිය පරිශුද්ධවත් විය යුත්තේද මේ නිසාය. ගිහියන් අතරත් පූජකතුමන් අතරත් ඇති වෙනස හා පරතරය මින් දැකගත හැක. ක්‍රිස්තුන් වහන්සේ සකල ලෝකයාගේ ගැලවීම හා මිදීම සඳහා තම ජීවිතයම ස්ව කැමැත්තෙන් පූජාකිරීම, සංකේතවත් කරමින් ස්ථාපිත කරන ලද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නම්වූ දිව්‍ය භෝජනය ස්පර්ශ කිරීමට බලය ඇත්තේද පූජක තුමන්ට පමණකි. එහෙත් අද තෝරාගත් ගිහියන් අතටද දිව්‍ය භෝජනය හෙවත් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කරවන්නේ සැදැහැතියන් අතර බෙදා හැරීම සඳහා පමණකි. මෙහිදි ගිහි අපෝස්තලික සේවාවන්හි නිරත අය විශේෂ කැඳවීමක් ලබති.

පූජක තුමන් දේවරාජ්‍යය සඳහා දේව රාජ්‍යය වෙනුවෙන්, දේව ජනතාවගේ පැවැත්ම සඳහා කරනු ලබන කාර්යයන් තනිවම කිරීමට ඔවුන්ට අපහසුය. මීසම් සේවාව සංකීර්ණ කාර්යයකි. දේව ජනතාවගේ අධ්‍යාත්මික කටයුතු නංවාලීම සඳහා කරනු ලබන කාර්යයන් හැරුණු විට, එම ජනතාවගේ අනෙකුත් අවශ්‍යතාවයන්ද සොයාබැලිය යුතුව ඇත. සමහර මීසම් කිතුනුවන් බහුලව වෙසෙන කුඩා ප්‍රදේශයක් විය හැකිය. ඇතැම් මීසම් කිතුනුවන් අතලොස්සක් වෙසෙන විශාල ප්‍රදේශයක් පුරා විහිදුන එකක් විය හැකිය. සමහර මීසම්වල වැඩි පහසුකමක් තිබිය හැකි වුවද ඇතැම් මීසම්වල සේවාවන් දුෂ්කර විය හැකිය. එහිදි එම මීසම් භාර පූජකතුමන් අසීරු තත්ත්වයට පත්වනු ඇකිය හැක. සමහර විට ජීවත්වීමේ

15 පිටුවට »

රංජිත් නෝනිස්
කළුතර



මීසමෙන් මීසමට

# අධ්‍යාත්මික භක්ති අභ්‍යාසයන්ට යොමුවන්නේ නම් රටේ අපරාධ සිදුවන්නේ නැහැ

## බදුල්ල රදගුරු හිම්පාණෝ අවධාරණය කරති

**ශු. සතියේ ආරම්භයේදීම මෙවන් පසන් හා ලතෝනි වැඩ සටහනක් ආරම්භ කිරීම අගය කරමි. අද රේස් දුවන සමාජයක් නිසා මෙවන් අධ්‍යාත්මික භක්ති අභ්‍යාසයන්ට තැනක් නැත. වැඩ බහුල ජනතාව මේවාට යොමුවෙනවා අඩුයි. එහෙත් ප්‍රශ්නවලට විසඳුම් මෙතනයි. මේ අය තුළින් එදා ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා ඇතිකළ සම්ප්‍රදාය නොකැඩී ඉදිරියට ගෙනයන්න කටයුතු කරනවා. මෙවන් අධ්‍යාත්මික භාවනාත්මක භක්ති අභ්‍යාසයන්ට ජනතාව යොමුවන්නේ නම් රටේ එතරම් අපරාධ සිදුවන්නේ නැතැයි බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිම්පාණෝ පැවසූහ.**



එතුමා මෙසේ පැවසුවේ බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුරේ මීසම් ශාලාවේ ප්‍රථමවරට පැවැත්වූ, මීගමු දූවේ ඉපැරණි පසන් හා ලතෝනි භාවනාත්මක චතාරික මෙහෙයට සහභාගි වෙමිනි.

ලක්ෂමන් ද මෙල් මහතා ඇතුළු මීගමු පසන් කණ්ඩායම බදුල්ල මීසමේ ප්‍රථමවරට පැවැත්වූ මෙම වැඩ සටහන පසන් ගී යනු කුමක්දැයි ජනතාවට දැකගන්න සැලසූ ආකාරය ඉතා ප්‍රශංසනීයයි.

ශ්‍රීකාන්ති ගුණවර්ධන

## ගලගෙදර නව දෙව්මැඳුර 28 ද ආසිරි ගැන්වේ

කටුගස්තොට මීසමට අයත් ගලගෙදර ශුද්ධ වූ රපායෙල් අග්‍රදූත මුනිඳුන්ට කැපකළ නව දෙව්මැඳුර අප්‍රේල් 28 මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිම්පාණන් අතින් ආසිරි ගැන්වේ.

වසර 130 ට වඩා පැරණි කලින් තිබූ දේවස්ථානය තුළට බර පැටවූ ලොරියක් තිරිංග විරහිතව කඩා වැදීම නිසා නැවත අලුත් වැඩියා කළ නොහැකි ලෙස අබලන් තත්ත්වයට පත්විය.

පී. ඒ. ඩොමිනික්



රත්නපුර ආසන දෙව්මැඳුර ප්‍රතිසංස්කරණ කටයුතුවලට බඳුන්වීම නිසා මහසිකුරාදා තුන්පැය ධ්‍යානය පවත්වන ලද්දේ රත්නපුර නගර ශාලාවේදීය. මහසිකුරාදා පාදනමස්කාරය පවත්වන ලද්දේ රත්නපුර මහ නගරසභා සීවලි ක්‍රීඩාංගණයේදීය. රත්නපුර මීසම් වාසින් කුරුසිය උසුලාගෙන ගිය අයුරු. ගරු රන්ජන් මාල් මොරායස්, ගරු රොයිස්ටන් ක්ලේරේෂියන් නිකායික පියතුමා හා ගරු අයාල් ප්‍රනාන්දු සහෝදරතුමාද මෙහි වෙති.

තියබෝල්ඩ් සමරතුංග

## වත්තල ශා. අන්තෝනි ආදි ශිෂ්‍ය හමුව 28 දා

වත්තල ශා. අන්තෝනි විදුහලේ ආදි ශිෂ්‍ය සංගමයේ 67 වන වාර්ෂික මහා සභා රැස්වීම අප්‍රේල් 28 ප.ව. 4.30 ට විද්‍යාලීය ශාලාවේ දී පැවැත්වේ.

ක්ලැරන්ස් ලෙනාඩ්



මග්ගොන මීසම් සේවක ගරු හේමන්ත උදය කුමාර් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සා. මරියා දෙව්මැඳුරේ පැවති පාස්කු ඉරුදින මංගල දේව මෙහෙයෙන් පසුව සිරිත් පරිදි සැදැහැවතුන් උත්ථාන වූ ජේසු සමිඳුන්ගේ ප්‍රතිමාව රැගෙන, ගම වටා පෙරහරේ ගමන් ගත් අයුරු.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

## ඕලන්ද ශ්‍රී ලංකා පවුල් ආධාර වැඩසටහනේ නිර්මාතෘ අවසන් ගමන් යයි

පමුණුගම ඕලන්ද ශ්‍රී ලංකා පවුල් ආධාර වැඩසටහනේ හා ගෝනවිල විලගෙදර 'වෙල්කම්' ගම්මානයේ නිර්මාතෘ භක්තිවන්ත කතෝලිකයකුවන ශ්‍රී ලංකා රම්‍ය හර්මන් තියඩෝර් ස්ටුවර් මහතාගේ අවසාන කටයුතු පමුණුගම දෙව්මැඳුරු සුසානභූමියේදී සිදුකරන ලදි.

වසර තිස්පහකට පෙර තම විශ්‍රාමකාලයේදී උස්වැටකෙයියාව ග්‍රාමයේ පදිංචිව කීප දෙනකුගේ සහයෝගයෙන් දුප්පතුන්ට ආධාර කිරීමේ වැඩසටහනක් ආරම්භ කළේය. එවකට පමුණුගම මීසම් සේවක ගරු ලූෂන් ඩෙප් පියතුමා හර්මන් ස්ටුවර් මහතාගේ වැන්දඹු පවුල්වලට ආධාරකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පමුණුගම දේවස්ථාන භූමියේ පිහිටුවා තිබූ පැරණි පාසල් ගොඩනැගිල්ල ලබාදෙන ලදි. මේ මඟින් ග්‍රාමීය තරුණියන්ට රැකියා ලබාදුන් අතර විශාල පවුල් ප්‍රමාණයක් ආධාර ලබාගත්හ. ආගම් භේදයකින් තොරව මිනිස් හැඟීමකින් විලගෙදර පිහිටා ඇති 'වෙල්කම්' ගම්මානයට කාත් කවුරුත් නැති අසරණයන් කැඳවා ඔවුන් දෙමව්පියන් මෙන් රැක බලාගැනීමට සියලුම කටයුතු සංවිධානය කැරිණ. දෙව්මැඳුරු හා පන්සල් ආශ්‍රිතව බොහෝ සේවාවන් රැසක් කළේය.



තම මව්බිමට ගුවන් මඟින් යන අවස්ථාවේ හදිසියේ ඔත්පලවූ ස්ටුවර් මහතා ගුවන් යානයේදීම ස්වර්ගස්ථවිය. ඔහුගේ ඉල්ලීම පරිදි දේහය පමුණුගම සා. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරු සුසානභූමියේ භූමදාන කරන ලදි.

අවසාන කටයුතු සඳහා කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් නික්ලස් මාකස් අනුරාධපුර රදගුරු අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි හිම්පාණන්ද පියතුමන් පැවිදි සොයුරියන් හා විදේශිකයින්ද එක්වූහ.

බෙන්ජමින් කිරිහෙට්ටි

# මොල්ලිගොඩ නව දෙව්මැඳුර අද ආසිරි ගැන්වේ

මේ සති අග වාද්දුවේ මොල්ලිගොඩ 122 වාර්ෂික මංගල්‍ය සැමරුමට සමගාමීව අභිනවයෙන් ඉදිකරන ලද දෙව්මැඳුර කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිම්පාණන් අතින් අද ආසිරි ගැන්වේ.

1886 සිට ගරු ඩැනියෙල් ෆිලික්ස් පියතුමා දෙව්මැඳුරක් සඳහා අපේක්ෂාවෙන් සැදැහැවතුන් දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉඩමක් ලබාදීමට පොරොන්දුවක් ලැබුණ මුත් සැලසුම් කළ ආකාරයට එම පොරොන්දුව ඉටු නොවූ නිසා පියතුමා දෙවියන් වහන්සේ තුළ අසරණ තත්ත්වයට පත් නොවිය. ලියනගේ මතායස් පෙරේරා ඇතුළු සිව් දෙනෙක් විසින් තමන්ට අයත් ඉඩම සභාවට පරිත්‍යාග කිරීම හේතු කොටගෙන කිතුනු කැඳවීමට ප්‍රතිචාර දැක්වූහ. 1890 සැප්තැම්බර් මස 2 දින අති උතුම් බොන්ජීන් අගරදගුරු හිම්පාණන් අතින් මුල්ගල තබන ලදි. දෙව් අනුහසින් නොසිතූ පරිදි කෙටි කලකින් ඉදිකිරීමට හැකිවිය. 1891 අප්‍රේල් 01 දින අගරදගුරු හිමි ලේකම් ගරු සී. කොලින් පියතුමන් විසින් ආසිරි ගන්වන ලදි.

1923 ගරු පෝරෝ පියතුමා දෙව්මැඳුර විශාල කිරීමද, ගරු ඇල් ජෙරි පියතුමා කොටසක් අවසන් කිරීමද කර ඇතත්, සම්පූර්ණ කර ඇත්තේ ගරු ඇෆ් සුරි පියතුමන් විසිනි. මෙතුමා පූජක දිවියේ රන් ජුබිලිය නිමිත්තෙන් මොල්ලිගොඩ සංඝය විසින් පිළිගන්වන ලද මුදල දෙවියන් වහන්සේට නැවත පරිත්‍යාග කර දෙව්මැඳුරට අඩු පාඩුවක් වූ අල්තාරය සහ මීසම් ගෘහය තනවන ලදි.

පිලිප් කුරේ නම් පරිත්‍යාගිශීලියකු ප්‍රංශයේ



නිෂ්පාදිත ශුද්ධවූ පැට්‍රික් මුනිතුමන්ගේ ප්‍රතිමාව වාද්දුවේ සිට ගාම්භිර පෙරහරකින් 1926 මාර්තු 7 දින වැඩමවා දෙව් මැඳුරේ තැන්පත් කිරීම සිදුවිය. 1940 ස්වර්ණ ජයන්තිය පැවැත්වූ අරත, 1981 දි ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා බිත්ති වර්ණාලේප කළ අතර එම දෙව්විමන සංවර්ධනය කිරීමට කැපවිය. ගරු එඩ්වඩ් කොස්තා පියතුමා අති උතුම් නික්ලස් මාකස් අගරදගුරු හිමි වෙතින් ලද පර්චස් 60 ඉඩම දේවස්ථානයේ දේපල විශාල කිරීමට හේතුවිය. 1990 ඔක්තෝබර් 10 දින පූජාසනය ඉවත් කර නොවැම්බර් 5 දින දෙව්මැඳුර තවදුරටත් විශාල කළේය. සීනු කුඩුව, මීසම් ගෘහය නවීකරණය කිරීම සහ ජල සැපයුම් කටයුතු වලද පෙරමුණ ගත්තේය. 1991 එතුමා විසින් නවීකරණ ලද පූජාසනය මත ජුබිලි මංගල්‍යය අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් අගරදගුරු හිම්පාණන් අතින් සිදුවිය.

පුදුම්මක අසිරිය

මෙම මංගල්‍ය උත්සව කටයුතු වත්මන් මීසම් සේවක ගරු ඇන්ටන් සුජීව අතුකෝරළ පියතුමන් විසින් සංවිධානය කෙරිණි.

ගරු අග්‍රාමාත්‍ය, බුද්ධශාසන, ආගමික කටයුතු අමාත්‍ය සම්බන්ධිකරණ ලේකම් හා කළුතර කලාපයේ දිසා සභාවේ උපලේකම්
බර්ට්‍රම් ස්ටැනිස්ලොස් ප්‍රනාන්දු

## අපගේ කඳුලැලි පිසලන්න එතුමා සූදානම්!



කඳු පාමුල සිට කඳු මුදුනට පැමිණි පසු සියලු විඩා නැතිවී අවටින් හමන සිසිලස දැනුනා සේ දිනපතා ජීවිත කුරුසිය රැගෙන පැමිණිය යුතුයි. එසේ පැමිණි විට අපට සමිඳුන් හදට ගතට සුවය, සාමය, සතුට දෙනවා යැයි මහ සිකුරාදා හිනිදුම කල්වාරි කඳු මුදුනේ පැවති දේව මෙහෙයේ දී ගාල්ල රදගුරු අතිඋතුම් රේමන් කිංස්ලි වික්‍රමසිංහ හිම්පාණෝ පැවසූහ.

මේ මෙහෙයට අති විශාල ජනතාවක් සහභාගිවූ අතර, ගරු සම්පත් විලේගොඩ පියතුමා සහ ගරු නවීන් ද සිල්වා සොයුරු තුමා පාදනමස්කාරය මෙහෙයවූහ.

ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා



ජා-ඇල දෑලතුර මහසිකුරාදා පාදනමස්කාරය මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමාගේ අදහසක් අනුව ගමේ නුවන කොට්ඨාස අට නියෝජනය වන පරිදි කුරුස අටක් කොට්ඨාස අටට ලබාදී අළු බදාදා සිට ගමේ සෑම කොට්ඨාසයකම දිනපතා යාච්ඤා මෙහෙය පවත්වා මහ සිකුරාදා දින එම කුරුස අට රැගෙන කොට්ඨාශ අටේ බැතිමතුන් මහා පාදනමස්කාරයට එක්වූහ. මේ පාදනමස්කාරය මෙහෙයවන ලද්දේ අම්පිටිය ජාතික දෙව් සත්හලේ ගරු ජානක සහෝදර තුමන් විසිනි.

ඩබ්. ටී. සී. පෙරේරා

කිතුනු විශ්වාසයේ පදනම පාස්කුව වනබැවින්,කිතුනුවන්ගේ ප්‍රධාන උතුම් මංගල්‍යය පාස්කු මංගල්‍යයයි. අප එදිනෙදා ජීවිතයේ කිතුනු විශ්වාසයට සාක්ෂිදරන්නන් විය යුතු යැයි ඥානාර්ථ ප්‍රදීපය ප්‍රධාන කර්තෘ ගරු ශාන්තසාගර හෙට්ටිආරච්චි පියතුමා කුරුකුලාව සා. ලාසරස් දෙව්මැඳුරේ පැවති පාස්කු මංගල දිව්‍ය යාගයේදී පැවසීය.

කුරුකුලාව මීසම් සේවක ගරු ප්‍රසාද් පොන්නම්පෙරුම පියතුමා, පාදනමස්කාර විශේෂ චතාරික වැඩසටහන් පවත්වමින් මීසම් වාසීන්ට හරවත් පාස්කු මංගල්‍යයක් සැමරීම සඳහා කටයුතු සූදානම් කර තිබුණි.

පද්මිණි නානායක්කාර

# ප්‍රේමයේ බලය හා දිවැසිවර කැඳවීම

**"ප්‍රේමය" මිනිස් හදවතට ඉතා සමීප වචනයකි. ප්‍රේමය ගැන විවිධාකාර ලෙස විග්‍රහ කළ බොහෝ ලිපි හා ග්‍රන්ථ ලියැවී තිබේ. එනම් දෙමව්පිය ප්‍රේමය, අඹුසැමි ප්‍රේමය, සහෝදර ප්‍රේමය, පෙම්වතුන්ගේ ප්‍රේමය, රාගීය ප්‍රේමය, සත්‍ය ප්‍රේමය, පරිත්‍යාගයේ ප්‍රේමය ආදි වශයෙනි. මා මෙහිදී ඔබ සමඟ බෙදා ගන්නේ කුරුසේ ප්‍රේමයට ජේසු සමිඳුන්ව යොමු කළ දේව ප්‍රේමයත්, අසල්වැසි ප්‍රේමයත් පිළිබඳවය. එම ප්‍රේමය යොමු කරන දිවැසිවර කැඳවීම පිළිබඳවයි.**

මැවිල්ල තුළ වැඩවසන ජීවමාන අදෘෂ්‍යමාන සර්වබලය දෙවි පියාණන් වහන්සේ ය. උන්වහන්සේගේ ස්වභාවය ප්‍රේමයයි. උන්වහන්සේගේ අසීමිත ප්‍රේමය නිසා ලෝකාරම්භයේ පටන් ම මනුෂ්‍යයාට ප්‍රේම කළ සේක.

"දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙළූ සේක."

ලෝකාරම්භයේ පටන් අවසානය දක්වාම උපදින සෑම දරුවකුම ජීවමාන කරන්නේ උන්වහන්සේගේ ප්‍රේමයේ බලයෙනි. එබැවින් ඕනෑම පුද්ගලයකුගේ ප්‍රේමයේ ආරම්භය මව්කුසයි. අඹුසැමි යුවළකගේ ප්‍රේමයේ තිළිණය දරුවන් ය. මව්කුසින් අරඹන ජීවය ප්‍රාණවත් කරන ජීවන හුස්ම ප්‍රේමයේ බලය යි. මෙසේ මව්කුස තුළ හැදෙන වැඩෙන ජීවය හැඩගස්වන්නේ දේව ස්වභාවය වන ප්‍රේමයෙන් ය. "ඉන්පසු දෙවියන් වහන්සේ අපගේ ස්වරූපය අනුව සමානත්වය අනුව මනුෂ්‍යයා මවමු" (උත්. 1:26).

මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන දරුවන්ගේ අයිතිකරු දෙවි පියාණන් වහන්සේ වන අතර භාරකාරත්වය දෙවිඳුන් විසින් දෙමාපියනට පවරන ලදි. එබැවින් මව් කුස තුළ හැදෙන වැඩෙන දරුවා ප්‍රේමයෙන් රැක බලා ගැනීම හා පෝෂණය කිරීම දෙමාපියන්ගේ මූලික වගකීම වේ. එවිට මෙලොව උපදින දරුවා බොහෝ විට නිරෝගී සෞඛ්‍ය සම් පන්න, යහගුණ දහමින් පිරි, සුභවාදි පුද්ගලයකු බවට පත්වනු නොඅනුමානය. මෙවැනි පුද්ගලයන් තුළින් දිස්වෙන්නේ ඉවසීම, කරුණාව, නිහතමානිකම, මෘදු බව, සාමය, සතුට, සමාව, යුක්තිගරුක, සාධාරණ, සත්‍යවාදි හා අවිහිංසාව වැනි දේව රාජ්‍ය වටිනාකම් ය. මෙවන් පුද්ගලයන්ගෙන් පිරි පවුල, සමාජය, රට, ලෝකය සාමකාමී ය. සුභදශීලිය. ප්‍රේමාන්විතය.

එසේ නම් විශ්වය ව්‍යාකූල කරන හෝ විනාශ කරන නපුර හෙවත් අයහපතේ ආරම්භය කෙසේ විය හැකි ද? එහි ආරම්භයත් බොහෝ විට මව්කුස යැයි කීවොත් එය නිවැරදි යැයි මම සිතමි. දරුවකු කුස තුළ වැඩෙන විට මවගේ නොදැනුවත්කම හෝ නොසැලකිලිමත් කම විය හැකිය. මන්ද වර්තමානයේ බොහෝ මනෝ වෛද්‍යවරුන් සඳහන් කරන පරිදි මවගේ සිතිවිලි, වචන හා හැසිරීම කුස තුළ වැඩෙන දරුවාට මුළුමනින්ම බලපාන බැවිනි. නිදසුන් ලෙස මව ජීවිත සටන සමඟ කරන අරගලයන්, ඇය මුහුණ දෙන තාඩන පීඩනයන්, ඇය ඇතැම් විට කතා කරන අසුභවාදී වචන හා ක්‍රියාවන් , විශේෂයෙන් ඇතැම් මව්වරු දරුවන්ව ගබ්සා කිරීමට සිතීම හෝ සැලසුම් කිරීම ආදි විවිධාකාර හැඟීම් තුළින් මව්කුස තුළදීම දරුවා නපුරු ස්වභාවය නොදැනුවත්වම අත්විඳියි. එබැවින් දරුවකු ලොවට බිහිවන්නේ යහපත හා අයහපත සිත තුළ ධාරණය කරගෙනමයි. නැතිනම් ජන්ම පාපයත් ඇතිවයි. යහපත් සමාජයක හැදෙන වැඩෙන දරුවා ප්‍රේම කරන්නත් අයහපත් සමාජයක හැදෙන වැඩෙන දරුවා සමාජයට අයහපත් දේ කරන්නත් යොමු වේ. පසුකාලීනව එහි ප්‍රතිවිපාක සමාජයට පමණක් නොව මුළු ලොවටම අත්විඳින්නට සිදුවේ.

"යහපත් මිනිසා තම සිතෙහි නිධන් කළ යහපත ද, අයහපත් මිනිසා තම සිතෙහි නිධන් කළ අයහපත් දෙයින් අයහපත ද, උපදවයි. සිතෙහි උතුරා යන දෙය කටින් පිටවේ" (ලූක් 6:45). යහපත පමණක් සිතෙහි නිධන් කර ගනිමින් මෙලොවට පැමිණි ජේසු සමිඳුන්ගේ ජීවිතය හා දූත සේවාව තුළින් ප්‍රේම කරන්නට ඉගෙන ගනිමු. අයහපතින් හා පාපයෙන් තොර වූ උන්වහන්සේගේ චරිතය හා පෞරුෂය හැඩගැසී තිබුණේ ප්‍රේමයේ බලයෙන් ය. ප්‍රේමයේ බලය වනාහි ජේසු සමිඳුන් තුළ ජීවමාන අබ්බා පියාණන්ගේ ස්වභාවය හා බලය වේ. අබ්බා පියාණන්ගේ ප්‍රේමයේ බලයෙන් බලගතු වූ ජේසු සමිඳුන් දූත සේවාවේ සාරාංශය ද "ප්‍රේමය" වේ.

"නුඹේ මුළු හෘදයෙන් ද, නුඹේ මුළු සිතින් ද, නුඹේ මුළු බුද්ධියෙන් ද, නුඹේ මුළු වීර්යයෙන් ද, නුඹේ දෙවි ස්වාමින් වහන්සේට ප්‍රේම කරන්න."

"නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ද ප්‍රේම කරන්න." (ලූක් 22:37-39).

ජේසු සමිඳුන් තම අබ්බා පියාණන්ට මුළු හෘදයෙන් ද, සිතින් ද, බුද්ධියෙන් හා වීර්යයෙන් ප්‍රේම කළේ පියාණන් වහන්සේගේ අණට මුළුමනින් ම යටත් වීමෙන් හා කීකරු වීමෙන් ය. දේව අණට කීකරු වීම යනු දේව කැමැත්ත ඉටු කිරීමයි. දේව කැමැත්ත වූයේ අසල්වැසි ප්‍රේමයයි. ජේසු සමිඳුන් දෙවිඳුන්ට ප්‍රේම කළේ අසල්වැසි ප්‍රේමය තුළින් ය. ඒ මෙසේ ය.

★ දිළිඳුන්ගේ ධනය අසාධාරණ ලෙස සොරකම් කර සැපවත් ජීවිත ගත කළ අයට අභියෝග කිරීම.

"අහෝ දැන් පෘෂ්ටිමත් වී සිටින ඔබට වන විපතක මහත! ඔබට සාගිනි වනු ඇත."

★ නීතියට වඩා දයාව උතුම් බව පෙන්වීම.

"සබත් දිනයේ දී අප කළ යුත්තේ යහපත ද? නැතහොත් අයහපත ද? ප්‍රාණයක් ගැලවීම ද? නැති නම් නැසීම ද? යන ප්‍රශ්නය මම ඔබෙන් අසමි."

★ රජයේ හා ආගමේ වගකීම් පැහැදිලි කිරීම. "සේසරුගේ දේ සේසරුටත් දෙවියන්ගේ දෙය දෙවියන්ටත් දෙන්න."

★ ආගමික වත්පිළිවෙත්වලට අර්ථවත්ව සහභාගි වීමේ වැදගත්කම පහදා දීම.

"ඔබ පූජාසනය වෙත පඬුරු ගෙනෙන විට ඔබේ සහෝදරයාට විරුද්ධව අමනාපකමක් ඇත්නම් පළමුකොට සහෝදරයා හා සමඟ සමඟි වී පසුව අවුත් පඬුරු පුදන්න.

★ දේව රාජ්‍ය ගැන දේශනා කිරීම

සතුරන්ට ප්‍රේම කරන්න. වෛර කරන්නන්ට යහපත කරන්න. සාප කරන්නන්ට සෙත් පතන්න.

★ අයුක්තිට අසාධාරණයට එරෙහිව නැගී සිටීම. (දේව මාළිගාවේ වෙළෙඳුන් පලවා හැරීම)

★ අසාධාරණ විනිශ්චයන්ට ලක්වූවන්ට සාධාරණය ඉටු කිරීම. "ඔබ අතරින් පවක් නොකළ කෙනා පළමුව ගල් ගසන්න."

★ රෝගීන් සුව කිරීම හා විවිධ ප්‍රාතිහාර්යයන් කිරීම.

★ සහෝදර ප්‍රේමයේ උච්චතම අවස්ථාව කුරුසියේ යාගයයි. පරිත්‍යාගයේ ජීවිතයයි.

අසල්වැසි ප්‍රේමය පදනම් කර ස්ථාපිත කළ ජේසු සමිඳුන්ගේ සභාව විශ්වීයයි. ක්‍රිස්තියානිය විශ්වීය දහමකි. විශ්වයේ දහමේ ස්වභාවය ප්‍රේමයයි. එසේ නම් සෑම කිතුනුවකුගේ ම කැඳවීම අසල්වැසි ප්‍රේමය පෙන්වූ ජේසු සමිඳුන් අනුගමනය කිරීමයි. පළමුව මව්කුසයේ පටන් දෙවිඳුන් විසින් දායාද කළ උන්වහන්සේගේ ස්වභාවය වන "ප්‍රේමයේ බලය" බලගතු ජීවිත අත්දැකීමක් කර ගත යුතුවේ "ප්‍රේමයේ පණත" ජීවත් වෙමින් ධර්මයට අනුව ජීවත් විය යුතුවේ. "යමෙක් මට ප්‍රේම කරන්නේ නම් හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය. මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු වෙතට පැමිණ

වාසය කරමු ජුවාම් 14:23).

ප්‍රේමයට අනුව ජීවිත හැඩගස්වා ගන්නට ශු. සභාවේ අනාගතය වන ළමුනට ධර්මෝපදේශය හා ආගම විෂය මාර්ගෝපදේශයක් විය යුතුමය. පළමුව ගුරුවර ගුරුවරියන් ජීවිත ආදර්ශයෙන් අසල්වැසි ප්‍රේමයට සාක්ෂි දරමින් ධර්මය ඉගැන්විය යුතුවේ. ළමුන්ගේ වැරදි ආකල්ප වෙනස් කර ගන්නට දහම් පාඩම තුළින් ඔවුන් යොමු කළ යුතු වේ. එහෙත් අවාසනාවකට අද ධර්මෝපදේශය හා ආගම විෂය තුළින් "පාඩම් මාලාව" සම්පූර්ණ කර ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු දී විභාගය සමත් කරවන්නට බොහෝ දෙනකු යොමු වී සිටීම කණගාටුදායකය. ළමුන්ගේ වැරදි ආකල්ප වෙනස් කර අසල්වැසි ප්‍රේමයට හා අචල විශ්වාසයකට යොමු නොකරන දහම් පාඩම්, මොන තරම් කැපවීමෙන් ඉගැන්වූවත් එය අසාර්ථක උත්සාහයක් පමණි. නැතහොත් හුදු දැනුමක් දෙන විෂයන් අතර තවත් විෂයක් අධ්‍යයනය කළා මෙන් ය.

එමෙන්ම වර්තමාන සමාජය දෙස බලන විට අප බොහෝ විට අත්දකින්නෙත්, අත්විඳින්නෙත් අවනීතිය රජ කරමින්, දූෂණය, භීෂණය, වංචාව, හිංසාව හා ප්‍රචණ්ඩත්වයයි. මේවාට එරෙහිව නැගී සිටින්නන්ට අත්වන ඉරණම පහරදීම් හෝ අයුතු චෝදනා පිට අත්අඩංගුවට ගැනීම් හෝ අභිරහස් මරණයන් ය. එමෙන් ම රටේ සංවර්ධනය යැයි මවා පාමින් මහා මාර්ග හා විවිධ ව්‍යාපෘති මුවාවෙන් පුෂ්ටිමත් වූ සමහර කෝටිපතියන්ගේ සුඛෝපභෝගී ජීවන රටාව සමාජයට රහසක් නොවේ. සමහර පාලකයන්ගේ අනවශ්‍ය අධික වියදම් නිසා (බාල බඩු ආනයනය, සැණකෙළි, ජාත්‍යන්තර ක්‍රීඩා පිට්ටනි, දේශපාලනඥයින්ගේ නඩත්තුව) ජීවන වියදම ඉහළ යාමෙන් සාමාන්‍ය ජනතාව විවිධාකාර අරගලයන්ට මුහුණ පෑමට සිදුවී ඇත. මූලික අවශ්‍යතාවන් පවා සපුරා ගැනීමට නොහැකිව දුක් විඳින යුධ අනාථයන්ගේ හා ගං වතුර සුනාමි වැනි ස්වාභාවික විපත්තීන්ට ගොදුරු වූ දකුණේ ජනතාවගේ අඳෝනාවන්හි දෝංකාරයත් අසන්නට ලැබේ. නීතිය, බලය, ධනය හා පොදු දේපොළ අයුතු ලෙස යොදමින් සිදුවන අයුක්තිය, අසාධාරණය හා අසත්‍ය දිනපතා පුවත්පත්වල ප්‍රවෘත්ති වී ඇත.

මේ අයුරින් ව්‍යාකූල වී ඇති දේශයක, යුක්තිය හා සාධාරණත්වයෙන් යුත් සාමකාමී දේශයක් අනාගත පරපුරට ගොඩනගා දීම අපගේ මූලික වගකීම බව වටහාගත යුතුමයි. එබැවින් දෙවිඳුන්ගේ "ප්‍රේමයේ බලයෙන්" බලගතු වී ජනතාවගේ සුභසිද්ධිය උදෙසා සමාජ අසාධාරණයන්ට එරෙහිව නැගී සිටිමින් රටේ වගකිව යුත්තන්ට අභියෝග කරමු. බලපෑම් කරමු. නිහඬව නොසිටිමු. එය කිතුනු අපේ දිවැසිවර කැඳවීමයි. ජේසු සමිඳුන්ගේ කුරුසියේ ප්‍රේමයේ ආදර්ශයයි. එසේ නොවන්නේ නම් කිතුනු අප ලවන රස නැති ලුනු හා සමාන වන්නෙමු.

**ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවදි සොයුරිය**
(මරියතුමියගේ ප්‍රැන්සිස්කාන ධර්මදූතික සොයුරියෝ)

## පූජක වරම් ලද නවක පූජක සොහොයුරනි

මා ආදර සොහොයුරනි
ඔබ සැම පූජක වරම් ලබන අද දින
මගේ මුළු හදවතින්ම මම
දෙව් මහෝත්තම සමිඳාණන් වහන්සේට තුති දෙමි
එතුමාණෝ සැබවින්ම යහපත් ය.

දෙව්සත්හලේ එක්ව ගත කළ ඒ සොඳුරු කාලය
කෙසේ නම් අමතක කරන්නද?
සතුටේදී සිනහවත්... දුකේදී කඳුලත් ...
බෙදාගත් අපි,
අපේ කුසලතා තුළ, අපේ දුබලකම් තුළ,
අප ජීවිත ශක්තිමත් කරගත්තා නොවේ ද?

එසේම, ඔබ එකිනෙකාගේ ඒ දුර්වලකම් තුළ
ඔබ සැම කැඳවූ දෙවි සමිඳාණන් වහන්සේට
ඔබ පිළිතුරු දුන්නා නොවේද?
උන්වහන්සේට අවශ්‍ය වන්නේ ද එයමැයි!

ඉතින් මා සොහොයුරනි,
ක්‍රිස්තුන් වහන්සේ තුළ ගරු පියවරුනි,
නිල පූජකවරය නම් වූ නොමැකෙන මුද්‍රාවෙන්
ආලෝකවත් වූ ඔබ සැමගේ ජීවිත
ජේසුස් වහන්සේගේ ඒ කැපවුණු ජීවිතයේ
කැඩපතක්ම වේවා!

**එරංග ලක්ශ්‍රිත ද සිල්වා සොයුරු**
දෙවන වසර දේව ධර්මය
(ඇමරිකාවේ සා. මරියා දෙව්සත්හලේ සිට)



සභා පියවරු 32 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

## සභා පියවරුන්ට අනුව කතෝලික සභාව යනු කුමක්ද?

නව ගිවිසුම තුළ ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයන් සඳහා මුල්ම භාවිත කරන ලද නාමය නම් "මාර්ගය" (Hodos = The way) යන්නයි (ක්‍රියා 9:2). ඊට පසුව, මුල් අනුගාමිකයන්ගේ සීඝ්‍ර වර්ධනයත් සමඟ ඔවුන්ට "ක්‍රිස්තියානි" (Christianous = Christians) යන නාමය යෙදීමට පටන් ගැණුනි. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත වාර්තා කරන ආකාරයට "ඔවුහු අවුරුද්දක් මුළුල්ලෙහිම සභාව හා එක්රැස්ව, මහත් සමූහයකට ඉගැන්වූහ. "ක්‍රිස්තියානි" යන නාමය ගෝලයනට පළමුකොට දෙනු ලැබුයේ අන්තියෝකියේ දීය." (ක්‍රියා 11:26).

එහෙත් "කතෝලික සභාව" (He katholike ekklesia = The Catholic Church) යන නාමය මුලින්ම භාවිතා කරන ලද්දේ මුල් සභා පියවරෙක් වූ අන්තියෝකියේ ඉග්නාසියස් තුමා විසින් ස්මර්නාහි කිතුනු සංඝයට ලියන ලද ලිපියෙහිය. එම ලිපියේ එතුමා මෙසේ සඳහන් කරයි; "ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සිටින්නේ කොතැනද, එතැන කතෝලික සභාව පවතියි" (Where Jesus Christ is" there is the Catholic Church).

ඉග්නාසියස් තුමා ප්‍රාණ පරිත්‍යාගවරයෙක් වශයෙන් මිය ගියේ ක්‍රි.ව. 109 හෝ 110 දී පමණය. එසේ නම් අපට නිගමනය කළ හැක්කේ "කතෝලික සභාව" යන නාමය පළමු වන ශත වර්ෂය අගදී හෝ දෙවන ශත වර්ෂය මුලදී භාවිතයට ඇතුළු වූ බවයි. ඒ අනුව "කතෝලික සභාව" යන නාමයට අවුරුදු 1900 ක ඉතිහාසයක් ඇත. ඒ අනුව එය අලුත් සංකල්පයක් නොවේ. කරුණු එසේ නම් කතෝලික සභාව යන සංකල්පයේ පුළුල්ම අර්ථය කුමක් ද?

ක්‍රිස්තුන් වහන්සේගේ දූත මෙහෙවර (උන්වහන්සේගේ ජීවිතය සහ පණිවුඩය යනු දෙකක් නොව එකකි. ඒ දෙක කිසිසේත්ම වෙන් කළ නොහැකිය.) විශ්වාන්තර ලෙස, ගෝලීය ලෙස අර්ථ දක්වන්නේ සහ ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න මුල සිටම අපෝස්තුළුවරුන් මුහුණ පෑ අභියෝගයකි. ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර ගැන පුළුල්ම, ගැඹුරුතම, දැවැන්තම සහ සුවිශාලතම දෘෂ්ටි කෝණය ඓතිහාසිකව ඉදිරිපත් කිරීමට ප්‍රයත්න දරන ලද සභාව කතෝලික සභාවයි.

ක්‍රිස්තුන් වහන්සේ විසින් දිනා දෙන ලද ගැලවීමේ ක්‍රියාවලිය මිනිසාට හඳුන්වාදීමේ දී එය ඉතා සුවිශාල සන්දර්භයක් තුළ අර්ථකථනය කළ යුතුවේ. එම සන්දර්භය නම් හුදු මානව සංහතිය පමණක් නොව, සමස්ත විශ්වයයි. උන්වහන්සේ සමස්ත විශ්වයේම ගැලවුම්කරුවාණෝ ය. ක්‍රිස්තුන් වහන්සේගේ උපතට පෙර ජීවත් වූ පරම්පරා වලටත් එම ගැලවීමේ ක්‍රියාවලිය බලපානු ලබයි. ක්‍රිස්තුන් වහන්සේගේ මෙලොවට පැමිණීම සමස්ත විශ්වීය ඉතිහාසයේ සිදුවුණු තීරණාත්මකම සිද්ධියයි.

ඒ අනුව කතෝලික සභාව ක්‍රිස්තුන් වහන්සේ තුළ මානව ගැලවීම උදෙසා භාවිත කළ හැකි සෑම ඉඩකඩක්ම සෑම අවස්ථාවක්ම ලබා දීමට ප්‍රයත්න දරා ඇත. දෙවියන් වහන්සේට පවතින ඕනෑම දෙයකින් වැඩගත හැකිය. උන්වහන්සේගේ නිර්මාණශීලිත්වයට, නිදහසට සීමාවන් පැනවිය නොහැකිය. එය තේරුම් ගැනීම සඳහා කිතුනුවන් නිරන්තරයෙන්ම විවෘතව සිටිය යුතුයි. දෙවියන් වහන්සේගේ අසීමිත නිර්මාණශීලිත්වය ගැන නිතරම ගැඹුරට මෙනෙහි කළ යුතුයි.

දෙවියන් වහන්සේගේ නිදහසට සීමා නොපනවන ආගමික සම්ප්‍රදාය කතෝලික සභාවයි.
සෑම යථාර්ථයක්ම, මානව අත්දැකීමක්ම දේව ධාර්මිකව විග්‍රහ කළ හැකිය. එමඟින් සිදුවන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ සුභාරංචියට තව තවත් කොටස් එකතු කිරීමක් නොව, සුභාරංචිය විකෘති කිරීමක් නොව, සුභාරංචියේ දැක්මෙන් සෑම දෙයක් දෙසම බලා විග්‍රහ කිරීමයි. ඒ මත පදනම් වී දේව ධාර්මික සම්ප්‍රදායක් ගොඩනැගීමයි.
ඒ සඳහා සුවිශේෂ කැපවීමක් සහ දක්ෂකමක් සභා පියවරුන් පෙ-න්නුම් කරන ලදි.

මෙම කතෝලික ක්‍රියාවලිය සෑම පරපුරක් විසින්ම දියත් කළ යුත්තකි.

**ලබන සතියට ...**

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්




ශුද්ධ ලියැවිලි වසර

**(10)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

(2012.04.08 ලිපිය හා සබැඳේ)

**(ඇ) වගන්ති 7 - 10**

මේ කොටසින් සංකේතාත්මකව විස්තර වන්නේ දෙවි ස්වාමින් වහන්සේ විජයග්‍රාහී ලෙස දෙව්මැඳුරට ප්‍රවිශ්ට වීමේ දේවධාර්මික සත්‍යතාවයි. එයට පසුබිමේ සිදුවීමක් ලෙස දාවිත් රජතුමා ගිවිසුම් කරඬුව උත්සවශ්‍රීයෙන් යුතුව ජෙරුසලෙමට රැගෙන ඒමේ සිදුවීම සඳහන් කළ හැකිය. (2 සාමුවෙල් 6)

**ද්වාරයෙනි :** දොරටුවට ආමන්ත්‍රණය කිරීම අවධාරණයේ ප්‍රකාශයකි. වන්දනා ගමනක සංදර්භය තුළ දේව වන්දනාව සඳහා දෙව්මැඳුරට ඇතුළුවීමේ ගාම්භීර බව ඉන් හැඟවෙන්නේය. (ගීතා 100:4, එළිදරව්ව 4:1).

**සව්බලැති හිමිතුමාණෝ :** ඊශ්‍රායෙල් ජනතාවගේ ජීවිත ගමනේදී වැදගත් අත්දැකීමක් වූයේ දෙවි සමිඳාණන් වහන්සේ විසින් සතුරු උවදුරු වලින් ඔවුන් මුදා ගැනීමයි. මෙම වන්දනා ගමන් පිළිවෙත තුළින් දෙවියන් වහන්සේ සිය ජනතාව වෙත ලබා දෙන විජයග්‍රහණයත් නිරන්තරයෙන් සිහිපත් කෙරේ (2 සාමුවෙල් 6:2).

### යැදුම :

සියලු බලැති දෙවි පියාණෙනි, සකල විශ්වය පුරා ද මුළු මිනිස් දිවිය තුළ ද ඔබවහන්සේගේ මහිමය සහ කරුණාගුණය ප්‍රකාශ වන්නේය. අප ජීවිත වලට ඔබ තිළිණ කරන ඉමහත් ආශිර්වාදයන් වෙනුවෙන් ඔබවහන්සේට ස්තුති ප්‍රශංසා කරමු. ලෝකයේ විවිධ ගැටළු වලට මුහුණ දෙන අප හට නිරතුරුව ඔබව සොයමින්, ඔබට අවනත වෙමින් ජීවත් වීමට වරම් දුන මැනව. ආමෙන්.

## 33 වැනි ගීතය

මෙය ප්‍රශස්ති ගීයකි. දෙවි සමිඳාණන් වහන්සේගේ වචනයේ ජීවදායක බලය ද ලොව සිසාරා පවතින උන්වහන්සේගේ පරමාධිපත්‍යය ද උන්වහන්සේ කෙරෙහි අදහන්නන් වෙත දක්වන දිව්‍ය සංරක්ෂණය ද මේ තුති පැසසුම් දීම සඳහා හේතු වන්නේය. මේ ගීතයේ භාෂා ශෛලිය තුළින් පැරැණි ලොවේ ප්‍රඥා සාහිත්‍යයය හා සබැඳි යෙදුම් ද දැකිය හැකිය. දෙවි සමිඳාණන් වහන්සේ විශ්වයේ නිමැවුම්කරු ලෙස ද ජන දිවිය සුරකින මිදුම්කරුවාණන් ලෙස ද දේව ජනතාව වෙතින් බුහුමන් ලබන සේක.

**ලේඛන සැලැස්ම**

**වගන්ති 1 - 3 :** ප්‍රශංසාවේ යැදුම සඳහා සැදැහැවතුනට කෙරෙන ආරාධනය.

**වගන්ති 4 - 9 :** සමිඳුන්ගේ දැහැමිකමට හා මැවීමේ මහිමවත් ක්‍රියාව නිසා පැසසුම් දීම.

**වගන්ති 10 - 19 :** මිනිස් ජනතාව හා ඉතිහාසය මත බල පැවැත්වෙන සමිඳුන්ගේ ආධිපත්‍යය.

**වගන්ති 20 - 22 :** සැදැහැවතුන්ගේ විශ්වාසයේ ප්‍රකාශනය.

**(අ) වගන්ති 1 - 3)**

මේ කොටසින් දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කිරීමට වාද්‍ය භාණ්ඩ හා ගීත සමගින් එක්වීම සඳහා කෙරෙන ඇරියුමක් දැක්වේ.

**නව ගීතයක් :** දෙවි සමිඳාණන් වහන්සේ මිදුම්කරුවාණන් ලෙස උදාකරන ගැලවීම වෙනුවෙන් කෙරෙන හෘදයාංගම ප්‍රතිචාරයකි. (යෙසායා 42:10 , ගීතා 40 :3). එය ඉතිහාසය තුළ දෙවි සමිඳාණන්ගේ ක්‍රියාවන් තුති පැසසුම් දීම සඳහා එක්වීමට සැමට කෙරෙන ඇරියුමකි. තවද එය යුගාන්තවේදී දැක්මක් අනුව උදාවන මෙසියානික ක්‍රියාකාරිත්වය වෙනුවෙන් දෙවි සමිඳාණන් හට කෘතවේදීවීමේ අවශ්‍යතාව ද පෙන්නුම් කරයි. (ගීතා 98 :1, එළිදරව් 5:9).

**(අ) වගන්ති 4 - 9 :**

දෙවියන් වහන්සේගේ සක්‍රිය බලයෙන් යුත් වචනය වෙනුවෙන් පැසසුම් පුද කිරීමේ උතුම්කම මේ කොටසින් විස්තර වේ. මැවීමේ ක්‍රියාවට හේතු වූයේ දෙවි සමිඳාණන් වහන්සේගේ ශ්‍රී වචනයයි.

**අවංකය :** දේව වචනයේ අවංක බව නොහොත් යහපත්කම ශුද්ධ බයිබලයේ දිස්වන ප්‍රධාන තේමාවකි. එය දෙවියන් වහන්සේගේ අණ පණත්වල ඇති ශීල ධාර්මික ගුණය අපට පෙන්වා දෙයි (ගීතා 19:9). එයින් ගිවිසුම කෙරෙහි දෙවි සමිඳාණන්ගේ විශ්වාසවන්ත බව විදහා දැක්වෙන්නේ ය.

**යුක්තිය :** දෙවියන් වහන්සේ සාධාරණත්වය හා යුක්තිය අගයන සේක. ඊට මිනිසා දිරිගන්වන සේක (ගීතා 11:7). ගීතාවලිය කතුවරයා මෙම මෙනෙහි කිරීම "දයා කරුණාවේ" තේමාව හා එක්ව පෙන්නුම් කරන්නේ දෙවි සමිඳාණන්ගේ ගුණවන්ත භාවය ප්‍රශංසාවට ලක් කරමින්ය (ද්වි. නීති. 32:4, ගීතා 103:6-7)

**හිමිතුමන්ගේ වචනයෙන්:**

උත්පත්ති පොතෙහි ඇති මැවීමේ මුල් කතා පුවත පිළිබඳ ඉඟි කිරීමක් මෙහි ඇත (උත්. 1:1-2:47අ). එය ශ්‍රී වචනයේ ඇති උත්පාදක බලය පෙන්නුම් කරන්නේය. මැවීමේ තේමාව ගීතාවලිය ග්‍රන්ථයෙහි කැපී පෙනෙන්නකි (ගීතා 8, 19, 104, 148 ගීත)

**හුස්මෙන් :** "වචනය" හා සමාන්තර "හුස්ම" යන යෙදුම මැවීමේ ක්‍රියාවලිය මතුකොට පෙන්වීමට දායක වේ. (උත් 2:7)

**(ඇ) වගන්ති 10 - 19)**

ගීතාවලිය කතුවරයා ලෝක පැවැත්ම තුළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය ගැන මෙනෙහි කරමින් උන්වහන්සේ වෙත ප්‍රශංසාවේ ආකල්පය පැහැදිලි කරයි. ලෝකය මවා එය හසුරුවන දෙවිඳාණන් ලෙසත් මානව සංහතිය විමුක්තිය සලසාලන දෙවිඳාණන් ලෙසත් උන්වහන්සේ පැසසීම යුතු වූ ක්‍රියාවකි.

**සමිඳුන්ගේ සැලැසුම් :** දෙවියන් වහන්සේගේ අභිමතය හා සැලැසුම් ගැලවීමදායකය. එයා මානව හැසිරීමේ වැරදි බව හා දුර්වලතා නිසා කිසිදාක නිෂ්ප්‍රභා නොවේ. එය මිනිස් ඉතිහාසය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වන්නේ ඇදහිලිවන්තයා ශක්තිමත් කරවමිනි (යෙසායා 14:24).

**සිය මන්දිරයේ සිට :** දෙවියන් වහන්සේ ස්වර්ගයේ වැඩ වසමින් මිනිස් ජනතාවගේ ජීවිත සුපරීක්ෂාකාරීව සොයා බලන අන්දම මෙයින් පෙන්නුම් කෙරෙන්නේය (ගීතා 11:4,4:2).

**සිතුවිලි හැඩගස්වන්නේත් :** ලෝකය නිර්මාණය කළ දෙවි සමිඳාණන් වහන්සේ මනුෂ්‍යයන් හදවත් හෙවත් ඇතුළාන්ත ජීවිතය යහපත් ලෙස හැඩගස්වන සේක. (සෙකරියා 12:1, ගීතා 26:2).

**ගැළැවුණු රජෙක් නැත :** ගැලවීම මිනිසාගේ ශක්තිය සහ ක්‍රම වේද මත රඳා පවතින්නේ නැත (හිතෝප 21: 30-31, ජුදිත් 9:7, ගීතා 20:6-8). දෙවි සමිඳාණන්ගේ සරණය මත පමණක් මිනිස් සංහතියේ ගැලවීම රඳා පවතී.

**(ඈ) වගන්ති 20 - 22**

මේ අවසන් කොටස තුළින් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන අයට උරුම වන ආශිර්වාදය සංක්ෂිප්තව දැක්වේ.

**ලබන සතියට ...**

## 2012 දේව වචනයේ වසර - උත්ථාන සමයේ තෙවන ඉරුදින

සතියේ මෙනෙහි කිරීම

**තේමාව -**

**ජේසුස් වහන්සේගේ මරණය හා අනිවාර්යයෙන් සම්බන්ධ වූ ක්‍රිස්තු උත්ථානයේ සත්‍යතාව**

**පළමුවෙනි කියවීම : ක්‍රියා 3:13-15, 17-19**

අබ්බගාත මනුෂ්‍යයකු සුවකළ පේදුරු තුමා දේව මාලිගාව අසළ රැස්වූ ජනතාවට පවසන්නේ එම මනුෂ්‍යයා සුවය ලබා ඇත්තේ උත්ථාන වූ ජේසුස් වහන්සේගේ අනුහසින් බවය. පුරාණ ගිවිසුමේ දිවැසිවැකි අනුව ක්‍රිස්තු උත්ථානය ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා මරණය සමඟ අනිවාර්යයෙන් සම්බන්ධ බව එතුමා අවධාරණය කරයි. ජේසුස් වහන්සේ උත්ථානයෙන් පසු මෙලොව දූත මෙහෙවරේදීම මෙන්ම ක්‍රියාකාරී බවද මෙම සුව කිරීම මඟින් සනාථ කෙරේ.



**දෙවන කියවීම : 1 ජොහාන් 2:1-5**

පව් නැසීමේ යාගයක් ලෙස අප උදෙසා සිය ජීවිතය පරිත්‍යාගී කළ ජේසුස් නම් දෙවියන් වහන්සේ ඉදිරියේ මැදහත්කරුවකු සිටින බව අපෝස්තුළුවරයා අවධාරණය කරයි. උන්වහන්සේ අප උදෙසා මැදිහත්වීම සඳහා අප අනිවාර්යයෙන්ම උන්වහන්සේ ඉගැන්වූ පනත් අනුසාර කළ යුතුය.

**ශුභාරංචිය : ලූක් 24:35-48**

උත්ථානයෙන් පසු ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට දර්ශනය වෙමින් උන්වහන්සේ අවතාරයක් නොවන බව ඔවුන් ඉදිරියේ පිසින ලද මාලු කෑල්ලක් වළඳා ඔප්පු කළ සේක. එකල ජුදා පිළිගැනීම අනුව ජීවමාන මනුෂ්‍යයකුගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා භෞමික ශරීරයක අවශ්‍යතාව අනිවාර්ය අංගයක් විය. පුරාණ ගිවිසුම අනුව මෙසියස් තුමා මහිමයට පත්වීම සඳහා දුක්විඳ මරණයට පත්විය යුතු බවද උන්වහන්සේ සිය ශ්‍රාවකයන්ට ඒත්තු ගැන්වූ සේක. (යෙසායා 53:1-12)

**මෙනෙහි කිරීම**

උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ අත්දුටු සැම දෙනාගේම ජීවිත වෙනස් විය. අපේ ජීවිත ආධ්‍යාත්මික ඇල්මැරුණු ගතියෙන් පිරී ඇත්නම් අප උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ යම් තරමකටවත් අත්දැක ඇත්දැයි අපගේ හෘද සාක්ෂිය විමසා බැලිය යුතුය.

දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර එකම මධ්‍යස්ථකයා ජේසුස් වහන්සේය (1 තිමොති 2,5). අප උදෙසා උන්වහන්සේ මැදහත්වීම කළාක් මෙන් අප ද එකිනෙකාට ප්‍රේම කළ යුතු බවට තිබෙන ආඥාව පිළිපැදිය යුතුය.

උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ අප ජීවිත තුළ ක්‍රියාකාරී වන බවට උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට මෙන් බාහිර සාක්ෂි අවශ්‍ය ද? එවැනි ඇදහිල්ලක් තුළින් අප ජීවත්වන්නේ ද යන්න ප්‍රශ්න කළ යුතුමය.

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 30

# නික්මයාම පොත




## නික්මයාම පොතේ පසුබිම

මෙම පොත හෙබ්‍රෙව් බසින් "වෙ-එල්ලේහ් - ෂෙමෝට්" (එම නාම මෙසේය) යනුවෙන් හැඳින්වෙයි. නික්මයාම පොත ආරම්භ වන්නේ, "ජාකොබ් සමඟ මිසරයට..... පැමිණි ඉශ්‍රායෙල් ජනයාගේ නාම මෙසේය." යන වගන්තියෙනි. එනම් ජෝසප්ගේ කාලයේ මිසරයේ පදිංචියට පැමිණි ඉශ්‍රායෙල් ජනතාවය. (උත්පත්ති පරි. 47-50 ) සෙප්ටුවාජින්ත පිටපත (ග්‍රීක පිටපත) මෙම පොත නම් කරන්නේ "එක්ස්හොඩොස්" (නික්මයාමෙහි යෙදෙන) යනුවෙනි. මෙම පොත මිසරයේ වහල් බවින් විමුක්තිය ලැබීමෙන් අනතුරුව, කාන්තාරය මැදින් ඉශ්‍රායෙල්වරුන් පොරොන්දු දේශයට ගිය ගමන වෙත අවධානය යොමු කරයි.

ඉශ්‍රායෙල් ජනතාව මහත් සේ ගණනින් වැඩිවෙමින් සිටි බව සඳහන් කරමින් පොත ආරම්භ වෙයි. මෙයින් පෙන්නුම් කෙරෙනුයේ දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව එලෙස පූර්ණත්වයට පත් වු බවය (උත්. 12/2). ජොසෙප් ගැන කිසිවක් නොදත් අලුත් රජෙක් රජකමට පත්වු බව කියැවෙයි. ජෝසෙප් පිළිබඳ කථා සාමාන්‍යයෙන් සම්බන්ධ කෙරෙන්නේ, ක්‍රි.පු. 1720 - 1550 අතර කාල පරිච්ජේදයට ය. එය හික්සොස් පාලන සමය ලෙස හැඳින්වෙයි. හික්සොස්වරු, හෙබ්‍රෙව්වරුන් හා සංස්කෘතික සබඳතා තිබුණු ආසියාතික ජන කොටස් වුහ.

15 වන, 16 වන හා 17 වන පාරාවෝ රාජ පරම්පරාවන් ක්‍රමයෙන් පරාජය කිරීමට හික්සොස්වරු සමත් වුහ. දහ හත්වන වන රාජ පරම්පරාව පරාජය වීමත් සමඟ, නයිල් ගඟ වටා පිහිටි මිසරයේ විශාල භූමි ප්‍රදේශයක් තමන් යටතට ගැනීමට ඔවුන්ට හැකි විය. දහ අටවන පාරාවෝ රාජ පරම්පරාවේ අවසාන රජවරු, නයිල් ඩෙල්ටාව අසබඩ, අවාරිස් නම් වු ස්ථානයක තම අගනුවර පිහිටුවා ගත් හික්සොස් වරුන් පරාජය කළෝය.

එලෙස මිසරයෙන් නෙරපන ලද නමුත් පලස්තිනය අවට ඔවුහු රැඳී සිටියහ. අවසානයේ 19 වන පාරාවෝ රාජ පරම්පරාවේ මහා රජවු පළමු වන සේති ඔවුන් මුළුමනින් පරාජය කොට, පලස්තීනයෙන්ද නෙරපා දැමිය. එමනිසා ජෝසෙප් ගැන කිසිවක් නොදත් අලුත් රජ පිළිබඳ සඳහන තේරුම් ගත යුත්තේ 19 වන පාරාවෝ රාජ පරම්පරාව ආශ්‍රයෙනි.

## මිසරයෙන් නික්ම ගිය කාලය

ශු. බයිබලය වකවානු දෙකක් ඉදිරිපත් කරයි.

1 රාජාවලිය 6/1 - මේ අනුව නික්මයාම ක්‍රි.පු. 15 වන ශතවර්ෂයේ සිදුවු බව පෙනේ. "...ඉශ්‍රායෙල් ජනයා මිසර දේශයෙන් පිටත්ව ආපසු පැමිණ හාරසිය අසුවන අවුරුද්දේ එනම් ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි සලමොන් රජකම් කිරීමට පටන් ගෙන සතර වන අවුරුද්දේ....ඔහු සමිඳාණන් වහන්සේගේ මාලිගාව ගොඩනඟන්නට පටන් ගත්තේය".

සලමොන් රජකමට පත්වුයේ ක්‍රි.පු. 970 පමණය. ඔහු රජකම් කිරීමට පටන් ගෙන සතර වන අවුරුද්ද යනු 970 - 4 = 966 + 480 = ක්‍රි. පු. 1446. මෙය ක්‍රි. පු. 15 වන ශත වර්ෂයයි. ඒ අනුව නික්මයාම සිදුවී ඇත්තේ ක්‍රි. පු. 15 වන ශතවර්ෂයේදිය. එහෙත් ඉශ්‍රායෙල්වරු ක්‍රි. පු. 15 වන ශත වර්ෂයේ පලස්තීනයේ පදිංචිව සිටි බවට ඓතිහාසික හෝ පුරා විද්‍යාත්මක සාක්ෂි නොමැති බැවින් මෙම වකවානුව පිළිබඳ බරපතල ගැටළු මතු වෙයි.

නික්මයාම පළමුවන පරිච්ජේදය, නික්මයාම සඳහා ක්‍රි. පු. 13 වන ශත වර්ෂයේ කාල වකවානුවක් අප වෙත ඉදිරිපත් කරයි.

නික්මයාම 1/11 ට අනුව රාමෙසෙස් හා පීනොම් යන නගර ගොඩ නගා ඇත්තේ ඉශ්‍රායෙල්වරුන් විසින්ය. රාමෙසස් නුවර ගොඩනැගීම පිළිබඳ ඓතිහාසික සාක්ෂි මිසරයේ ඓතිහාසික ලේඛන තුළ හමුවේ. එහෙත් පිනොම් නුවර පුරා විද්‍යාත්මකව හෝ භූගෝලියව මෙතෙක් හඳුනා ගෙන නොමැත. රාමෙසස් රජ තම අගනුවර ගොඩ නැංවුයේ හික්සොස් වරුන්ගේ අගනුවරවු අවාරිස් අසබඩ නයිල් ඩෙල්ටාවෙහිය. නව රජතුමා කරුණු දෙකක් මුල් කොටගෙන ඉශ්‍රායෙල් ජනතාව පිළිබඳව බියෙන් පසුවු බවද කියැවේ. එම කරුණු මෙසේය.

1. ඉශ්‍රායෙල් ජනතාව ක්‍රමයෙන් ගණනින් වැඩිවීම
2. යුද්ධයක් ඇති වුවහොත් ඔවුන් සතුරන් හා එක් වීමට බොහෝ ඉඩකඩ තිබීම.

දෙවන රාමෙසස් රජු ආශ්‍රිතව මෙය පහසුවෙන් අවබෝධ කරගත හැකි වෙයි. දෙවන රාමෙසෙස් රජුගේ පියාවු පළමු වන සේති රජතුමා පලස්තීනයෙන් හික්සොස්වරුන් පන්නා දැමීය. තවද, අගනුවර තිබ්ස් නුවර සිට නයිල් ඩෙල්ටාවට ගෙන යාමට දෙවන රාමෙසෙස් රජතුමාට අවශ්‍යවු විට ඔහුට ඒ සඳහා මිනිස් ශ්‍රමය අවශ්‍ය විය. එලෙස, ඉශ්‍රායෙල්වරු මිසරයේ වහල් බවට පත්වීම තේරුම් ගත හැකිවෙයි. ඒ අනුව ක්‍රි. පු. 13 වන ශත වර්ෂය පමණ කාලයේ, ලාකිෂ් හා හශෝර් නම් නගරවල ඉශ්‍රායෙල් වරුන් වැනි ජන කොටසක් පදිංචිව සිටි බවට සාක්ෂි පුරාවිද්‍යාඥයන් විසින් සොයා ගෙන ඇත. මෙයට අමතරව ක්‍රි. පු. 1220 පමණ කාලයට අයිති දෙවන මර්නෙෆ්ටා රජුගේ සෙල් ලිපියක ඔහු යුද්ධයේදී පරාජය කළ ජන කොටස්අතරඉශ්‍රායෙල්යනනමදසඳහන්වෙයි.එයින්පෙන්නුම් කෙරෙනුයේ එවකට ඉශ්‍රායෙල්වරුන් පලස්තීනයේ පදිංචිව සිටි බවය. මෙලෙස ඉශ්‍රායෙල් යන නාමය ප්‍රථම වතාවට ඉතිහාසය තුළ මතුවනු දක්නට ලැබේ.

(තවත් කොටසක් ලබන සතියේ...)

# මේ කිතුනු පොත් වලට ප්‍රමිතියක් අවශ්‍ය නැද්ද?



**කතුතුමනි,**

එස් ගොඩගේ ප්‍රකාශන සමාගම මගින් ආරම්භ කරන ලද කිතුනු පොත් ව්‍යාපෘතිය මෙරට කතෝලික ලේඛක හා පාඨක බොහෝ කොටස්වල අමන්දානන්දයට හේතු වන බැව් නොරහසකි. ඒ පිළිබඳව එහි අධිපති සිරිසුමන ගොඩගේ මහතාණන්ට අපේ තුතිය පිරිනැමේ.

මේ වැඩ සටහන යටතේ නිකුත්වන කිතුනු පොත්වල ප්‍රමිතිය ගැන මීට වඩා අවධානය යොමුවිය යුතු යැයි අපට හැඟේ. විශේෂයෙන් කතෝලික පොත්පත් මුද්‍රණය කිරීමේදී මුද්‍රණ අවසරය ලබා ගැනීම සසුන් නීතියෙන් සම්මත දෙයකි. එහෙත් අවාසනාවකට මෙන් ගොඩගේ කිතුනු පොත් ව්‍යාපෘතිය යටතේ නිකුත්වන එකදු පොතක්වත් මුද්‍රණ අවසරය ලබාගෙන නොමැත. මෙය අවධානයට ලක්විය යුතු තත්ත්වයකි.

එමෙන්ම කතෝලික සමාජ දර්ශනය මැයෙන් පළව තිබූ ග්‍රන්ථය ශුද්ධෝත්තම පියතුමන්ගේ විශ්ව ලේඛන වලින් සංගෘහිතව තිබිණ. එහෙත් ගොඩගේ ප්‍රකාශන ලෙස එය නැවත මුද්‍රණයේදී සිදුකර ඇති වෙනස්කම් විශ්ව ලේඛනවල වටිනාකම හෑල්ලුවට ලක්කර ඇති අයුරු දිස්වේ. එපමණකුදු නොව, ඒ මගින් ශුද්ධෝත්තම පියතුමන්ගේ විශ්ව ලේඛනයන්හි ප්‍රකාශ විකෘති කරමින් විවිධ පුද්ගලයන්ගේ ඊනියා මතවාද වලින් පුරවා ඇත. මෙය සැබැවින්ම පාඨකයා නොමඟ යැවීමක් මෙන්ම කරුණු විකෘති කොට දැක්වීමකි. මේ නිසාම මේ ග්‍රන්ථය ශාස්ත්‍රීය පරිශීලනයකට යොදාගත නොහැකි තත්ත්වයට පත්ව ඇත. මේ පිළිබඳව තතු දත් අයගෙන් නැගෙන මැසිවිලි වලින්ද අඩුවක් නැත. ස්වර්ගස්ථ වී වදාළ අතිගරු ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් මාහිමිපාණන් විසින් දහම් සරණ ආයතනය මගින් ප්‍රකාශයට පත් කරන ලද පුංචි පොත් පෙළ එදා පාඨකයාට ලබාදුන්නේ රු. 10, 15 වැනි මුදලකටය. ඒ පොත් නැවත මුද්‍රණය කර රු. 100/=, 150/= ආදි මිළ ගණන් වලට අලෙවි කිරීම ගැන පාඨකයා තුළ පවතින්නේ කුකුසකි.

ප්‍රමිතියකින් හා ගුණාත්මක බවකින් තොරව, එසේම කිතුනු නොවන පාඨකයන් අතට පත් කරන මේ පොත පත තුළින් විකෘති දහම් පණිවුඩයක් විහිදෙන්නේ නම් එහි අරමුණත් නිෂ්ඵල වනු ඇත. මේ පොත් මුද්‍රණයට පෙර ග්‍රන්ථ පරීක්ෂණ කමිටුවක් හරහා මෙහි ගුණ දොස් විචාරන්නේද යන්නද පැහැදිලි නැත.

මේ කරුණු කාරණා ගැන පුළුල්ව සිතා බැලිය යුතු වකවානුවකට අප ළඟාවී සිටී. මේ පිළිබඳව වගකිව යුත්තන්ගේ අවධානය යොමුවේවා!

**එන්. සී. වී. ප්‍රනාන්දු**
සීදුව

# දේව වචනය වෙත ජනතාව පෙළගැස්වීමට හැකියාවක් ඇත්නම්!

**කතුතුමනි,**

'දේව වචනය තුළින්, විශ්වාසයේ නවෝදයක් කරා' යන තේමාව මුල්කරගෙන, දේව වචනයේ වසර යනුවෙන් දියත්කර ඇති වැඩපිළිවෙල ප්‍රශංසනීයයි, එමෙන්ම කාලෝචිතයි. කිතුනු ජනතාව අතර දේව වචනය කියවීම, එය පිළිපැදීම නොහොත් එය තම ජීවිතයට අදාල කරගැනීම. අත්‍යවශ්‍යව තිබුණද, ජනතාව අතර එය ඉතාම අල්ප වශයෙනුයි යොමුව තිබුණේ.

ඇල්මැරුණු, බලරහිත කිතුනු ජීවිතයට නව පන්නරයක් හා පෝෂණයක් ගෙන දෙන්නේ දේව වචනය තුළින් බව පිළිගත හැකි සත්‍යයකි. ඇතැම් නූතන කිතුනු ජනතාව අල්පවශයෙන් වුවද, දේව වචනය තුළින් ක්‍රිස්තියානියේ නියම අරුතට යොමුවෙමින්, දහමට සාක්ෂි දරණ බවක් ද දක්නට ඇත.

මේ අනගි සම්පන්න ක්‍රියාදාමය, ජනතාව අතර ප්‍රචලිත කර, ඔවුන් වෙත



ගෙනයාමේ වැඩ සැළැස්මක් මෙතෙක් දියත්කර නොමැති බවක් පෙනේ. හුදෙක්, ජනතාවට දේව වචනය කියවීමට, උපදෙස් දීමෙන් පමණක්, ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකිද?

කුඩා කිතුනු සංඝ (අසිපා) වැනි පොදු ක්‍රියාදාමයක් මගින් හෝ අප කිතුනු ජනතාවගේ අධ්‍යාත්මික ජීවිතය නංවාලිය හැකි විශේෂිත වූ මෙම දූත මෙහෙවරට පාලක පක්ෂයේ නොමඳ දායකත්වය ලබා දෙන්නේ නම්, උපරිම ප්‍රතිඵල ලැබිය හැකියැයි සිතමි.

**රිචඩ් වික්‍රමසිංහ**
බටගම

# කාදිනල් හිමි 'ගබ්සා ප්‍රකාශයට' රූපවාහිනී බෞද්ධ වැඩසටහනකදී පැසසුම්!

**කතුතුමනි,**

පසුගිය මහසිකුරාදා/ පෝය දින (2012.04.06) පස්වරු 9.30 ට TNL රූපවාහිනී නාලිකාව ඔස්සේ අති පූජ්‍ය බණ්ඩාරවෙල අමිතානන්ද ස්වාමීන්වහන්සේ සහ මනෝ වෛද්‍ය විශේෂඥ DBK හරිස්චන්ද්‍ර මැතිතුමන් විසින් මෙහෙයවන ලද 'සදහම් යාත්‍රා' නැණපහන දම්සභා මණ්ඩපය වැඩසටහනේ දී එක්තරා ප්‍රේක්ෂක පැනයකට පිළිතුරු සපයමින් වෛද්‍යාචාර්ය හරිස්චන්ද්‍ර මැතිතුමන් "අතිගරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින්" ඉතාමත්ම වැදගත් ප්‍රකාශයක් කරල තිබුන....... ශ්‍රී ලංකාවේ ගබ්සා නීතිය වෙනස්කරන්ට යනවා..... එපා!...... ගබ්සාව ඉතාම පහසු කරන්නට දෙන්න එපා!.... කලල රූපයටත් මානව හිමිකමක් තියෙනවා......" යන ප්‍රකාශයට අප ආඩම්බර වෙන්ට ඕනෑ. කාලෝචිත ඉල්ලීමක් කරල තියෙන්නෙ. අපේ අය එහෙම කරල නෑ....." යනුයෙන් පවසා කාදිනල් හිමිපාණන්ගේ එම එඩිතර ප්‍රකාශය ප්‍රසිද්ධියේ පැසසුමට ලක්කරන ලදි.

"එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හෝ විදේශික බලපෑම් මත හෝ අපගේ ප්‍රතිපත්ති පාවාදීම වැරදි අතර, එය අපගේ සංස්කෘතියට නොගැලපෙන බැවින්, ගබ්සා නීතිය ලිහිල් කිරීම සඳහා ගෙනඒමට යෝජනාකර ඇති සංශෝධන වලට ඉඩනොදෙන්නැයිද බංකොළොත් සංස්කෘතියකින් එන බංකොළොත් අදහස් රටතුළ ක්‍රියාත්මක කිරීමට හෝ කාන්තාවන්ගේ විමුක්තිය පිළිබඳව බොරු අදහස් ඉදිරිපත් කරනට ඉඩනොදිය යුතු බවද, අපේ රටේ වටිනාම සම්පත අපගේ දරුවන් බවත්, බංකොළොත් විදේශ රටවල පාපකාරී අදහස්වලට ගැති නොවිය යුතු බවද මවකගේ කුසතුළ පිළිසිඳග න්නා ඕනෑම දරුවකුට මවට මෙන් මෙලොව එළිය දැකීමටත්, ජීවත් වීමටත් අයිතියක් ඇති බවද, එම දරුවා අංග විකල දරුවකු වුවද ඔහුව ප්‍රතික්ෂේප කිරීමේ අයිතියක් කිසිවකුටවත් නොමැති බවද ඇතැම් රටවල 'ගබ්සාව' නීතිගත කර තිබෙන්නේ ඔවුන්ගේ රටවල අගතිගාමී ආර්ථික සමාජ අදහස් වලට අනුව බවද කතෝලික දහම අනුව දස පනතේ පස්වැනි වගන්තිය අනුව 'මිනී නොමරන්න' යනුවෙන්ද බුද්ධ ධර්මයේ පන්සිල් පද පහෙන් පළමු ශික්ෂා පදය වශයෙන් 'මම ප්‍රාණ ඝාතනය නොකරමි' යනුවෙන් සඳහන් වන බවද විශේෂයෙන් දෙවියන් වහන්සේගේ ස්වරූපයට මවන ලද 'මනුෂ්‍යයා' ඉතා උත්තරීතර බැවිද, දරුවකු මව්කුස පිළිසිඳගන්නා මොහොතේ පටන් ඔහුට ඇත්තේ ජීවිතයක් බවත්, ඇතැම් විට ගබ්සා කොට විනාශ කිරීමට උත්සාහ කරන දරුවා පවුලකට වාසනාව, සතුට රැගෙන එන හැකියාවන්ගෙ න් පිරිපුන් දරුවකු වියහැකි බවද, එවැනි දරුවන් රටට වැඩදායි දරුවන් බවට පත්කරනට කටයුතු කිරීම මෙම සමාජයේ වගකීමක් බවද 'දිවි සුරැකීමේ හැදියාව' නමින් සෙඩෙක් ආයතනයේදී පැවැති මාධ්‍ය හමුවකදී 'ජීවිතය' පිළිඳව කතෝලික සභාවේ ස්ථාවරය සහ 'ගබ්සාව' පිළිබඳව කතෝලික සභාවේ ස්ථාවරය අතිගරු කාදිනල් හිමිපාණන් විසින් පැහැදිලි කරන ලදි. (ඥානාර්ථ ප්‍රදීපය 2012 අප්‍රේල් 08)

**එම්. ජෝ. පාරිස්**
වැලිවිට

# විවාහ දිව්‍ය පූජාව ආරම්භයේ සීනුව නාද කළ යුතුද?

**කතුතුමනි,**

කතෝලික සභාව ප්‍රදානය කරන සෑම සක්‍රමේන්තුවක්ම එය ලබන තැනැත්තා, ඉතා නිහතමානිව ලබා ගත යුතුය. එසේ විනා, එම සක්‍රමේන්තුව ලබා ගන්නා තැනැත්තාව, දේවස්ථානයට පැමිණෙන විට, ගරු බුහුමන් දෙමින් කැඳවාගෙන ඒම සුදුසු නැත. කෙනෙකුව පූජාත්වරයටත්, ගරු පිය තුමකු රදගුරු තනතුරටත් එසවීමේදී, එතුමන් දෙවියන් වහන්සේ ඉදිරියේ මුනින්තලා වැටී බැගෑපත්ව, එම සක්‍රමේන්තු හා එම තනතුරු ලබා ගන්නා සැටි අපි දැක ඇත්තෙමු. ආශිර්වාදකාර බන්ධන සක්‍රමේන්තුවට ද එම ප්‍රතිපත්තියම බලපානවා ඇත.

සක්‍රමේන්තුවක් ලබා ගැනීමට හෝ දේවස්ථානය තුළ කිසියම් දේව මෙහෙයකට සහභාගි වීම සඳහා හෝ පැමිණෙන කුමන තරාතිරමක කෙනෙක් වුවත්, නිහතමානීව දෙව්මැඳුරට ඇතුලු වෙනවා මිස, දිව්‍ය සත්ප්‍රසාදය තුළ වැඩසිටින ක්‍රිස්තුන් වහන්සේ ඉදිරියේදි, තමන්ට ගරු නම්බු ලබමින් පැමිණීම යෝග්‍ය නොවේ. නමුත් දේවස්ථානය තුළ රතු පලස එලා මනාලිය ඒ මත කැඳවාගෙන ඒම, දේවස්ථානය තුළ ඇට මල් ඉසිමින් කැඳවාගෙන ඒම ආදිය අද සිදුවන දේවල්ය. මෙම අනවශ්‍ය දේවල් නැවත්වීමට ගරු පියතුමන් ද අපොහොසත් වී ඇත. දේවස්ථානය තුළ දෙවියන් වහන්සේට දිය යුතු ගෞරවය මනුෂ්‍යයන්ට නො දිය යුතුය. ඇත අතීතයේදී විවාහ දිව්‍ය පූජාවක් ආරම්භයට පෙර දේවස්ථාන සීනුව නාද කිරීම කළේ විවාහ දිව්‍ය පූජාවක් පවත්වන්නට යන බව, එම ප්‍රදේශයේ සැදැහැවතුන්ට දැනුම් දී, ඔවුන් දේව මෙහෙයට සහභාගි කරවා ගැනීමටය. එහෙත් දැන් විවාහ දිව්‍ය පූජාවලට සහභාගි කර ගන්නා අයව, ආරාධනා පත්‍ර මගින් කලින්ම දැනුම් දී ඔවුන්ව විවාහ දිව්‍ය පූජා වලට සහභාගි කරවා ගනිති. මේ අනුව දැන් විවාහ දිව්‍ය පූජාවලට පැමිණෙන්නේ එවැනි ආරාධිතයන් පමණය. සීනු හඬින් එය දැන ගන්නා අසල් වැසියෝ නො පැමිණෙති. ආරම්භක සීනුව නාද කරන්නේ මනාලියට ගරු කිරීම සඳහාය යන දුර්මතය ද දැන් ජනතාව තුළට ඇතුලු වී ඇත. සමහරු තමන්ගේ විවාහ දිව්‍ය පූජා වලදි, සංක්‍රිස්තියන්ට මුදල් දී ප්‍රථම සීනුව වැඩියෙන් නාද කරවා ගනිති.

එබැවින් මෙවැනි තත්ත්වයක් යටතේ, විවාහ දිව්‍ය පූජාව ආරම්භයට පෙර, දේවස්ථාන සීනුව නාද කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් දැන් නොපෙනේ. තවද දේවස්ථාන සීනුව අනවශ්‍ය ලෙස, අනවශ්‍ය අවස්ථා වලදි නාද කිරීමද නො කළ යුතුය. විවාහ දිව්‍ය පූජාවට පැමිණ සිටින, ආරාධිතයන්ට දිව්‍ය පූජාව ආරම්භ කරන බව දැන්වීමට අවශ්‍ය නම්, ඉරිදා දිව්‍ය පූජාවල මෙන් සීනුව 3 වරක් නාද කළ හැකිය. විවාහ දිව්‍ය පූජාව තුළදී, ආශිර්වාදකාර බන්ධන සක්‍රමේන්තුව ප්‍රදානය කිරීමේදී, සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවීමේදි, දැනට සිදු කරන පරිදිම සීනුව නාද කිරීම සුදුසුය.

**අයිවන් රණසිංහ**
මීගමුව

# ලෝගුවේ ගෞරවය නොකෙලසනු !

**කිතුතුමනි,**

බෞද්ධයාට චීවරය වැදගත් සේම කතෝලිකයාට පූජක ලෝගුව පූජනීයය. අතීතයේ ලෝගුවක් හැඳි අයෙකු මුණ ගැසුන සැනින් 'ජේසු ක්‍රිස්තු ආරාධිතවේවා!'යි හිස නමා ආමන්ත්‍රණය කළේ ඒ නිසාය.

ලාංකීය කිතුනු සභාව ගොඩනගන්නට මරණීය පීඩන මැද්දේ එදා මෙහි පැමිණ දිවි කැපකළ 'ජුසේවාස් පියතුමන්' 'ජාකෝමේ ගොන්සාල්වේස්' පියතුමන් වැනි අය එවන් භීෂණ පසුබිමක පවා තම ජීවිත ආරක්ෂාව වෙනුවෙන්වත් ලෝගුවේ ගෞරවය කෙලෙසා නැතැයි කියවේ. එතුමන්ලා සැරිසැරුවේ පීඩිත වෙස්ගෙන පීඩිතයන් අතරය.

එහෙත්! වර්තමානයේ බොහෝ තරුණ පූජක පුතුන් තම ආගමික යැදුම් කටයුතු වලින් බැහැර බොහෝ අවස්ථාවල 'ලෝගුව' අතැර 'විවිධ විලාසිතා ඇඳුම්වලින්' සැරසී සිටිනු දක්නට ඇත. එවැනි විලාසිතා ඇඳුම් වලින් සැරසී පූජක පුතකු යයි හඳුනාගත නොහැකි අයුරින් ගිහි තරුණ පිරිස් හා එක්වී ප්‍රීති සම්භාෂණ වලට සහාභාගිවන අවස්ථා අසන්නට දකින්නට ඇත. එවැනි අවස්ථා වලින් දැහැමි බැමි ලිහිල්ව පූජක සිත් ඉරාගෙන එළියට පනින ඉඳුරන් පිනන සිතැඟි තුළින් 'මත්පැනට' 'විරුද්ධ ලිංගිකයනට' ආකර්ෂණය වීම සිදුවීමට බොහෝවිටඉඩ ඇත.



සභා උන්නතිය වෙනුවෙන් කිතුනු ඉගැන්වීම අනුව දිවි කැප කරන ගෞරවණීය පූජක පුතුනට අගෞරව නොකර කිතුනු ඉගැන්වීම යනු පුරාණ ගිවිසුමේ ප්‍රකාර එකිනෙකාට ප්‍රේම කිරීමට යොමුවෙමු.

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි**
හීන්කෙන්ද



# කැඳවීමේ ගමන තුළ මඟපෙන
# දේව අරමුණ පෝෂණය කර

## ලෝක දේව කැඳවීම් යැදුම් දිනය (දේව කැඳවීම් ඉරුදින) නිමිත්තෙ
## සුදොතුම් පියතුමන්ගේ පණිවුඩය



**දයාබර සහෝදර සහෝදරියෙනි,**

උත්ථාන සමයේ හතරවැනි ඉරුදිනට, එනම් 2012 අප්‍රේල් 29 වැනි දිනට යෙදී ඇති, 49 වැනි දේව කැඳවීම් සඳහා වන ලෝක යැදුම් දිනය "කැඳවීම් දෙවිඳුන්ගේ ප්‍රේමයේ තිළිණයකි" යන තේමාව ඔස්සේ භාවනාවේ යෙදීමට අප යොමුකරයි.

සැම ශ්‍රේෂ්ඨ ත්‍යාගයකටම මූලය වන්නේ ප්‍රේමය වන දෙවියන් වහන්සේම ය. - Deus Caritas est (දෙවියන් වහන්සේ ප්‍රේමය ය.) "ප්‍රේමයෙහි ජීවත් වන්නා උන්වහන්සේ තුළ ජීවත් වෙයි. දෙවියන් වහන්සේ ද ඔහු තුළ ජීවත් වන සේක" (1 ජොහාන් 4:16). ශුද්ධවු ලියැවිල්ල මැවීමටත් පෙර පටන් දෙවියන් වහන්සේ හා මිනිසා අතර පැවත එන ඒ සබැඳියාව පිළිබඳ කථාන්තරය ප්‍රකාශ කරයි. එපීසයේ වෙසෙන ක්‍රිස්තියානීන්ට ලිපියකින් ආමන්ත්‍රණය කරමින් ශු. පාවුළු තුමා දෙව්පියාණන් වහන්සේගේ අසීමිත ශු. කරුණාබර ත්‍යාගිවන්තභාවය කරණකොටගෙන සිය ප්‍රේමයේ සැලැස්ම වන විශ්වීය ගැලවීමේ සැලැස්ම කාලයාගේ ඇවෑමෙන් පූර්ණත්වයට පැමිණවීම පිළිබඳව දෙව්පියාණන් වහන්සේට දක්වන කෘතවේදීභාවය හා ප්‍රශංසාව ගීතිකාවක් මඟින් ප්‍රකාශ කරයි. සිය පුත්‍රයාණන් වන ජේසුස් වහන්සේ තුළ "ප්‍රේමයෙන් උන්වහන්සේ ඉදිරියෙහි අප ශුද්ධව, නොකැළැල්ව සිටින පිණිස, ලෝකය මැවීමට ප්‍රථමයෙන්... දෙවියන් වහන්සේ අප තෝරාගත් සේක." (එපීස 1:4) යි පාවුළු තුමා පවසයි. අපගේ පැවැත්මටත් ප්‍රථමයෙන් දෙවියන් වහන්සේ අපට ප්‍රේම කරන සේක. දෙවියන් වහන්සේ හා සමඟ පූර්ණ සහජීවනයකට අප ගෙන ඒම සඳහා උන්වහන්සේගේ කොන්දේසි විරහිත ප්‍රේමය පමණක් කරණකොටගෙන උන්වහන්සේ "කලින් නොතිබුණු දෙයකින්" අපව මවා වදාළ සේක. (බලන්න 2 මකබි 7:28).

මහා පුදුම එළවන සුළු දෙවියන් වහන්සේගේ දිව්‍ය සංරක්ෂණයේ ක්‍රියා පැසසුමට ලක් කරමින් ගීතාවලි කතුවරයා මෙසේ පවසයි; "සියතින් ඔබ නිමකළ අහස් තලය ද ඔබ පිහිටෙවූ සඳ මඬල ද තරු වැල් ද මා නරඹන කල්හි, මිනිසා ගැන සිතන්නට තරම් ඔහු කවරෙක් ද? මිනිසා ගැන සලකන්නට තරම් ඔහු සතු වටිනාකම කුමක්දැයි මට සිතෙන්නේය" (ගීතාවලිය 8:3-4). මේ නයින් අපගේ පැවැත්ම පිළිබඳ ගැඹුරු සත්‍යය මෙම පුදුම එළවන සුළු අභිරහස තුළ ගැබ්ව පවතී. එනම් සෑම මැවිල්ලක්ම, විශේෂකාරයෙන් සෑම මනුෂ්‍යයකුම, දෙවියන් වහන්සේගේ සිතුවිල්ලේ ඵලයවනවා මෙන්ම සීමාන්විතවූත්, විශ්වාසවන්තවූත්, සදාතනිකවූත් සිය ප්‍රේමයේ ක්‍රියාවක් ද වෙයි. (බලන්න ජෙරමියා 31:3). මෙම යථාර්ථය
අවබෝධකර ගැනීම අපගේ ජීවිත තුළ ගැඹුරු වෙනසක් ඇති කරයි. ශු. අගුස්තීනු මුනිතුමා සිය "පාපොච්චාරණය" නමැති කෘතිය තුළ ඉතා බලවත් ලෙස දෙවියන් වහන්සේ පිළිබඳ සිය අවබෝධයත්, උපරිම රම්‍යතාව හා උපරිම ප්‍රේමයත් සැමවිටම තමන් හා ළඟින් සිටි දෙවියන් වහන්සේ ගැනත්, අවසානයේ සිය මනසත්, හදවතත් වෙනස් කිරීම සඳහා උන්වහන්සේට විවෘත කළ ආකාරයත් මෙසේ දක්වයි.

*ඔබට ප්‍රේම කිරීමට මම පමාවීමි!*
*සදා පෞරාණිකවූත්,*
*සදා නැවුම්වූත් රමණිය,*
*ඔබට ප්‍රේම කිරීමට මම පමා විමී!*
*ඔබ මා තුළවීය.*
*එහෙත් මම පිටත වීමි*
*එහි මම ඔබ සෙවීමි*
*මගේ අනාදරය නිසාවෙන්*
*ඔබගේ ආදරබර මැවිලි තුළ නිමග්න වීමි*

*ඔබ මා හා විය,*
*එහෙත් මම ඔබ හා නොවීමි.*

*ඔබ මවන ලද දේ මා ඔබෙන්*
*වෙන්කර තැබීය;*
*එනමුදු ඒවා ඔබ තුළ නොවන්නට*
*ඒවාට ද පැවැත්මක් තිබිය නොහැක.*

*ඔබ කථා කළෙහිය,*
*ඔබ කෑගැසුවෙහිය,*
*ඔබ මාගේ බිහිරි බව බිඳ දැමීය.*
*ඔබ ක්ෂණයකින් දැල්වුනෙහිය,*
*ඔබ බැබැලුණේය,*
*ඔබ මාගේ අන්ධභාවය දුරු කෙළෙහිය.*
*ඔබේ සුගන්ධ මා වෙතට හෙළීය.*
*ඒ කරා මම ඇදුනෙමි*
*දැන් මම ඔබ කෙරෙහි පිපාසා වෙමි*
*මම ඔබ රස බැළුවෙමි.*
*දැන් මම වඩ වඩාත්*
*ඔබ කෙරෙහි කුසගිනි වෙමි*
*පිපාසා වෙමි*
*ඔබ මා ස්පර්ශ කෙළෙහිය.*
*ඔබගේ ශාන්තිය ලබනු රිසින්*
*මම දැවෙමි*

මෙහි එන රූපක මඟින් සිය කිය නොහැකි අභිරහස්‍යමය දෙවිඳු අත්දැකීමත් සිය ජීවිතය වෙනස් කළ දේව ප්‍රේමයේ අත්දැකීමත් විස්තර කිරීමට හිපෝහි සාන්තුවරයාණන් වෙර දරයි.

එය සීමා රහිත ප්‍රේමයකි. එය අපට ප්‍රථමයෙන් වූ, අප දරා සිටින, අපව ජීවනයේ මඟ වෙත කැඳවන, ඒකාන්තයෙන්ම ස්වෛරීයත්වයෙන් හෙබි දේව තිළිණයක් ලෙස නිධන්ගතවූ ප්‍රේමයකි. මට පෙර පාප්ධුරය හෙබවූ, භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියාණන් විශේෂාකාරයෙන් නිල පූජකවරය පිළිබඳව අදහස් දක්වමින් මෙසේ පවසා ඇත. "සැම පූජක නිල කාර්යයක්ම ශුද්ධවු සභාවට ප්‍රේම කිරීමට සහ සේවය කිරීමට යොමු කරවන අතරම, ශුද්ධවු සභා මාතාවගේ බන්ධුවරයාණන් ද, එඬේරාණන් ද එහි සිරස ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරේ වඩා ගැඹුරු වූ ප්‍රේමයකටත්, සේවයකටත් යොමු වීමට අපව දිරි ගන්වයි. එය සැමවිටම ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙව්පියාණන් වහන්සේ කෙරේ දක්වන ප්‍රේමයට පෙළඹවීමකින් තොරව හා නිදහස්ව දක්වනු ලබන ප්‍රතිචාරයක් වෙයි. සත්‍ය වශයෙන්ම, සැම නිශ්චිත වූ කැඳවීමක්ම දෙවියන් වහන්සේගේ මූලිකත්වයෙන් උපදී; එය දේව ප්‍රේමයේ තිළිණයක් වෙයි. එහි මුල් පියවර ගනු ලබන්නේ දෙවියන් වහන්සේ විසිනි. ඒ අප තුළ වන යම් යහපතක් නිසා නොව "අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයෙන් අපේ සිත් පුරවන නිසා" වෙන් (රෝම 5:5). අප තුළ උන්වහන්සේගේම ප්‍රේමය පවතින බැවිනි.

සැම යුගයකදීම, ක්‍රිස්තුන් වහන්සේ තුළ තමන් වහන්සේව පූර්ණ ලෙස හෙළිදරව් කරන දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයේ මුලපිරීම මත මෙම දේව කැඳවීමේ පදනම පවතිනු දැකිය හැකිය. මම මාගේ පළමු විශ්ව ප්‍රකාශනය වන "දේඋස් කරිටාස් එස්ට්" - දෙවියන් වහන්සේ ප්‍රේමය වන සේක" - හි දැක්වූ ආකාරයට "දෙවියන් වහන්සේ විවිධාකාර ලෙස අපට දර්ශනය වන සේක. බයිබලය තුළ, ආවර්ජනය කෙරෙන ප්‍රේම වෘත්තාන්තය තුළ උන්වහන්සේ අප කරා පැමිණෙන අතරම ඒ පටන් අන්තිම රාත්‍රි භෝජනය දක්වාත්, කුරුසිය මත සිය ලය සිදුරු කිරීමට ලක්වනු දක්වාත්, උත්ථානයෙන් ඉක්බිති උන්වහන්සේ දර්ශනය වීම් හා, අපෝස්තුළුවරුන් මඟින් ක්‍රියාවට නංවන ලද සිය පුදුම එළවන සුළු මහා ක්‍රියාකාරකම් දක්වාත්, කුඩා අංකුරයක්ව වැඩීගෙන එන ශු. සභාව එම මාර්ගයේ ගෙනයාම දක්වාත් උන්වහන්සේ අපගේ හදවත් දිනා ගැනීමට උත්සුක වන සේක. ඉන් පසුවටත් සභා ඉතිහාසය තුළ ස්වාමින් වහන්සේ කිසිවිටෙකත් අවිද්‍යාමානව නොසිටින සේක. උන්වහන්සේගේ වැඩසිටීම පිළිබිඹු කරන ස්ත්‍රී, පුරුෂයන් තුළ, උන්වහන්සේගේ වචනය තුළ, සක්‍රමේන්තු තුළ, සහ විශේෂාකාරයෙන් දිව්‍ය සත්ප්‍රසාදය තුළ, නිරන්තරයෙන් නැවුම් බවකින් යුතුව උන්වහන්සේ අප හමුවට වඩින සේක." (Deus Caritas Est, No 17.)

දෙවියන් වහන්සේගේ ප්‍රේමය සදාතනිකය. උන්වහන්සේ "පරම්පරා දහසක් දක්වා අණකළ සිය ගිවිසුම" (ගීතාවලිය 105:8) ට ද තමන් වහන්සේ ටම ද විශ්වාසවන්ත වන සේක. එනමුදු අපට ප්‍රථමයෙන්වූත් අප කැටුව යන්නාවූත් දේව ප්‍රේමයේ ආකර්ශනීය ස්වභාවය පිළිබඳව, විශේෂකොටම අපගේ බාල පරම්පරාවනට සදා නැවුම් බවකින් යුතුව ද ගාම්භීරව ද ප්‍රකාශ කළ යුතු වෙමු. අති දුෂ්කර තත්ත්වයන් යටතේ වුවද නොවැරදීම අවිද්‍යාමානව අප පොළඹවනුයේ හා අප උත්තේජනය කරනුයේ මෙම දේව ප්‍රේමයම වෙයි.

දයාබර සහෝදර සහෝදරියෙනි, මෙම ප්‍රේමයට අපි අපගේ ජීවිත විවෘත කළ යුතු වන්නෙමු. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අප දිනපතා කැඳවනු ලබන්නේ මෙම පියාණන් වහන්සේගේ ප්‍රේමයේ පරිපූර්ණත්වයට ය. ක්‍රිස්තියානි ජීවිතය පූර්ණ විශ්වාසවන්ත හා ඵලදායී ස්වයං ප්‍රදානයක් තුළ ප්‍රකාශ කෙරෙන ප්‍රේමයක් මඟින් දෙවියන් වහන්සේ ප්‍රේම කරන්නාක් මෙන් ප්‍රේම කිරීමට කැඳවනු ලබන උසස් ප්‍රමිතියකින් යුක්ත වෙයි. කුරුසියේ ශා. ජුවාම් මුනිඳුන්, සිය වගකීම් වලින් බැහැර කිරීම පිළිබඳව ඉමහත් වේදනාවට පත්ව සිටි සෙගෝවියාවේ ආරාමයේ ශ්‍රේෂ්ඨාධිපතිනිය පිළිවදන් දෙමින්, දෙවියන් වහන්සේ ක්‍රියා කරන ආකාරයට ක්‍රියාකරන ලෙස ඇයට ඔවදන් දෙයි. "වෙන කිසිවක් ගැන නොසිතන්න. සියල්ලනට පූජකවරය ප්‍රදානය කරනුයේ දෙවියන් වහන්සේ විසින්ම බව සිතට ගන්න. තවද ප්‍රේමය නැති තැන ප්‍රේමය ඇතිකරන්න; එවිට එතැනින් ඔබට ප්‍රේමය උකහාගත හැකිවනු ඇත." (letters, 26).

සියළු කැඳවීම් ජනිතවනුයේත් වර්ධනය වනුයේත් මෙම ස්වයං ප්‍රදානය හා දේව ප්‍රේමයට දක්වන විවෘතභාවය නම් වූ සරුබිමෙහි වන අතරම එය එම ප්‍රේමයේම ඵලය ද වෙයි. යාච්ඤාව, දේව වචනය නිරන්තරයෙන් පරිශීලනය කිරීම, නිතර සක්‍රමේන්තු ලබා ගැනීම, විශේෂකොට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම යන ක්‍රියාකාරකම් තුළින් මෙම දේව ප්‍රේමයේ උල්පතින් ලබා ගන්නාවූ පන්නරය හරහා අපගේ අසල්වැසියා උදෙසා ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීමට අපට හැකිවනු ඇත. එවිට ඔවුන් තුළ ස්වාමින් වන ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී මුහුණ අපට දැකග

කලා සංග්‍රහය

# විමුක්තියේ ජේසු පෙරියමුල්ලේදී වේදිකාගත වේ

මේ පාස්කු අවස්ථාව තුළින් අපට ආදරයකරන, අපට අවශ්‍යදේ ලබාදෙන අපට පාපය නිසා අත්වූ මරණයේ බලවේගයන්ගෙන් මුදවාගන්ඩ, උන්වහන්සේගේ එකම පුත්‍රයාණන් මෙලොවට යාගයක් වන්නට ඉඩ සැලසූ ඒ උතුම් දෙවියන් වහන්සේව හඳුනාගන්ඩ ලැබෙනවා.

මීගමුව පෙරියමුල්ල තුෂාරයේ අප ස්වාමිදුගේ දෙව්මැඳුරු භූමියේදී විමුක්තියේ ජේසු නම් වූ පාස්කු නාට්‍ය වේදිකා ගත කළ අවස්ථාවේ කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ එසේ පැවසූහ.

උන්වහන්සේ මෙසේද පැවසූහ. පාස්කුව කියලා කියන එකේ අර්ථය එතෙරවීමයි. එදා ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තු දේශයේ වහල්කමින් මිදී රතුමුහුදින් එතෙරවීම ඒ තුළ දෙවියන් වහන්සේ හඳුනා ගැනීම, දෙවියන් වහන්සේගේ ජනතාව බවට පත්වීම, පාස්කු කතාන්තරයේ ආරම්භයයි. ජීවිතය තුළ පාපයත් මරණයේ බලවේගයත් ආත්මාර්ථකාමීත්වයත් සමඟ අප හැම කෙනෙක්ම පොර බදනවා. ඒ අරගලය තුළ ස්වාමින් වහන්සේ අපට පෙන්වා දෙන්නේ උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වුනොත් උන්වහන්සේ ගමන් කළ මාර්ගයේ අප ගමන් කළොත් එනම් කුරුසය වැළඳගෙන තමන් පරිත්‍යාගවී උන්වහන්සේ පසු පස්සේ ගියොත් ඒ අත් දැකීම අපටත් අත්දකින්ඩ පුළුවන් බවයි.

'විමුක්තියේ ජේසු' නාට්‍යය රිචඩ් මානමුදලි මහතාගේ අධ්‍යක්ෂණයෙන් වේදිකා ගත විය. මීසම් වැසියන් 200 දෙනකුගේ රංගන දායකත්වයක් එයට ලැබී තිබුණි.

මේ අවස්ථාවට කොළඹ පදවියේ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා, අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ද සහභාගි වූ අතර උතුරු කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා දිසානායක අතිගරු ජූලියස් ක්‍රිස්ටෝපර් පියතුමෝද එක්වූහ.

පෙරියමුල්ල මීසම් සේවක ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා මෙය සංවිධානය කර තිබුණි. නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතාද නාගරික මන්ත්‍රී නන්ද සුලෝචන මහතාද අවට මීසම්වල පියතුමන් පැවදි



සොහොයුරියන් විශාල පිරිසක්ද මේ අවස්ථාවට පැමිණ සිටීයහ. අති විශාල ජනතාවක් නාට්‍ය නැරඹූහ.

**රේමන් අපෝන්සු**



තඹකන්දේ මහ සිකුරාදා තුන්පැය ධ්‍යාන මෙහෙය තුළ කිතු සමිඳාණන්ගේ දුක් ප්‍රාප්තිය කරළියට ගෙන එමින් නාට්‍යානුසාරයෙන් රඟ දැක්වූ අයුරු මෙහි දැක්වේ. මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාගේ මඟපෙන්වීම පරිදි මීසම්වාසීහු මෙහි රඟපෑහ. - **සිසිල් ඩැනීසියස්**

# පුවත්පත් ලේඛන කලාවට අත්වැලක්



යහපත් එඬේරා පැවිදි නිකායේ ජනසංනිවේදන කමිටුව විසින් පුවත්පත් ලේඛන කලාව පිළිඳව වැඩමුළුවක් කොළඹ 13, කොටහේන යහපත් එඬේරා කන්‍යාරාමයේදී පසුගිය දිනෙක පවත්වන ලදි. පුවත්පත් ලේඛන කලාවට ආශාවක් දක්වන, ලැදියාවක් ඇති යහපත් එඬේරා තාපස නිකායේ දෙටු - කනිටු පැවිදි සොහොයුරියන් රැසක් මේ වැඩමුළුවට සහභාගී වූහ.
ඉතා අර්ථවත්ව සහ යාවත්කාලීන මාතෘකා යටතේ මෙම වැඩමුළුව 'අද' සහ 'තරුණයා' ප්‍රධාන කර්තෘ කාංචන දසනායක 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පතේ ශිරාන් මෛත්‍රී සහ කුමර නයනජිත් මහත්වරුන් විසින් මෙහෙයවන ලදී. දමිළ අංශයේ වැඩමුළුව ලෙනින් මදිවානම් මහතා සහ පැට්‍රිෂියා ආරෝක්‍යනාදන් මහත්මිය පුවත්පත් ලේඛක - ලේඛිකාවන් විසින් මෙහෙය වන ලදි.

**ගරු මාරි පැට්‍රිෂියා පැවිදි සොහොයුරිය**

# සත්‍ය සොයා කන්ද උඩරට වේදිකා ගතවේ

මහනුවර පදවි මාධ්‍ය කේන්ද්‍රයේ සාර්ථක දෙවන වරට සංවිධානය කරනු ලැබූ 2012 මාධ්‍ය කණ්ඩායම විසින් රඟ දක්වන ලද 'සත්‍ය සොයා' මහා පාස්කු සංදර්ශනය පසු ගිය දා මහනුවර යහපත් එඬේරාගේ කන්‍යාරාම ප්‍රධාන ශාලාවේ පැවැත්විණි. මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙනි. මිල්ටන් කන්නන්ගර මහතා අධ්‍යක්ෂණය කළ මෙහි සහය අධ්‍යක්ෂණය සහ නර්තනාධ්‍යක්ෂණය තරන ලද්දේ 2011 මාධ්‍ය කණ්ඩායමේ ටානියා ශිෂ්‍යාව විසිනි.

මහනුවර පදවි මාධ්‍ය කේන්ද්‍රයේ අධ්‍යක්ෂ ගරු සුදත් රෝහණ පියතුමාගේ අනුශාසකත්වයෙන් සහ මෙහෙයවීමෙන් 2012 මාධ්‍ය කණ්ඩායම මෙය දෙවන වරටත් පවත්වන ලදි. 2012 මාධ්‍ය කණ්ඩායමේ චමිල ක්‍රිස්ටෝපර් ශිෂ්‍යයා ජේසුස් වහන්සේගේ චරිතයට පණපොවන ලද අතර පිළිවෙළින් දේව මෑණියන්, පිලාත්, ජුදාස් චරිත වලට නටාෂා අරුන්දිනි, ප්‍රිස්කිලා පෙරේරා, ෂේන්



යන සිසුන් විසින් පණපොවන ලදි. එදින 2012 මාධ්‍ය පාඨමාලාව අවසන් කර 2012 මාධ්‍ය කණ්ඩායම විසිර යාමද සිදුවිය.

මෙම පාඨමාලාවට ඡායාරූපකරණය, වීඩියෝකරණය ගුවන් විදුලි තාක්ෂණය, නාට්‍ය හා රංග කලාව වැනි විෂයන් අයත් ය. එමෙන්ම ජන සන්නිවේදනය විෂය දේශන සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ කථිකාචාර්ය ආචාර්ය අතුල සමරකෝන් මහතාගේ බුද්ධිමය දායකත්වය සැපයිණි. මෙහි තවත් විෂයක් වූ පුවත්පත් කලාව විෂය ඉගැන්වීමට බුද්ධිමය දායකත්වය සැපයුවේ ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ සහය සංස්කාරක ශිරාන් මෛත්‍රී මහතා වන අතර මෙම කණ්ඩායමෙන් ප්‍රදීපය සඳහා ලේඛක ලේඛිකාවන් කීපදෙනෙකු එක්ව සිටීම ද, විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

**අනුරාධ ෂෙහාන්**



# කුරුසාලෝකය ආරම්භය

කුරුණෑගල රදගුරු හිමිපාණන් පොල්තෙල් පහන දල්වා කුරුසාලෝකය පාස්කු දැක්ම ආරම්භ කළ අන්දම. මෙම පාස්කු දැක්මට මෙරට ප්‍රවීනතම රංගන ශිල්පීන් රැසක් සහභාගී වූහ.

**සිසිල් ඩැනීසියස්**

ෆිලීෂන් අබයකෝන්ගේ

# සුබස 198

## මනස්තාපය

වර්තමාන ශුද්ධ බයිබල පරිවර්තනයේ පෙනෙන මනස්ස්ථාපනය භාෂාවේ කොහිවත් නැත්තකි. සංස්කෘත වචන දෙකක් එකතුකර ප්‍රබන්ධවූ මේ වචනය නැති අවුලක් ඇති කරයි. හල් අකුරු දෙකක් ළඟ ළඟ තිබීමත් ඉන් එකක් ශබ්ද නොවීමත් සත්ත්ව, තත්ත්ව ආදියේ හල් අකුරු දෙක දුරවබෝධ අය තවත් විපරීත කරයි.

ඒක හල් 'ස්' යන්නක් ගිලිහී දැන් මනස්ථාපනය වී ඇති මේ වචනය විශාල බැනරවල පවා දක්නට ලැබේ. මනස්+ථාපනය ලෙස වෙන් කළ විට ස්ථාපනයේ අර්ථයක් නැත. මන+ස්ථාපනය ලෙස කැඩූවිට ස්ථාපනය නම් පිහිටවීමයි. පළමු මහ බ්‍රහස්පතින්දා ස්ථාපනය වු INSTITUTE දිව්‍ය සත්ප්‍රසාද සක්‍රමේන්තුව වශයෙන් මිස ස්ථාපනය සත්ප්‍රසාද වහන්සේ වැඩමවීම සඳහා භාවිත නොවිය යුතුය. මනෝවිද්‍යා, මනෝහර, මනෝරම්‍ය, මනස්කාන්ත, මනස්තාප, මනඃකල්පිත ලෙස මිස සංස්කෘතෙහි 'මන' කියා ව්‍යවහාර නොවේ. මනදොළ, මනහර, මනරම්, මනකල් සැටියට වැහැරෙන්නේ ශුද්ධ සිංහලෙහිය.

ශුද්ධ බයිබල ගැටපද විවරණය අනුව මෙටනොයියා ග්‍රීක වචනය වලංගු සිංහල පරිවර්තනයට පමණද? හීබෲ හා ඇරමයික් වචන කුමක් කියයිද? POENITENTIA ලතින් වචනයත් එය ආශ්‍රිත ඉතාලි ආදි භාෂාවල වචනත් ගැන පරිවර්තකයා නිහඬය. මනස්තාප හා පශ්චාත්තාප සිංහල දමිළ කිතුනු වහරේය. සන්තාප නම් නොපෙනේ. CONTRITION හා REPENTANCE ඉංග්‍රීසි වචනවලට බලපෑමක් නැද්ද? ශුද්ධ බයිබල සිංහල පාඨකයාට සිද්ධවුණේ අසාධාරණයකි.

මැලවීම, උණුසුම්වීම, දැවීම තාපයෙන් දැනේ. විද්‍යා පොත් පුරා තාපය දිස්වේ. තපස කෙලෙස් තැවීමයි. තාපසයා කෙලෙස් තවන්නාය. තාපයත් මහාතාපයත් අටමහනරකයෙන් දෙකකි.

පරිවර්තකයාට තිබුණේ මනස්තාපය එසේ තිබියදී අමුතු වචනයක් නොතනා උපග්‍රන්ථයෙහිදී ග්‍රීක වචනය පහදා දීමටය. මනස්තාපයේ ගැඹුරු අදහසත් බරපතළ ගුණයත් කිතුනුවා නොදන්නවා නොවේ. දයාධික මනස්තාප යැදුම්වලින් පැහැදිලිය. විශේෂකොට සර්වදයා යහපත්කම් ඇත්තා වූ ඔබට අනදර කළ හෙයින්ද සියලු දේට වඩා ඒවාට වෛරකරමි.

ඔබේ දුක් වෙහෙසය දැක අපේ පාපවලට මනස්තාප වී කන්නලවු කියන සැටියට ඒ දයාබර දිව්‍ය වත මණ්ඩලය අපට පෙන්වා වදාරනවා සොඳේ. (දුක් ප්‍රාප්ති ප්‍රසංගය)



පිටිපන ඓතිහාසික පාස්කු දර්ශනය මීසම් සේවක ගරු සිස්වන් ද ක්‍රෑස් පියතුමාගේ මෙහෙයවීම යටතේ මීසමේ බැතිමතුන් විසින් වේදිකාගත කරනු ලැබීය. 257 වැනි වරට පැවති එය රඟදැක්වූ අයඃ ක්‍රිස්තුස් වහන්සේ - කුසුම්සිරි, මරියතුමී - සුකුමාලි, වෙරෝනිකා - ශ්‍රියන්තිකා, පිලාත් - ප්‍රේමරත්න, ජුදාස් - ඇන්ටනි පෝල්, යක්ෂයා - තිළිණ, ආදම් - අජිත්, ඒව - දිලිනි, ජුවාම් - මයුර, කයිපාස් - රූපස්, අධ්‍යක්ෂණය - ස්ටීවන් ලියනගේ (එස්. කේ. ජේ. කුරේ)

160




ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තූ.නි සොයුරු

වඳින්න ගිය දේවාලේ ඉහේ කඩන් — වැටිලා
හැමදාටම පිදුංවියට සිංහාසන — හදලා
නොදැන කතරගම ගිහිල්ල අතරමඟට — වැටිලා
ලොකු වාහන යන්නට දැන් මහ පාරත් — හදලා

එලවන්නට එපා අනේ කොමිස් — කාක්කෝ
මළකුණු තව කන්න දෙමුද උනුයි — කාක්කෝ
ඕන ජරාවක් කනවා නියම — කාක්කෝ
මැරුණදාට මළකුණ උඹෙ පාරෙ — කාක්කෝ

ගායනය : කාක්ක(දූවේ) කස්තු(රි)



ඇන්ටන් ජයසූරිය හා කුමර නයනජිත්ගේ සම සංස්කරණයෙන් එළිදැක්වූ 'මරණයේ අඳුර බිඳ ජීවනයට එතෙරවීම' තේමා කරගත් නොමිලේ බෙදාහරින පාස්කු වාර්ෂිකය වන 'කිතු යාත්‍රා' සඟරාවේ හයවෙනි කලාපය පසුගියදා නිකුත් විය. එහි ප්‍රථම පිටපත රාගම තේවත්ත ශ්‍රී ලංකා අප ස්වාමිදුගේ ජාතික බැසිලිකා සිද්ධස්ථාන පාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමාට සම සංස්කාරක ඇන්ටන් ජයසූරිය පිරිනැමු අවස්ථාව.

**එච්. ඒ. කල්දේරා**



දියලගොඩ මීසමේ දහම් සේවා සභාව සංවිධානය කළ 'එතෙරවීම' ජේසුතුමන්ගේ දුක්ප්‍රාප්ති ප්‍රසංගය පසුගිය ගොබ් ඉරුදින දියලගොඩ දෙව්මැඳුරු භූමියේදී රඟ දක්වන ලදී. මීසමේ වැඩිහිටියන්, තරුණ තරුණියන් හා දරු දැරියන් 80 ක් පමණ මේ සඳහා රංගනයෙන් දායක වූහ. ප්‍රවීන නාට්‍ය ශිල්පී ජෝසප් ඒ ඩයස් මහතාගේ අධ්‍යක්ෂණයෙන් හා මීසම් සේවක තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ මූලිකත්වයෙන් මෙය ඉදිරිපත් කරන ලදි.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

විශේෂාංග

# ජාතික කුඩා කිතුනු සංඝ ඉරුදින

## 2012 අප්‍රියෙල් 22 දා

## උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ මූලික ඉගැන්වීම් තුළින් පරිණත ධර්මය කරා එතෙර වෙමු



ශ්‍රී ලාංකික කිතුනු ජනතාව නව මඟක් වෙත මෙහෙයවමින් සහභාගිශීලි සභාවක් කරා ගමන් කරවීම අරබයා, දේශීය රදගුරු සම්මේලනය විසින් වර්ෂ 1996 දී අනුමත කරමින් ආරම්භ කරන ලද, අසිපා කුඩා කිතුනු සංඝ ක්‍රියාවලිය, මේ වන විට වසර 16 ක් පුරා වහල් දේශයේ සිට පොරොන්දු දේශය වෙත නික්මයමින් තිබේ. එලෙස වසර 16 ක් පුරා ගමන් කරන නික්මයාමේ ගමන් මඟ තුළ ජාතික කුඩා කිතුනු සංඝ ඉරුදින වර්ෂ 2012 ක් වූ අප්‍රියෙල් මස 22 වෙනි දින දී නැතහොත් උත්ථාන සමයේ තුන්වන ඉරුදින වන අද දින, කුඩා කිතුනු සංඝ හා සම්බන්ධ සැදැහැවතුන් විසින් ගැඹුරු වූ ආධ්‍යාත්මික නවෝදයක් තුළ සනිටුහන් කරනු ලබයි. අද දින සියලුම කතෝලික රදගුරු වසම් පුරා සිටින මීසම්වාසී ගිහි, පැවදි, පූජක සැදැහැවතුන් විසින් උත්ථාන වූ ජේසු සමිඳුන් වෙත ඔවුනගේ ගෞරවාදර ස්තුතිය පුද කිරීම සඳහා දිව්‍ය පූජාවට මුල් තැන දෙනු ලබයි.

"යන්න, ජේසුස් වහන්සේ අනුගමනය කරමින් දේව රාජ්‍ය පතළ කරන්න. කුඩා කිතුනු සංඝ ගොඩනඟමින් එතුමන් හට සේවය කරන්න" යන්න ජාතික කුඩා කිතුනු සංඝ ඉරුදින තේමාව ලෙස මෙවර සූදානම් වී ඇත. එදා උත්ථාන වූ ජේසු සමිඳාණන් හඳුනා ගැනීමට වසර තුනක් පුරා ජේසුස් වහන්සේ සමඟ ජීවත් වූ ගෝලයින්ට අපහසු වූ ලෙසම, වර්තමානය තුළ ද බොහෝ සැදැහැවතුන් හට, අප අතර හා අප තුළ සෑම විටම ජීවමානව ජීවත්වන උත්ථාන වූ ජේසු සමිඳාණන් හඳුනා ගැනීමට අපහසු වෙමින් තිබෙන බව මා හට දැනෙන හැඟෙන කරුණකි. අප තුළ මෙන් ම අප අසල්වාසීන් තුළ ජීවමානව ජීවත් වෙමින් තවමත් තනිවී දුක් විඳින ජේසු සමිඳාණන් සැබෑ ලෙසම හඳුනාගන්නේ නැතිව, නොයෙක් ආකාරයේ හා මහා පරිමාණයේ ක්‍රියාකාරකම් සිදුකිරීම අතිශයින් නිෂ්ඵල බව උන්වහන්සේගේ ශුද්ධවූ වචනය මඟින් හා පසුව වෙනස් වූ උන්වහන්සේගේ ගෝලයින්ගේ ක්‍රියාකාරකම් තුළින් අප සැමට පැහැදිලි වේ.

එලෙස ක්‍රිස්තුන් වහන්සේ සැබෑ ලෙසින්ම හඳුනා නොගැනීම හා එතුමන් පිළිබඳ සැබෑ ලෙසින් නොදැනුවත් වීම නිසා අප මුල් තැන දී ඇත්තේ නිෂ්ඵල ක්‍රියාවන්ට බව පාවුලු තුමා හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනේ 6 වැනි පරිච්ඡේදයේ 1 සිට 3 වෙනි වගන්ති කියවා මෙනෙහි කරන විට පැහැදිලි වේ. එම නිසා එවැනි සියලුම නිෂ්ඵල ක්‍රියාවන්ගෙන් ඉවත් වෙමින් ක්‍රිස්තුන් වහන්සේගේ මූලික ඉගැන්වීම් තුළින් පරිණත ධර්මය අවබෝධ කරගනිමු. එවිට අප ශ්‍රී ලාංකේය කිතුනු සභාව සහභාගිශීලි සභාවක් ලෙස ගොඩනැඟෙමින් දේව රාජ්‍ය කරා එසැවෙනු ඇත. ඒ සඳහා අප මීසම් තුළ කුඩා කිතුනු සංඝ ගොඩනඟමින්, එමඟින් දේව වචනය තුළින් පෞද්ගලිකවම ජේසු සමිඳුන් සමඟ කතා බහ කරමින් දෙවියන් වහන්සේ හඳුනා ගැනීමට අපි ආශා වෙමු.

(අසිපා) කුඩා කිතුනු සංඝ අප රට තුළ පමණක් නොව ආසියාවට අයත් සෑම රටකම පාහේ කිතුනු සභාවන් තුළ ද ගොඩනැඟෙමින් පවත්නා කාර්යාවලියකි. දේව වචනය සමඟින් ක්‍රිස්තුන් වහන්සේ තුළ ගොඩනැඟෙන ගිහි නායකත්ව බිහිකිරීමත්, එවන් ගිහි නායකත්ව තේරුම් ගනිමින්, ඔවුන් සමඟ එකට හිඳිමින් හා ඔවුන්ගේ දායකත්වය සමඟින් ආසියාතික කිතුනු සභාවන් වඩා සහභාගිශීලි සභාවන් බවට පරිවර්තනය කිරීමේ කාර්යය ඉතා හොඳින් මෙහෙයවිය හැකි පැවදි, පූජක, නායක, සැදැහැවතුන් පිරිසක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ.

එවැනි උතුම් වූ අරමුණු සාක්ෂාත්කර ගැනීමෙහි ලා නිරත වෙමින් කටයුතු කරන ආසියානු ඒකාග්‍රතා දහම් පෝෂණ යොමුව තුළින් සැම රටකම සිදුවූ හා සිදුවන ක්‍රියාකාරකම් මඟින් අත්පත් කරගන්නා ප්‍රතිඵල පිළිබඳ ප්‍රගති සමාලෝචනයක් සහ ඒ තුළින් අනාගත කාර්යයන් ක්‍රමනාකාරයෙන් සිදුවිය යුතු දැ යි, සාකච්ඡා කොට තීරණය කිරීම සඳහා අන්තර්ජාතික සමුළුවක් සෑම වසර තුනක් පාසා ම, යම් සාමාජික රටක පවත්වනු ලබයි. එයට අනුව පසුගිය පස්වෙනි අසිපා අන්තර්ජාතික සමුළුව පවත්වනු ලැබුවේ 2009 වසරේ පිලිපීනයේ දී ය. එහි දී 2012 වසරේ පැවැත්වීමට නියමිත ඊළඟ සමුළුවාරය ශ්‍රී ලංකාවට ලබා දීමට තීරණය විය.

ඒ අනුව 6 වෙනි අසිපා අන්තර්ජාතික සමුළුව අප දිවයින තුළ පැවැත්වීමට තීරණය වීම, ලාංකේය කිතුනුවන් වන අප සැම මහත් අමන්දානන්දයට පත්කිරීමට හේතුවන පණිවුඩයක් වනු නොඅනුමාන ය. මේ වන විට එම සමුළුව මෙම වසරේ (2012) ඔක්තෝබර් මස 18 වෙනි දිනට සිට 24 වෙනි දින දක්වා හලාවත රදගුරු වසමේ නයිනමඩම මීසම් ප්‍රදේශයට අයත් "චින්තන" මධ්‍යස්ථානයේ දී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් වෙමින් පවතින බව කිව යුතු අතර, ඒ සඳහා සෑම අයුරකින්ම උපකාර කරන ගිහි, පැවදි, පූජක රදගුරුතුමන්ලා ඇතුලු සියලුම සැදැහැවතුන් හට මාගේ අවංක ස්තූතිය මෙසේ පිරිනමමි.

එමෙන් ම, මෙම සමුළුව ශ්‍රී ලාංකේය කිතුනුවන් වන අප හට සුවිශේෂී වූ අවස්ථාවක් බවට පත්කර ගත හැකි වන්නේ, ක්‍රමනාකාරයකින් හෝ එයට දායක වීම භාග්‍යකැයි කියා සිතීමෙන් ම නොව, දෙවි පියාණන් වහන්සේගේ පරිනත ධර්මයට අනුව පෞද්ගලිකව හා පොදුවේ ද, ලාංකේය කිතුනු සභාවක් ලෙස අප ඉන්නේ කොතැන ද? ගමන් කරන්නේ කොතැනට ද? කියා අවංකව ම මෙනෙහිකොට, පෞද්ගලිකවත්, පොදුවේ සභාවක් ලෙසත්, නිවැරදිවන හා නිවැරදි කරන තරමට ය. ජාතික සංඝයක් ලෙස අප, අපගෙන් ද ඒ පිළිබඳව විමසමින්, නිවැරදි වෙමින්, පදවි පුරා ගොඩනැගී ඇති කුඩා කිතුනු සංඝ දැනුවත් කරමින් හා ඔවුන් නිවැරදි කරමින් පසුගිය වසර කීපය පුරා ක්‍රිස්තුන් වහන්සේට අවශ්‍ය කාර්යයන්හි නිරත වූයෙමු.

6 වෙනි අසිපා අන්තර්ජාතික සමුළුව අවස්ථාවේ දී, එයට පැමිණෙන විදේශීක කිතුනු ගිහි, පැවදි, පූජක හා රදගුරුතුමන්, දේශීයව ගොඩනැගී ඇති කුඩා කිතුනු සංඝ බැහැදැකීම හා ඔවුන් සමඟ දිනක් ගත කිරීම ප්‍රධානම කාර්යයකි. ඒ අනුව පොදු පහසුව තකා සමුළුව පැවැත්වෙන ස්ථානයට සමීපව ඇති තෝරාගත් රදගුරු වසම් තුනක් වන හලාවත, කුරුණෑගල හා කොළඹ යන රදගුරු වසම් තුළ ඇති කුඩා කිතුනු සංඝ, එම බැහැදැකීම් සඳහා දැනුවත් කෙරෙමින් හා සූදානම් කෙරෙමින් පවතී.

මෙවන් භාරධූර කාර්යයක්, දෙවියන් වහන්සේට වඩා ප්‍රසන්න ලෙසත්, ඊට සහභාගිවන සැදැහැවතුන් සියල්ලන් තුළ මෙමඟින් ආධ්‍යාත්මික ප්‍රගමනයක් ඇතිවන පිණිසත්, ඉතා සාර්ථකව ඉටුකර ගැනීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලගතු ආනුභාවය සියල්ලන් වෙත නොමඳව ලැබේවායි මා ප්‍රාර්ථනා කරන අතර, සහෝදර ගිහි, පැවදි, පූජක සැදැහැවතුන්ගේ ද, ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ ද, යැදුම් හා උපදේශයන් මෙන්ම සියලු ආකාර උපකාරයන් ද මා ඉතාමත් ඕනෑකමින් බලාපොරොත්තු වෙමි. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ දර්ශනය ඔබ සැමට සැබෑ ලෙසින්ම අවබෝධ වේවා ආලේලූයා! ආලේලූයා! ස්තූතියි

උත්ථානවූ කිතු තුමන් තුළ

**ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමා**
කුඩා කිතුනු සංඝ ජාතික අධ්‍යක්ෂ




## කුඩා කිතුනු සංඝ ක්‍රියාවලිය

**මීසම් (කේන්ද්‍රිය) කණ්ඩායම් (මීසම් සේවක පියතුමා සමඟ**

↓

**පදවි කණ්ඩායම** — **සම්බන්ධිකාරක පියතුමා සමඟ**

**(මීසම් කණ්ඩායම් නියෝජනය වන සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විතය)**

- ★ **මීසම් (කේන්ද්‍රිය) කණ්ඩායම සම්බන්ධිකාරකවරු පෝෂණය කිරීම**
- ★ **මීසම් අතර සබඳතා ජාලයක් ගොඩනැගීම**
- ★ **මීසම් සහ සම්පත් (පුහුණු කිරීම්, පොත්පත්, පුහුණු කරන්නන්) සබඳතාවක් ගොඩනැගීම.**
- ★ **මීසම් නායකත්වය සඳහා අඛණ්ඩ පුහුණුවට මුල් තැන දීම**
- ★ **විවිධ පුහුණු සපයා දීම**

↓

**ජාතික කණ්ඩායම**
**(පදවි සම්බන්ධිකාරක පියතුමන් සහ ගිහි පැවදි නියෝජිතයන්)**

**විමසීම් -**
**කුඩා කිතුනු සංඝ**
**ජාතික කාර්යාංශය**
**"ලංකාරාමය", බැල්කම්**
**පෙදෙස**
**කොළඹ 08**

### "කුඩා කිතුනු සංඝ තුළින් සභාවේ ඇතුළාන්තයේ මෙන්ම බාහිර ස්වරූපයේ ද නිශ්චිත වෙනසක් ඇති කළ හැකිය"



සෑම පදවියකම සෑම මීසමකම කුඩා කිතුනු සංඝ ගොඩනැගීමේ අවශ්‍යතාව සහ එම ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙම ඉරුදින විශේෂයෙන් කැප කර ඇත. ශ්‍රී ලංකා කතෝලික සභාව යාවත් කිරීමේ සහ සභා නවෝදයක් කරා මෙහෙයවීමේ කාර්යක්ෂම මෙවලමක් සහ ඵලෙඩරික නැඹුරුවක් ලෙස පිළිගෙන කතෝලික රදගුරු මණ්ඩලය විසින් මෙය 1996 සිට ජාතික ප්‍රමුඛතාවක් ලෙස ද නිල වශයෙන් ප්‍රකාශ කරන ලදි.

ආසියාතික රදගුරු සංසදය මෙම කුඩා කිතුනු සංඝ ප්‍රවර්ධනය මූලික ප්‍රමුඛතාවක් ලෙස සලකමින් ආසියාතික ඒකාග්‍ර නැඹුරුවෙන් (අසිපා) සමන්විත වූ මෙම ක්‍රියාවලියට ඉතා ප්‍රබල ලෙස සහයෝගය දක්වමින් අදටත් මෙම දැක්ම සහ දූත මෙහෙවර ප්‍රචලිත කිරීම සඳහා අඛණ්ඩව දායකත්වය සපයයි. අපගේ සුදතුම් පියා වූ දෙවන ජුවාම් පාවුළු පියාණෝ "ගැලවුම්කරුවාණන්ගේ දූත මෙහෙවර" 51 පරිච්ඡේදයේ "බොහෝමයක් රටවල මෙම කුඩා කිතුනු සංඝ එදිනෙදා දහම් දැනුම වර්ධනය කිරීමේ සහ දේශානුරූපීව ඇදහිල්ල පෝෂණය කිරීමේ කුඩා මධ්‍යස්ථාන බවට පත්ව ඇත. ඒවා ධර්මදාන ක්‍රියාවලියේ නියෝජිතයන් ලෙස ද කිතුනු බලාපොරොත්තුව අසල්වැසියන් සමඟ බෙදාහදා ගෙන ජීවත්වීමේ දූත මෙහෙවරේ වගකීම ගැනීමේ කුඩා සංඝ ලෙස ද ක්‍රියා කරයි."

කුඩා කිතුනු සංඝ තුළින් සභාවේ ඇතුළාන්තයේ මෙන්ම බාහිර ස්වරූපයේ ද නිශ්චිත වෙනසක් ඇති කළ හැකිය. එය සහභාගිශීලි දූත සේවාවට නැඹුරුවූ සභාවක් බවට පරිවර්තනය වේ. එය බෙදා හදා ගැනීමේ සේවයට ප්‍රමුඛතාව දීමේ සක්‍රිය සභාවක් බවට පත්වේ. එම නිසා මෙම නැඹුරුවට සභාවක් වීමේ නව මඟ යැයි ද ආසියාතික රදගුරු සංසදය ප්‍රකාශ කළේය.

අප මෙදින විශේෂයෙන් අපගේ සියලුම මීසම් එඬේරුන්ගෙන් ද, සියලු ජනතාවගෙන් ද උදක්ම ඉල්ලා සිටින්නේ අපගේ දේශීය සභාව නවතාවයකට පත් කිරීම සඳහා කුඩා කිතුනු සංඝ ගොඩනැගීම, ගොඩනගා ඇති සංඝ නඩත්තු කිරීමේ සහ ශක්තිමත් කිරීමේ දූත කාර්යයට උපරිමයෙන් දායකත්වය ලබාදෙන ලෙසයි. මේ සඳහාම ඇප කැපවූ ජාතික පුහුණු කණ්ඩායමක් අපට ඇත. විවිධ පදවි වල අවශ්‍යතාවන් සහ ඉල්ලීම අනුව පුහුණු කිරීම් සහ දැනුවත් කිරීම් කිරීමට නිතරම සූදානම්ව සිටි එම ජාතික කණ්ඩායම සියලුම මීසම් සේවක පියවරුන්ගේ සහ රදගුරුවරුන්ගේ සේවය සඳහාමැයි.

අද දින ශුභාරංචිය අපගේ මෙම කුඩා කිතුනු සංඝ දූත සේවාවට ඉතා කදිමට ගැළපේ. මන්ද උත්ථාන වූ කිතු සමිඳුන් අපෝස්තුළුවරු අතරෙහි හිඳිමින් එතුමන්ගේ ජීවිතයේ සහ දූත මෙහෙවරේ අභිරහස්මක පැතිකඩයන් පැහැදිලි කරදෙයි. සෑම කුඩා කිතුනු සංඝ එකතුවකදීම මෙම එම්මාවුස් අත්දැකීම් හරහා කිතු සමිඳුන්ගේ අභිරහස්මක මෙන්ම ජීවමාන වැඩසිටීම සිහි කැඳවයි.

ත්‍රි මලේ /මඩකලපුව රදගුරු
**අති උතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ හිමි**
සම සභාපති ජාතික ගිහි කොමිසම
සභාපති ජාතික කුඩා කිතුනු සංඝ කාර්යාංශය

## මීසම් කේන්ද්‍රිය කණ්ඩායම (නායකත්වය)

**"මීසම් භාර පියතුමා සමඟ එකතුවන 6 - 12 කට ආසන්න පුද්ගලයන්ගෙන් සමන්විත කණ්ඩායමකි"**

- ★ **ඔවුන් ගේ එකමුතුව තුළ ඔවුන්ම සංඝයක් බවට පරිවර්තනය වේ.**
- ★ **මීසම සංඝයන්ගෙන් සැදි සංඝයක් ලෙස සංවර්ධන කිරීම සඳහා අවශ්‍ය පෝෂණය සපයා දෙයි.**
- ★ **මෙම සංඝයන් ගේ අඛණ්ඩ පෝෂණය සහ තිරසර වර්ධනය සහතික කරයි.**
- ★ **දේව වචනය බෙදා ගැනීම සඳහා මෙහෙයවන්නා පුහුණු කරයි.**



# "සභා මාතාව තුළ ආදරය වෙමි මම"

## මහා මෙරක් වූ කුඩා මල සහ මහා මෙහෙවර - 5

ශාන්ත තෙරීස් තුමිය ආදරය ගැන තම අත්දැකීම මෙසේ විග්‍රහ කොට ඇත; "මේ අවුරුද්දේ මා ලබාගත් වරප්‍රසාද රාශිය අතරින් ඉතාම අනගිඑකනම් පරහට දයා කිරීමේ පනත හොඳාකාරව තේරුම් ගැනීමේ වරප්‍රසාදය විය. මෙම වරප්‍රසාදය ලැබෙන තුරු "දෙවෙනි පනත, පළමු වන පනතට සමානය, එනම් ඔබට මෙන් ඔබගේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න" යන්න හොඳාකාර තේරුම් නොගෙන සිටියෙමි.

සියල්ලට වැඩියෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීමට බොහෝ උත්සාහ දරා උන්නෙමි. මෙසේ ප්‍රේම කිරීමෙන්, "ස්වාමිනි, ස්වාමිනි යි මට කියන සැම දෙනාම නොව ස්වර්ග රාජ්‍යයෙහි වැඩසිටින මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉෂ්ට කරන අය මෝක්ෂ රාජ්‍යයට ප්‍රවිෂ්ට වන්නේය" යි යන වචනවල අර්ථයද සොයා ගතිමි.

ඒ කැමැත්ත කුමක්දැයි ජේසු තුමා විසින් උගන්වාදී තිබේ. උන්වහන්සේ අන්තිම රාත්‍රි භෝජනය වෙලාවෙහි තමන් වහන්සේගේ අපෝස්තුළුවරුන්ට කතා කරමින්, "මා විසින් ඔබලාට ප්‍රේම කළාක් මෙන් ඔබලා විසිනුත් එකිනෙකාට ප්‍රේම කරන ලෙස අලුත් පනතක් දෙමි" යි වදාළ සේක. ඉඳින් ජේසු තුමා අපෝස්තුළුවරුන්ට ප්‍රේම කළේ කෙසේදැයි දැන ගැනීම සඳහා සොයා බලන්නට පටන් ගතිමි. එකල උන්වහන්සේ ඔවුන්ට ප්‍රේම කළේ ඔවුන්ගේ ස්වභාවික ගුණාංගයන් නිසා නොවන බව මම දැන ගත්තෙමි. ඔවුහු එදවස්වල උගතුන් නොවූහ. ඔවුහු ලෞකික ආශාවලින් පිරී සිටියෝය.

මෙය නොබලා උන්වහන්සේ ඔවුන්ට තමන්වහන්සේගේ මිත්‍රයෝය, සහෝදරයෝ යයි නම් කර කතා කළ සේක. මෙපවත් හැර, ඔවුන් තමන් වහන්සේගේ රාජ්‍යයෙදී තමන් වහන්සේ ළඟ සිටිනාවට කැමති වූ සේක. මේ රාජ්‍යය ඔවුන්ට අයිති වෙන පිණිස ඔවුන් වෙත ප්‍රේමයෙන් කුරුසිය පිට මරණයට පවා කැමැත්තෙන් යටත් වූ සේක. "තමාගේ මිත්‍රයන් උදෙසා සිය දිවි පුදනවාට වඩා මහත් ප්‍රේමයක් යමෙකුට නැත්තේය" යි කියමින් මේ ප්‍රේමයේ මහත්කම ප්‍රකාශ කළ සේක.

මේ දේව වාක්‍යයන් ගැන මෙනෙහි කරන කල කන්‍යා සහෝදරියන් වෙත, මට තිබෙන ප්‍රේමය කෙතරම් අසම්පූර්ණ එකක් දැයි දැන ගතිමි. ජේසුතුමා ප්‍රේම කරන තරම, මවිසින් ඔවුන්ට ප්‍රේමකර නැති බව මට හොඳාකාර අවබෝධ විය. සැබෑ දයාව ඇති කෙනෙක් තම අසල්වැසියාගේ වැරදි ඉවසීමෙන් උසුලාගන්නේය. ඔවුන්ගේ දුර්වලකම්, වැරදි යනාදිය දැක ඔවුන් පහත්කොට සිතනවා වෙනුවට ඔවුන්ට ඇති ගුණාංගයන් උතුම් කොට සලකන්නේය. ඔවුන්ගේ යහපත් සුළු ගුණාංග පවා අනුකරණය කරන්ට වීර්යය කරන්නේය.

තවද "යමෙක් පහනක් දල්වා ගෙට ඇතුල් වෙන සැම දෙනාටම එළිය ලැබෙන ලෙස පහන් කඳක් පිට මිස කුරුණියක් යට නොතබයි" යන අප ස්වාමිදරුවන්ගේ වචනවලින්, මේ ප්‍රේමය සැඟවී නොතිබී ක්‍රියාවලින් ප්‍රකාශ විය යුතු බව තේරුම් ගතිමි. මේ දයාව නැමති පහන මට ප්‍රේම කරන



අයවලුන්ට පමණක් නොව ගෙට ඇතුල් වී සිටින සියල්ලන්ට එළිය සහ ප්‍රීතිය ගෙන දෙන එකක් විය යුත්තේය.

මගේ ජේසුනි, කළ නොහැකි දෙයක් කිරීමට ඔබවහන්සේ අණ නොකරන සේක. ඔබවහන්සේ මට වඩා හොඳට මගේ දුර්වලකම්ද, අඩුලුහුඩුකම්ද දන්නා සේක. ඔබවහන්සේ මා තුළ වාසය කරමින්, කන්‍යාරාමයෙහි සහෝදරියන්ට, මාගේ ශක්ති පමණින්, මා ලවා ඔබවහන්සේම ප්‍රේම නොකරවන සේක් නම් කළ යුතු පමණට ප්‍රේම කිරීමට මම අපොහොසත් බව දනිමි. ඉඳින් ඔබවහන්සේ "අලුත් පනතක්" දී තිබෙන හෙයින් ඒ පනත් රක්ෂා කිරීමට උවමනා ප්‍රසාද ඔබවහන්සේ මට දෙවා වදාරන සේක."

අපගේ ජීවිතයේ ගැඹුරුතම කනගාටුව, පසුතැවිල්ල සහ කලකිරීම නම්, ජීවිතයේ සැබෑ කැඳවීම වන ආදරය කිරීම සම්බන්ධයෙන් ඇති තරම් අවධානය යොමු නොකර තිබීමයි. දෙවියන් වහන්සේගේ ස්වරූපයට සහ සමානකමට මවා ඇති අප ජීවිතයේ අවසාන කාලයේදී වැඩියෙන්ම ශෝකයට පත්වන්නේ මේ කාරණය සම්බන්ධයෙන්ය. නමුත් මෙම ගැඹුරුතම පසුතැවිල්ල ජීවිතයේ වෙනත් අරගල සහ ප්‍රශ්න නිසා වැළලී සැඟවී පවතී. නමුත් එය අපගේ හැසිරීම් රටාව මඟින්, මානව සබඳතා මඟින් මතුවීමට පටන් ගනී.

ශාන්ත තෙරීස් තුමිය අප බොහෝ දෙනෙක් මෙන්ම ගත කරන ලද්දේ සාමාන්‍ය, නිහඬ, සැඟවුණු දිවියකි. දිනපතාම එතුමියට මුණ ගැසුණේ එකම පුද්ගලයන් කොටසය. ඊයේ දවස තුළ හමුවූ කන්‍යා සොහොයුරියන් අද දවස තුළදීත් එතුමියට මුණ ගැසුණි. එමෙන්ම දිනපතාම එතුමිය මුහුණ දුන්නේ එකම ආකාරයේ සිද්ධීන්ට සහ තත්ත්වයන්ටය. නමුත් එතුමියගේ ජීවිතය ඒකාකාරී නොවුණි, විඩාපත් නොවුණි, නීරස නොවුණි. ඊට හේතුව එතුමිය මිනිස් ජීවිතයේ ප්‍රබෝධමත්ම, වික්‍රමාන්විතම චාරිකාවට දෛනිකව ඉතා උවමනාවෙන් අවදිව සිටි නිසයි.

ආදරයේ තේරුම් ගත නොහැකි ගැඹුරු පැති කඩයන්ට ඇතුළු වීමට එතුමියට හැකිවිය. අප ආදරය කිරීම උදෙසා ගනු ලබන සෑම තීරණයක්ම කාලය සහ සදාකාලය හමුවන ස්ථානයකි. මිනිස් මනසට පහසුවෙන් තේරුම් ගත නොහැකි මාංශගතවීමේ අභිරහස සිදුවන්නේ එවිටය. සාමාන්‍ය දෛනික ජීවිතයේ හදවතට අපට පියවරෙන් පියවරට ගමන් කළ හැක්කේ ආදරය නමැති නෞකාව මඟින්ය. එය අප විසින් ගන්නා දෛනික ජීවිතයේ තීරණ මඟින් සම්පූර්ණ කරන චාරිකාවකි.

එතුමියගේ කුඩා මාර්ගයේ (Little way) නිම නොවෙන, ක්ෂය නොවෙන ගැඹුරද එයයි. එනම් ඉතා උද්‍යෝගිමත්ව, ප්‍රබෝධමත්ව, අර්ථාන්විතව අපගේ දිනපතා සාමාන්‍ය ජීවිතය ගත කිරීමයි. දෙවියන් වහන්සේ අපෙන් මහා පරිමාණයේ වික්‍රමාන්විත ක්‍රියාවන් බලාපොරොත්තු නොවන සේක.

ආදරය සම්බන්ධයෙන් අප විසින් අපවම රවටා ගැනීම ලොව ඇති දරුණුතම මුළා කර ගැනීමයි. එය සදාකාලික හානියකි, පරාජයකි, පාඩුවකි. මෙලොවදීත් එලොවදීත් ඒ සඳහා වන්දි ගෙවා නිම කළ නොහැකිය. අපට අන්‍යයන්ට ආදරය කිරීමට ලැබී ඇති අවස්ථාවන් මඟ හැරීම ජීවිතයේ නැවත සකස් කර ගත නොහැකි පරාජයකි. ශාන්ත තෙරීස් තුමිය එවැනි කිසිම අවස්ථාවක් මඟ හැරියේ නැත. එතුමියට එතුමියව රවටා ගැනීමට කිසිම උවමනාවක් තිබුණේ නැත. එතුමියට බාගෙට, කාලට ශාන්තුවරියක් වීමට උවමනාවක් තිබුණේ නැත. එතුමියට උවමනා කළේ සම්පූර්ණයෙන්ම, සෑම මොහොතකම, සෑම ස්ථානයකම, සෑම පුද්ගලයෙක් අභියසම, සෑම තත්ත්වයක් තුළින්ම, සෑම අත්දැකීමක් හරහාම ශාන්තුවරියක් වීමටයි. එතුමිය දැන හැඳින ගත්, හමුවූ, එතුමිය සමඟ ජීවත් වූ සෑම පුද්ගලයෙකුටම එතුමිය ආශිර්වාදයක් වූවාය.

එවැනි අත්දැකීම් ගැන එතුමිය තවදුරටත් මෙසේද ලියා ඇත; "මා විසින් ප්‍රේම කරනු ලබනවාට ඔබවහන්සේ කැමති අයවලුන් හට, මා ලවා ඔබවහන්සේ එලෙස කරවන සේකැයි මට සහතිකය. මා විසින් යම් කිසි පරහට දයාවේ ක්‍රියාවක් කරන්ට යෙදුනොත් එය ජේසුතුමා, මා තුළ වාසය කරමින්, මා ලවා එසේ කරවන බව මම විශ්වාස කරමි. ඉඳින් මා, ජේසු තුමා හා සම්බන්ධ වන තරමට කන්‍යා සහෝදරියන්ට, මම වඩ වඩා ප්‍රේම කරමි.

මම මගේ හෘදයෙහි මේ ප්‍රේමය වර්ධනය කරගන්ට කැමති හෙයින්, යක්ෂයා යම් කන්‍යා සහෝදරියකගේ අඩු ලුහුඬුකම් මට පෙන්වන කල ඇගේ ධර්ම ගුණ සහ යහපත් ගුණාංග සොයා ගන්නට මම උත්සාහ කරමි.

වරක් ඈ වැරදි කරනවා මම දුටිමි. නමුත් ඈ, මට නොපෙනී කොපමණ විටක් යහපත් ක්‍රියා කරන්ට ඇද්දැ'යි මම කල්පනා කරමි. මේ ඇර මට වරදක් මෙන් පෙනෙන දෙයක් ඈ යහපත් අදහසකින් කළා නම් එය දෙවියන් වහන්සේට අප්‍රසන්න දෙයක් නොවන්නේය. මෙසේ ඈ හොඳ අදහසකින් කරන්ට ඇති බව සිතීම, මට අපහසු නොවෙයි. මෙය මා විසින් අත්දැක තිබෙන දෙයකි."



මහාචාර්ය ඇන්ටන් මීමන

# 19 දර්ශනය යනු කුමක්ද ?

## ප්‍රඥාව, සත්‍යය සහ බුද්ධිමය නිහතමානීත්වය

තේල්ස්, ඇනැක්සිමැන්ඩර්, ඇනැක්සිමිනිස්, හෙරක්ලීටස්, සේනෝ, පෛතගෝරස්, සෙනෝෆේන්, එම්පිඩොකල්ස්, පාර්මිනිඩීස්, සොක්‍රටීස්, ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් යනාදීන් විසින් ඉතා කැපවීමෙන් පදනමක් දමන ලද දාර්ශනික සම්ප්‍රදායේ ඵල අපි තවමත් භුක්ති විඳිමු. එම දාර්ශනික උරුමය 'බටහිර' යයි කියා හංවඩු ගසා ඉවතට දැමිය නොහැකිය, එය අවතක්සේරුවට ලක් කළ නොහැකිය. ඒ සමඟ අප නිරන්තර, අඛණ්ඩ සංවාදයක නියැළිය යුතුවේ. එය සමස්ත මානව උරුමයේ කොටසකි. ලාංකිකයන්ද නොබියව, නොපැකිලව එම උරුමයෙන් අඛණ්ඩව පෝෂණය ලැබිය යුතුවේ.

මිනිස් සංහතියේ සහ සභ්‍යත්වයේ උත්තරීත්වය උදෙසා අපි පුරාණ ග්‍රීකයන්ට සදාකාලිකවම ණය ගැති විය යුතු වෙමු, ගරු කළ යුතු වෙමු. මුල් කතෝලික සභාවේ පියවරුන්ද ග්‍රීක දාර්ශනික සංකල්ප උපයෝගි කොටගත්තේ, තමන්ගේ ක්‍රිස්තුවේදී අදහස් ප්‍රකාශ කිරීම සහ ප්‍රචලිත කිරීම සඳහාය. එහිදී සිදුවූයේ කිතුනු දේවධාර්මික සත්‍යයන් බුද්ධි ගෝචරව ගොඩනැගීම සඳහා ග්‍රීක දර්ශනය භාවිත කිරීමයි. එසේ නොමැතිව, සමහර පුද්ගලයන් සිතන ආකාරයට, ක්‍රිස්තුස් වහන්සේගේ පණිවුඩය ග්‍රීක දර්ශනයට යටපත් කිරීමක් එහිදී සිදු වූයේ නැත.

වරක් මාර්ටින් ලූතර් මෙසේ ප්‍රකාශ කරන ලදී; "It is impossible to reform the church, unless one uproots radically the canons the decretals, scholastic theology, philosophy, logic, as they are taught tlday." මෙම අදහස සහ සමහර මූලධර්මවාදීන්ගේ චෝදනාවක් වන කතෝලික සභාව විසින් කිතුනු ඇදහිල්ල ග්‍රීක දර්ශනයට යට කිරීම ඓතිහාසිකව නිවැරදි චෝදනාවක් නොවේ.

ශාන්ත අගුස්තීනු තුමා, ඇන්සල්ම් තුමා, ජෝන් ඩන්ස් ස්කෝටස් තුමා, බොනවෙන්චර් තුමා, තෝමස් ඇක්වයිනස් තුමා යනාදීන් විසින් කරන ලද්දේ ග්‍රීක දර්ශනයේ ආධාරය සහ ආභාෂය ඇතිව සුබාරංචියේ ගැඹුරු සත්‍යයන් නැවත ඉදිරිපත් කිරීමයි.

කිතු සමිඳාණන් තම පණිවුඩය සාමාන්‍ය ජනතාවට ඉදිරිපත් කරන ලද්දේ උපමා රූපක, උපහැරණ, කතන්දර යනාදිය භාවිත කිරීමෙනුයි. එය සාමාන්‍ය දැනීම භාවිත කොට, සාමාන්‍ය ජනතාවට තේරෙන එදිනෙදා ව්‍යවහාර වන භාෂාවෙන් ඉදිරිපත් කරන ලද පණිවුඩයකි. නමුත් එම පණිවුඩයේ දාර්ශනික පදනමක් නැතිවාම නොවේ. එමෙන්ම ක්‍රිස්තුන් වහන්සේගේ පණිවුඩය දාර්ශනික විරෝධීද නොවේ.

නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ පණිවුඩය වඩා ක්‍රමාණුකූලව, බුද්ධිමය ලෙස, තර්කාණුකූලව, විශ්ලේෂණාත්මක සහ සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදාය පටන් ගන්නා ලද්දේ ශුද්ධවූ පාවුලු තුමන් විසිනි. එතුමන් විසින් ලියන ලද "රෝමවරුන් වෙත යැවූ හසුන", "කොරින්තිවරුන් වෙත යැවූ හසුන්" "ගලාතිවරුන් වෙත යැවූ හසුන" යනාදිය අවධානයෙන් කියවීමේදී ඒ බව පැහැදිලි වේ. එතුමා විසින් ප්‍රචලිත කරන ලද්දේ විශ්ලේෂණාත්මක චින්තනයයි (Analytical Thinking). එතුමා විසින් දේව ධර්ම ශාස්ත්‍රය, විශේෂයෙන් ක්‍රිස්තුවේදය (christology) ස්වාධීන විනයක් ලෙස වැඩිදියුණු කරන ලදී.

රෝමවරුන්ට ලියන ලද ලිපියේ 7 වන පරිච්ඡේදය, කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනේ 13 වන පරිච්ඡේදය, ගලාතිවරුන්ට ලියන ලද ලිපියේ 5 වන පරිච්ඡේදය යනාදිය එතුමාගේ විශ්ලේෂණාත්මක බුද්ධියේ අග්‍ර ඵලයන්ය. දාර්ශනික බුද්ධියක් වර්ධනය කර ගන්නේ නොමැතිව හොඳ දේව ධර්ම ශාස්ත්‍රඥයෙක් විය නොහැකිය. ශුද්ධ වූ පාවුලු තුමන් විසින් ආරම්භ කරන ලද එම බුද්ධිමය ක්‍රියාවලියේ අනෙකුත් පතාක යෝධයන් දෙදෙනා නම් ශාන්ත අගුස්තීනු තුමා සහ ශාන්ත තෝමස් ඇක්වයිනස් තුමන්ය.

සමකාලීනව මෙම බුද්ධිමය සම්ප්‍රදාය පෝෂණය කරන ලද අය අතර කාල් රානර්, (Karl Rahner), ඩේවිඩ් ට්‍රේසි (David Tracy), මැතිව් ලැම්බ් (Matthew Lamb), රොබට් ඩෝරන් (Robert Doran) ෆෙඩ්රික් ලෝරන්ස් (Frederick Lawrence), බර්නඩ් ලොනර්ගන් (Bernard Lonergan), ෆැන්සිස් ෂුස්ලර් ෆියෝරෙන්සා (Francis Schussler Fiorenza), ෂැක් මරෙතාන් (Jacques Maritain), හාන්ස් ඌර්ස් ෆොන් බල්තසාර් (Hans Urs Von Balthasar), ජෝසප් මරෙෂාල් (Joseph Marechal), හෙන්රි ඩි ලුබාක් (Henri de Lubac), යර්ගන් මෝල්ට්මන් (Jurgen Moltmann), වුල්ෆ්හාට් පැනන්බර්ග් (Wolfhart Panenberg) පෝල් ටිලික් (Paul Tillich), ලැඩිස්ලාස් බොරොස් (Ladislas Boros), යොහාන්ස් බැප්ටිස්ට් මෙට්ස් (Johannes Baptist Metz), සොරෙන් කියකගා (Soren Kierkegaard), බ්‍රෙන්ඩන් ලොවට් (Brendan Lovett) යනාදීන් ඉතා කැපී පෙනෙන දාර්ශනික දේව ධර්ම ශාස්ත්‍රඥයන්ය (Philosophical Theologians).

සැබෑ දාර්ශනිකයන් දේව ධාර්මික ප්‍රශ්න වලින් පළා නොයයි. සෑම දාර්ශනිකයෙක්ම අවසානයේදී මුහුණ දෙන උත්තරීතම ප්‍රශ්නය නම් දෙවියන් වහන්සේ පිළිබඳ ප්‍රශ්නයයි. බොහෝ දාර්ශනිකයන් ගැඹුරින් තේරුම් ගෙන නොමැති කරුණක් නම් සෑම දාර්ශනීක ප්‍රශ්නයකටම දේව ධාර්මීක පසුබිමක් පවතින බවයි. අප විසින් අසනු ලබන සෑම ප්‍රශ්නයක්ම අවසාන විග්‍රහයේදී දෙවියන් වහන්සේ පිළිබඳව අසනු ලබන ප්‍රශ්නයකි. ලොව ඇති උත්තරීතම, අසමසම කුතුහලය දෙවියන් වහන්සේව දැන ගැනීමට ඇති කුතුහලයයි. ජීවිතයේ අනෙක් සෑම දෙයකම පදනම රඳා පවතින්නේ අප මේ ප්‍රශ්නයට දෙන පිළිතුර මතයි.

ඉදිරි කලාපයට... »

# මුන්දලමේ කලපුව හා ධීවරයන් ආසිරි ගැන්වේ



*මංගලඑළිය මීසමේ මුන්දලම මහා සන්තියාගු දෙව් මැඳුරේ (කල්වාරි පුදබිම) පාස්කු ඉරුදින දිව්‍ය පූජාවෙන් පසු මුන්දලම කලපුව සහ එම කලපුවේ ධීවර රැකියාවන්හි නියුතු ධීවරයන්ගේ ධීවර යාත්‍රා ආසිරි ගැන්වීම මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමන් විසින් සිදු කරන ලදී. මීට වසර 50,60 පෙර මෙම කලපුව ආසිරි ගැන්වීම සිදු කර තිබූ අතර ගරු පියතුමාගේ අදහසක් අනුව උත්ථාන වූ කිතු සමිඳුන්ගේ මංගල්‍ය දින නැවතත් කලපුව, ධීවර යාත්‍රා සහ ධීවරයින් ආසිරි ගැන්වීම සිදු කරන ලදී.*

උත්ථාන වූ කිතු සමිඳුන්ගේ සහ මහා සන්තියාගු මුනිඳුන්ගේ ප්‍රතිමාව රැගෙන ධීවර යාත්‍රා පෙරහරකින් කලපුව වටා දැඩි අව්රශ්මියට මුහුණ දෙමින් ධීවර ජනතාව සමග පැය දෙකක් පමණ ගමන් කරමින් පියතුමා කළ මෙහෙය බොහෝ දෙනෙකුගේ පැසසුමට ලක් විය.

මේ අවස්ථාවට කතෝලිකයන් පමණක් නොව ධීවර රැකියාවේ නියුතු ප්‍රදේශයේ සියලුම ආගමිකයෝ සහභාගි වූහ. ගරු මාලක ප්‍රනාන්දු (පැ.තු.නි.) පියතුමාද මීට සහභාගි විය.

**(එච්.ඒ. සිරිල් පෙරේරා)**

## මොල්ලිගොඩ සන්ධ්‍යා මෙහෙය 21 දා

වාද්දුව මීසමට අයත් මොල්ලිගොඩ සා. පැට්‍රික් දෙව්මැඳුරේ 122 වන වාර්ෂික මංගල්‍යයේ සන්ධ්‍යා මෙහෙය 2012 අප්‍රේල් 21 සෙනසුරාදා ප.ව. 7.00 ට කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න.

චන්ද්‍රකීර්ති... 1 පිටුවෙන්

සමීපව කටයුතු කළ කීර්ති සොයුරා කා සමඟත් අමනාපකම් ඇති කර නොගත්තා වුවද, අයුක්තියේ දී ඊට එරෙහි කථා කිරීමට කිසිදා පසුබට නොවීය. "හදකින් හදකට", "පවුරු පදනම්", "ධවල හස්ත", "එතෙර වෙමු" (පාස්කු නාට්‍යය) ලියා අධ්‍යක්ෂණය කර නිෂ්පාදනය කලේ, චන්ද්‍ර කීර්ති කුලරත්නයන් විසිනි.

මොහුගේ දේහයට ගෞරව දැක්වීම සඳහා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්, රාගම වල්පොල පිහිටි නිවසට අප්‍රි. 15 දින පැමිණි අතර, අවසන් කටයුතු අප්‍රි. 16 දා තේවත්ත සුසාන භූමියේ දී සිදුකෙරිණි.

චන්ද්‍ර කීර්ති කුලරත්න සොයුරාගේ ආත්මයට නිත්‍ය සුව සන්තර්පණය ලැබේවා!යි "ඥානාර්ථ ප්‍රදීපය" සිය පාඨක සහෘදයන් සමඟ ප්‍රාර්ථනා කරයි.

# හතලිස් දින ධර්ම විවේකය සාර්ථකව නිම කරයි



*කඳාන සා. සෙබස්තියන් මාවත ජනතාව විසින් එකමුතුව සංවිධානය කළ චතාරික ධර්ම විවේකය සඳහා කොළඹ, හලාවත පදවි වල පියතුමන්ලා සහභාගි වූහ. සර්ව රාත්‍රික මෙහෙයකින් එම ධර්ම විවේකය අවසන් කරන ලදී. අවසන් දින සර්ව රාත්‍රික මෙහෙය සඳහා නාත්තන්ඩිය මීසම් සේවක ගරු පීටර් උපාලි චර්චිල් පියතුමා හා තිබ්බොටුගොඩ මීසම් සේවක ගරු රංජිත් ටෙරි පියතුමන් විසින් විශේෂ සුව මෙහෙයක් සිදු කරන ලදී. දුක්ප්‍රාප්තිය නාට්‍යක්නුසාරයෙන් ඉදිරිපත් කරමින් සිද්ධස්ථාන පරිපාලක ගරු නිහාල් අයිවන් පියතුමන් විසින් පාද නමස්කාරය සිදු කරන ලදී.*

ජේසුස් වහන්සේ දුක් ප්‍රාප්ති මෙහෙය නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය අජිත් සිල්වා ගුරු පියාණන්ගෙන් වූ අතර ජේසුස් වහන්සේගේ චරිතයට පණ පොවන ලද්දේ මංජු රාජපක්ෂ විසිනි. රනිල් සුරංග ස්නාවක ජුවාම් චරිතයද, මරිය තුමිය ලෙස සීතා කොටිල්ඩාද පෙනී සිටියාය.

මෙම නාට්‍යයේ හඬ කැවීම් ශිල්පීන් ලෙස අජිත් සිල්වා, ලෝරන්ස් ස්ටැන්ලි, ජෙරාඩ් මංත්‍රීගේ, ඔස්ටින් සමරසිංහ, පියල් ජයකොටි, ඇග්නස් අල්විස් කටයුතු කළ අතර සර්ව රාත්‍රික මෙහෙය නිහාල් අයිවන් පියතුමාගේ සුරතින් පිදුන දිව්‍ය පූජාවෙන් අවසන් විය. මෙම ධර්ම විවේකය ගරු නිහාල් අයිවන් පියතුමාගේ උපදෙස් මත පියල් ජයකොඩි, අජිත් සුජීව, ඇන්ටනි ඩමස්කන් යන අය ප්‍රදේශවාසීන්ගේ සහයෝගයෙන් සංවිධානය කළ අතර මෙම කාර්යය මීසම් වාසීන්ගේ ඉමහත් ප්‍රශංසාවට ලක් විය.

**(දිනේන්ද්‍ර දිව්‍යාංජලි)**



*ශුද්ධවූ සතිය අරඹමින් ගොබ් ඉරුදින දිව්‍ය යාගය පිදීමට පෙර ගොබ් ආසිරි ගන්වා කිතු සමිඳාණන් ජයෝත්සවයෙන් ජෙරුසලෙම් දෙව්මැඳුරට ඇතුළු වූ අන්දම සිහිපත් කරමින් හල්පෙ මීසම් සහයක ගරු ප්‍රසාද් ඉන්දික පියතුමා සරසන ලද ගොබ් අත්ත අතැතිව පෙරහරට එක්වූ අයුරු.* **(සිසිල් ඩැනීසියස්)**

# කලඑළිය ගම වටා පාදනමස්කාරයක්

*කලඑළිය මීසම් සේවක ගරු බැසිල් නික්ලස් පියතුමාගේ සහ ගරු රීඩ් ෂෙල්ටන් පියතුමාගේ අනුදැනුම ඇතිව, දේවස්ථාන කිතුනු දූත සේවා සභාවන් මගින් සංවිධානය කළ චතාරික පාදනමස්කාරයට ගමේ සැදැහැවතුන් සියල්ලෝම පාහේ සහභාගි වූහ.*

දේව වචනය දේව ජනතාවට වඩාත් ලංකර, චතාරිකය පිළිබඳව වඩාත් ගැඹුරින් මෙනෙහි කිරීමේ කටයුතු ඉතා අර්ථාන්විතව පැහැදිලි කළේ ගරු සුසිලා පැවදි සොහොයුරියයි. **(මිලිනා කොස්තා)**

## වරාගොඩ චතාරික ධර්ම විවේකය

*"දේව වචනය තුළින් විශ්වාසයේ නවෝදයක් කරා" තේමාව යටතේ වරාගොඩ මරිය හමුදාව මගින් දෙවන වරට සංවිධානය කරනු ලැබූ චතාරික ධර්ම විවේකය පසුගියදා කැළණිය, වරාගොඩ ශාන්ත පාවුළු දේවස්ථානයේදී පවත්වන ලදී.*

ගරු ඇන්ටන් ජයනන්ද, ගරු ඉන්ද්‍රා රත්නසිරි, ගරු ජූඩ් බර්නාඩ් සහ ගරු නුවන් බුද්ධික පියතුමන්ගේ සහභාගිත්වයෙන් සැදැහැවතුන් විශාල පිරිසක් සහභාගි වූහ. මීසම් සේවක ගරු ගිහාන් රිඩ්ලි පෙරේරා සහ සහයක ගරු ප්‍රියනාත් අසන්ත පියතුමන්ගේ මග පෙන්වීම යටතේ සාර්ථක ලෙස සංවිධානය කරනු ලැබීය. **(ක්ලැරන්ස් ලෙනාඩ්)**

## කුරුස යාගය බෝලවත්තේ

*හලාවත පදවි තරුණ කටයුතු උපාධ්‍ය ගරු බෙනට් රත්නසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් හා බෝලවත්ත මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් ප්‍රනාන්දු හා සහයක ගරු සුජාන් නිශ්ශංක යන පියතුමන්ලාගේ සහභාගීත්වයෙන් කුරුස යාගය පශ්චාත්තාපික මෙහෙය පසුගියදා බෝලවත්ත දේවස්ථානය ඉදිරිපිට පවත්වන ලදී.*

*බෝලවත්තේකතෝලික තරුණ සංගමය සංවිධානය කරන ලද මෙම පශ්චාත්තාපික මෙහෙයේදී ගීතමය වැඩසටහනක්, ජේසුන් ක්‍රිස්තුන් වහන්සේගේ දුඛප්‍රාප්තිය අනුසාරයෙන් රූප රාමු සහිතව ජනතාව දර්ශනය කරමින් ජනතාව භාවනාත්මකව සූදානම් කරන ලදී.*

*(කේ. නිහාල් ප්‍රනාන්දු)*









ගම්පහ දිස්ත්‍රික්කයේ, රෝමානු කතෝලික, වරායේ බහලුම් නිලධාරී වශයෙන් රැකියාව කරන, උස 5' 9", උසට සරිලන මහත, කඩවසම්, 27 හැවිරිදි පුතුට අධ්‍යාපන කටයුතු නිමකර ඇති රැකියාවක් නොකරන, ගේ දොර වැඩ මැහුම් ගෙතුම් දන්නා ආගම දහමට ලැදි, අවු. 25 අඩු ගුණ යහපත්, රූමත් දියණියක සාමාන්‍ය පවුලකින් දෙමව්පිය දෙදෙනා බලාපොරොත්තු වේ. අංක N0062, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.





හලාවතට නුදුරු, කතෝලික, අවු. 25, උස 5' 3", සිහින් සිරුරැති, HND (ඉංග්‍රීසි) ඩිප්ලෝමාධාරී දියණියට මිලියන 25 කට වඩා වටිනාකමින් යුත් ව්‍යාපාරයකට සුදුසු ඉඩමක් සහ අලුත් මෝටර් රථයක් ඇතුළු වෙනත් දේපල සතුය. දු.අ. 071-8196742. අංක N0048, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

ජා-ඇලට නුදුරු, රෝ.ක., උස 5' 6", අවු. 24, පෞද්ගලික අංශයේ ස්ථිර රැකියාවක්, නව නිවසක් හිමි දියණිය සඳහා ස්ථිර රැකියාවක් ඇති පුතකු වැඩිහිටියෝ සොයති. සියළු විස්තර දු.අංකය සමග දන්වන්න. අංක N0051, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

ජා-ඇලට නුදුරු, රෝ. කතෝලික, අවු. 28, අ.පො.ස. සාමාන්‍ය පෙළ උගත්, රැකියාවක් කරන, පර්චස් 100 ක ඉඩම සහ නිවසක් හිමි බාල දියණියට ස්ථිර රැකියාවක් ඇති, සුරා සූදුවෙන් තොර දේපලක් ඇති සාමානය පවුලක පුතකු දෙමව්පියෝ සොයති. අංක N0064, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

පන්නිපිටියේ පදිංචි, රෝ. කතෝලික, වයස 24, උස 5' 2", දැනට කටාර් රාජ්‍යයේ කලමණාකාරිණියක ලෙස රැකියාවක් කරන, (නිවාඩුවක් සඳහා මැයි මස පැමිණේ) පැහැපත් දියණියට ස්ථිර රැකියාවක් කරන, ගුණ යහපත් පුතකු දෙමව්පියන් සොයයි. දු.අ. 071-6399561. අංක N0066, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

කඳාන, රෝ. කතෝලික, 1971 උපන්, පෞද්ගලික ආයතනයක රැකියාව කරන දියණියට සුදුසු සහකරුවකු ගම්පහ දිස්ත්‍රික්කයෙන් මව සොයයි. නැවතීමට හැකිය. දු.අ. 2238740. අංක N0067, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

කොළඹට නුදුරු, සිංහල, රෝමානු කතෝලික, අවු. 23, උස 5' 1", සිහින් සිරුරැති, චරිතවත්, නිවසක් හිමි, ජාත්‍යන්තර පාසලක ගුරුවරියක වන දියණියට සුදුසු සහකරුවකු දෙමව්පියෝ සොයති. රාත්‍රී 7 න් පසු අමතන්න. දු.අ. 011-2733021. අංක N0069, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

ගිහි අපෝස්තලික සේවාවද... 3 පිටුවෙන්

පූජකතුමන් අත්දකිනු ඇත. මෙවැනි අවස්ථාවන්හිදි එම මීසමේ ක්‍රියාත්මක වන ගිහි අපෝස්තලික සේවාවන්. පූජකතුමන්ගේ සහයට කැඳවිය හැකිය. සමහර මීසම්වල ගිහි අපෝස්තලික සේවාවන් වැඩි සංඛ්‍යාවක් දැකිය හැකි වුවද ඇතැම් මීසම්වල එවැනි තත්ත්වයක් දැකිය නොහැකිවනු ඇත. මීසම් ධර්ම සේවා සභාවේ සිට ළමා ධර්මදූත සමාජය දක්වාවූ සමිති සමාගම් ගිහි අපෝස්තලික සේවාවට අයත් වෙති. කුමන ගිහි අපෝස්තලික සේවාවක් වුවද, එහි කේන්ද්‍රස්ථානය විය යුත්තේ ක්‍රිස්තුන් වහන්සේයි. අප කුමන කටයුත්තක නියැලුනද, කුමන සේවාවක නිරත වුවද ඒ සැමදේ කළයුත්තේ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙනි. දේව රාජ්‍යය සඳහා ඒ වෙනුවෙනි. දේව වචනය තුළ ජීවත්වෙමිනි. මීසම තුළ ක්‍රියාත්මක වන ගිහි අපෝස්තලික සේවාවන්, සැදැහැවතුන්ගේ අධ්‍යාත්මික කටයුතු වර්ධනය සඳහා ක්‍රියාත්මක වන්නාසේම, තම පෞද්ගලික ජීවිතය යහපත් කරගැන්මටද, දෙවිඳුන් වෙත තම ජීවිතය සමීප කරගැන්මටද වූ අවස්ථාවක් කරගත යුතුය.

කිතුනු ජීවිතය උපතේ සිට මරණය දක්වා ගතකරනුයේද, ගතකළ යුත්තේද දෙවිඳුන් සමඟය. එමෙන්ම කිතුනු ජීවිතයේ පැවැත්ම තිබිය යුත්තේද දේව වචනය තුළයි. ජීවිතය අයිතිවන්නේ ද දෙවිඳුන්ට බව අපි අමතක නොකළ යුතුවෙමු. මීසමේ ගිහි අපෝස්තලික සේවාවන් ක්‍රියාත්මක විය යුතු වන්නේ ද මෙම සංකල්පය මනසේ දරාගෙනය. තමන් සේවය කරන්නේ දෙවිඳුන්ට බව, මෙම සේවාවන්හි නියුතු අය සිහි තබාගත යුතුය. මිනිසුන්ගේ අඩුපාඩුකම්, අඩු ලුහුඩුකම්, දුබලකම්, වැටුනු තැන් සොයාබලා ඒවා නිවැරදි කරන්නට කටයුතු කිරීමද මෙම සේවාවන්වල නියුතු අයගේ වගකීමක් වනු ඇත. ඉවසීම, දරාගැන්ම, බැහැපත්බව, නිහතමානිවීම, ප්‍රඥාවන්තකම, සංවේදීවීම ආදි ගුණයන්ගෙන් සමන්විත වීමද ගිහි අපෝස්තලික සේවාවල නිරතවන්නන්ට අවශ්‍යය ධර්මතාවයන් වේ. ගිහි අපෝස්තලික සේවාවන් පැවතිය යුත්තේ මීසමේ ගරු පියතුමන් යටතේය. එහි අනුශාසකත්වය එතුමන් විසින් දැරිය යුතුය. එතුමන්ගේ අවවාද අනුශාසනා මෙම සේවාවන්හි ඉදිරි ගමන සඳහා මහෝපකාරි වනු ඇත. ගිහි අපෝස්තලික සේවාවන් මීසම තුළ, කිතුනු සංඝය තුළ එල හරිත විය යුතුය. එහි පැවැත්ම රඳා පවතින්නේද එවිටය. ගිහි අපෝස්තලික සේවාවන්හි නිරත අය හොඳ පෞරුෂත්වයකින්ද හෙබි අය විය යුතුය. ගිහි අපෝස්තලික සේවාව දේව කැඳවීමක් ලෙස අප පිළිගත යුතුවන්නේ අප සේවය කරන්නේ දෙවිඳුන්ට බවත්, අපගේ කැඳවීම දෙවිඳුන් විසින් කර ඇති බවත් පිළිගැනීම තුළය. මීසම තුළ පිහිටුවා ගැනෙන මෙම සේවාවන් වෙත පැවරී ඇත්තේ එකිනෙකට වෙනස්වූ සේවාවන්ය. කාර්යයන්ය. පාසල් දරුවන්, තරුණ තරුණියන්, වැඩිහිටියන් ආදි වශයෙන් මීසමක් තුළ එකට කටයුතු කිරීමට හැකිවන්නේද ගිහි අපෝස්තලික සේවාවන් තුළ අප එක්වූවොත් පමණි. මීසම පුංචි කිතුනු සංඝයකි. මෙම කිතුනු සංඝය තුළ අප එක්විය යුතුය. එකම පවුලක් ලෙස පිළිගත යුතුය. එකිනෙකාගේ අවශ්‍යතාවයන් තේරුම්ගත යුතුය. කිතුනු පවුලකින් එක් අයෙකුවත් මෙම ගිහි අපෝස්තලික සේවාවක සාමාජිකත්වයක් ලබාගන්නේ නම් එය කොතරම් භාග්‍යයක්ද? තමන් මෙන්ම තම පවුලද දෙවිඳුන්ට සමීපකරවීමකි. ඔහුගේ හෝ ඇයගේ කිතුනු පැවැත්ම, ආදර්ශය පවුලට, කිතුනු ඒකකයට, මීසමට ආලෝකයක් වනු ඇත. තම සහෝදර ජනතාවගේ අධ්‍යාත්මික කටයුතු පිළිබඳ සොයාලීමේ අයිතියක්ද මෙම සේවාවන්හි නිරත සාමාජිකයන්ට හිමිවේ. තමන්ගේ ගැලවීම මෙන්ම අන්‍යයන්ගේ ගැලවීම පිළිබඳවද කිතුනුවා සොයාබැලිය යුතුය. අපගේ ශාස්තෘවරයාණන්, ගුරුවරයාණන්ද මාර්ගෝපදේශකයාණන්ද වන ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතාදර්ශය අප ආදර්ශයට ගත යුතුවෙමු. ඔවුන්වහන්සේ අප වෙනුවෙන් කරනු ලැබූ වැයවීම කැපවීම අපද සහෝදර ජනයා වෙනුවෙන් කළයුතුවෙමු. එකිනෙකා කෙරෙහි සුහදත්වයෙන්, සහෝදරත්වයෙන්, සාමයෙන් යුතුව කටයුතු කිරීමට මෙම සේවාවන්හි නියුතු අය අදිටන් කරගත යුතුය. අප එකිනෙකා වෙනුවෙන් කරනු ලබන කැපවීම හා පූජාවීම තුළ ගිහි අපෝස්තලික සේවාව දේව කැඳවීමක් වනු ඇත. ඇතැම්විට එක් ගිහි අපෝස්තලික සේවාවක සාමාජිකත්වය දරන කෙනෙකු තවත් ගිහි අපෝස්තලික සේවාවන් කිහිපයකම සමාජිකත්වය දරමින් ක්‍රියාකාරිවනු දැකිය හැක. එය විශේෂ වරප්‍රසාදයකි.

එහෙත් මෙම ගිහි අපෝස්තලික සේවාවන් වෙත ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වන්නේ අතලොස්සකි. ඇතැම් ගිහි අපෝස්තලික සේවාවන් වැඩිහිටියන්ටම භාරවී ඇත. ඒවා වැඩිහිටියන්ගේ සමිති සමාගම්ය. එම සේවාවන්වල පැවැත්මද කණගාටුදායකය. තරුණ දායකත්වයක් නොලැබීම නිසා ඇතැම් සේවාවන් පවත්වාගෙන යැමද අසීරු කරුණක්වී ඇත. කිතුනුවන් බහුලව වෙසෙන ප්‍රදේශයන්හි මෙම සේවාවන් නිසියාකාරව, ක්‍රමවත්ව හා අධ්‍යාත්මිකත්වයෙන් පූර්ණව කරගෙන යැමට ඇතැම් ගිහි අපෝස්තලික සේවාවන්ට හැකිවීම සතුටට කරුණකි. මින් සැලසෙන සේවය මිල කළ නොහැක. එය අගය කළ යුතුය. අප අතර අගහිඟකමින්, දරිද්‍රතාවයෙන් පෙළෙන්නන්, පවුල් ප්‍රශ්න නිසා අසහනයට පත්වූවන්, උන්හිටිතැන් අහිමිවූවන්, සමාජ අසාධාරණයන්ට ලක්වූ අය, සමාජයෙන් කොන්කරනු ලැබූ අය හා නොසලකා හරිනු ලැබූ අය, අසනීප තත්ත්වයෙන් පෙලෙන්නන්, අධ්‍යාත්මිකත්වයෙන් පිරිහුන අය, අසහනයට පත් තරුණ කොටස් ආදී මේ හැම අංශයක්ම අද සමාජය තුළ අපට දැකගත හැක. මේ අයට වචනයකින් හෝ සහනයක් සැලසිය හැකි නම් එය කොතරම් යහපත් ක්‍රියාවක් වනු ඇද්ද? ඒ අය සඳහා දෙවිඳුන් වෙනුවෙන් ඉතා සුළු යමක් හෝ කළහැකි නම් කොතරම් අගනේද? ඔවුන් අප සොයා එන්නා සේම අපද ඔවුන් සොයා යා යුතු වෙමු. ගිහි අපෝස්තලික සේවාවන් සඳහා වත්මනේදී අප යොමුවන්නාසේම, අනාගතයේදීද මෙම සේවාවන් රැකගැන්මට බාල පරපුර යොමුකළ යුතු වෙමු. ඔවුන් ඒ සඳහා දිරිමත් කරමු. නිසි වැඩපිළිවෙළක් සකසමු. අඛණ්ඩව පවත්වාගැනීමට පියවර ගනිමු. ගිහියා මෙන්ම ගිහි අපෝස්තලික සේවාවද සභාවට අත්‍යවශ්‍යය. ක්‍රිස්තුන් වහන්සේ විසින් ශුද්ධවූ කතෝලික සභාව ස්ථාපිත කරන්නටත් පෙරවූ දේව විශ්වාසිකයන් අතර නැතිනම් දේව ජනතාව අතර ගිහි සේවාව පැවතියාක් මෙන්, අදත් හෙටත් ශුද්ධවූ සභාව පවතින තුරු ගිහි දායකත්වය, ගිහි සේවාවන් සභාවේ පැවැත්මට, වර්ධනයට යොමුවිය යුතුය. පැවතිය යුතුය. ජීව ගැන්විය යුතුය. මෙම ගිහි අපෝස්තලික සේවාවන් එකිනෙකට සම්බන්ධවෙමින් ලොව පුරා රටවල පැතිර තිබීමද සතුටට කරුණකි. ඒ හැම සේවාවක්ම සභාව තුළ සහෝදරත්වයෙන් බැඳී සිටීම අගය කළයුතුවෙමු. කිසියම් ආපදාවකදි, ව්‍යසනයකදී සහෝදරත්වයෙන් එක්වන්නේ එකම දහමක් තුළ, එකම සභාවක් තුළ, එකිනෙකාට සංවේදි වෙමින් දෙවිඳුන් තුළ එක්විය යුතු බැවිනි. දෙවිඳු හඬට සවන් දෙමින් දේව වචනය තුළ ජීවත්වෙමින්, දේව කාර්යයෙහි නියැලෙමින්, දේව හස්තයෙහි පහස ලබමින් ජනතා සේවය සඳහා යොමුවන්නට මෙම ගිහි අපෝස්තලික සේවාවන් පණගැන්විය යුතුය.